ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය

தேசிய நீரியல்வள முகாமை

# ATIONAL AQUATIC RESOURCES AGENCY

# 1988

NARA
06-12-1994
LIBRARY

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்கும்

# NUAL REPORT AND ACCOUNTS

# 1988 වාර්ෂික වාර්තාව.

## 1.0 මුහුදු ජීව විද්‍යාත්මක සම්පත් අංශය.

### 1.1 පරමාර්ථ :

1.1.1. ශ්‍රී ලංකාව වටා ඇති ජලයෙහි මුහුදු සම්පත් වලින් උපරිමව ලබාගත හැකි අස්වැන්නක් හා දැනට නෙලා ගන්නාවූ මට්ටම ඇස්තමේන්තුකර ගැනීම පිණිස දැනට ජීවී මුහුදු සම්පත් ප්‍රයෝජනයට ගන්නා ප්‍රමාණය තක්සේරු කිරීම

1.1.2. අඩුවෙන් ප්‍රයෝජනයට ගන්නා සම්පත් ප්‍රමාණය නෙලා ගැනීමේ මට්ටම වැඩි කිරීම පිළිබඳ හැකියාවන් ගවේෂණ කිරීම හා උපරිමව ලබාගත හැකි අස්වැන්න ප්‍රමාණය තක්සේරු කිරීම.

1.1.3. ලබාගත හැකිව ඇති වෙනත් ජීවී මුහුදු සම්පත් හා ඒවා බෙදා හැරීමේ සීමාවන් ද ඒවායේ සැබෑ භාවිතය පිළිබඳ සම්භාව්‍යය ගැන පරීක්ෂණයක් කිරීම.

### 1.2 සේවක මණ්ඩලය

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 07 |
| පර්යේෂණ සහකාරවරුන් | 06 |
| විද්‍යාගාර සේවකයින් | 02 |
| යතුරු ලේඛකයින් | 01 |
| දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරු | 01 |

සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ මෙම අංශය පර්යේෂණ නිලධාරීන් (7) හත් දෙනෙකු ද පර්යේෂණ සහකාරවරුන් (5) පස් දෙනෙකු ද විද්‍යාගාර සේවකයින් දෙදෙනෙකු ද / යතුරුලේඛකයෙකු ද ඇතුළු කාර්ය මණ්ඩලයකින් සමන්විතවිය. මෙහි සඳහන් අවසාන සේවිකාවගේ පත්වීම සැප්තැම්බර් මස දී ස්ථිර කරන ලදී. මෙම අංශයට අර්ධ කාලීන පදනමක් මත නාරා/අයිපීටීපී බද්ධ වූනා ආදර්ශ වැඩ සටහන අධීක්ෂණය කිරීම සඳහා පර්යේෂණ නිලධාරියෙකු අනුයුක්ත කරන ලදී. කොන්ත්‍රාත් පදනම මත දත්ත ඇතුලත් කිරීමේ ක්‍රියාකරුවෙකු හා පර්යේෂණ සහකාර වරයෙකු ද පත්කරනු ලැබීය.

### 1.3. කාර්ය වැඩසටහන හා ප්‍රගතිය.

1.3.1. නාරා ආයතනය විසින් අරමුදල් සැපයූ ව්‍යාපෘති.

#### 1.3.1.1. කුඩා සාමුද්‍ර ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය.

වයඹ දිසාවේ කල්පිටියේ සිට දකුණේ හම්බන්තොට දක්වා ප්‍රදේශය මේ සඳහා ආවරණය කරන ලදී. මෙම උප ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන ධීවර අංශ තුනක් එනම් කුඩා දැලැස් කරමලදැල් ධීවර කර්මාන්තයක්,

වෙරළාශ්‍රිත ධීවර කර්මාන්තයක් හා පසුබිම් දැල් ධීවර කර්මාන්තයක් ද අධ්‍යයනයට භාජනය කරන ලදී.

අයිපීටීපී/නාරා ආයතනය විසින් බඳවා ගන්නා ලද දත්ත රැස් කරන්නන් විසින් වෙරළ ඔස්සේ පිහිටා ඇති ප්‍රධාන බෝට්ටු ගොඩබෑමේ ස්ථාන පහක් අතරින් කරමල දැල් මගින් අල්ලනු ලැබූ මසුන් හා ප්‍රයත්නයන් පිළිබඳ දත්ත රැස්කර ගන්නා ලදී. තවද හලාවත ප්‍රදේශයේ කරමල දැල් ධීවර තොරතුරු ද ලබා ගන්නා ලදී.
තවද තොග තක්සේරු කිරීමට අදාලව ඉන්දියානු මැකරල් (Rastrelliger Kanagurtha ), හාල්මැස්සා ( Stolephorus Heterolobus) සුඩයා (S.Albella ) සාලයා ( Sardinella Gibbosa )සුරැල්ලා (Amblygastar Sirm ) යන කරමල දැල් මගින් අල්ලනු ලබන කුඩා මසුන්ගේ දත්ත ද රැස්කර ගන්නා ලදී.
වර්ෂයේ අවසාන භාගයේ දී දකුණු පළාතේ හා නිරිත දිග ප්‍රදේශයන්හි පැවැති භීෂණය හා ප්‍රවාහන අපහසුතාවයන් හේතුකොටගෙන දත්ත රැස් කිරීමේ කාර්යයන් එක්තරා ප්‍රමාණයකින් අඩාල තත්වයකින් කෙරෙන ලදී. වෙරළාසන්නව විශාල දැල් මගින් අල්ලා ගත් මසුන් හා ප්‍රයත්නයන් පිළිබඳ දත්ත රැස් කරන ලද්දේ මීගමුවෙන් හා මොරටුව බේරුවල අතර ප්‍රදේශයන්ගෙනි. 1988 වර්ෂයේ ඇල්ලූ මසුන් ප්‍රමාණයන් වෙනස් නොවී පවතී. වෙරළාශ්‍රිත මා දැල් මසුන් පිළිබඳ අධ්‍යයනය හික්කඩුව හා අම්බලන්ගොඩ ප්‍රදේශවල දී කරන ලදී. මෙයින් 1987 වර්ෂයට වඩා 1988 වර්ෂයේ දී ඇල්ලූ මසුන් ප්‍රමාණය සුළු ප්‍රමාණයකින් ඉහළ ගොස් තිබීය. මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු යොදවනු ලැබීය.

1.3.1.2. <u>විශාල සාමුද්‍ර ධීවර කර්මාන්තය අධ්‍යයනය.</u>

නාරා/අයිපීටීපී ආයතන මගින් කරන ලද ටූනා ආදර්ශක වැඩ සටහනට අමතරව පහත සඳහන් පර්යේෂණ කටයුතු ද කරනලදී.

(අ) කුඩා වර්ගයේ ටූනා මසුන් බිත්තර දැමීමේ වාරය පිළිබඳ තක්සේරු කිරීම හා උන්ගේ ආහාර සහ භක්ෂණ ක්‍රියාවින් පිළිබඳ ජෛව විද්‍යාත්මක අධ්‍යයනයක්.

(ආ) දෛනික වැඩීමේ මුදු යොදා ගනිමින් කාවාකාවා සහ තෝරා මසුන්ගේ ආයුෂ හා වැඩීම පිළිබඳ අධ්‍යයනය.

(ඇ) කුඩා ටූනා යෙලෝ-ෆින් ( Yellowfin ) හා පතින මසුන්(Skipjack ) ආදී මසුන් පිළිබඳ තොග තක්සේරු අධ්‍යයනය.

මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු යොදවනු ලැබීය. මෙම අධ්‍යයනයන්ගේ ප්‍රතිඵලවලින් සමහරක් පර්යේෂණ පත්‍රිකා මගින් ප්‍රසිද්ධ කරනු ලැබීය.

3 ...

1.3.1.3 ඉස්සන් ධීවර කර්මාන්තය .

මෙම ව්‍යාපෘතිය මගින් ආවරණය කරන ලද ප්‍රදේශය හලාවත සිට අලුත්ගම දක්වාය. හලාවත, මීගමුව හා බේරුවල ප්‍රධාන ගොඩ බැසීමේ ස්ථානයන්ය. හලාවත ප්‍රදේශයේ ඉස්සන් සඳහා ට්‍රෝලිං කරනු ලබන්නේ ටොන් 3 1/2 යාන්ත්‍රික බෝට්ටුමගින් වන අතර මීගමුව ප්‍රදේශයේ ට්‍රෝලිං කරනු ලබන්නේ යාන්ත්‍රික නොවන රුවල් ඔරු මගිනි. කළුතර ප්‍රදේශයේ ඉස්සන් අල්ලනු ලබන්නේ කරමලදැල් හා හැකිලිදැල් භාවිතා කරන එෆ්ආර්පී. බෝට්ටුමගිනි. අල්ලනු ලබන මසුන් ප්‍රමාණය හා ප්‍රයත්නයන් පිළිබඳ දත්ත රැස්කරනු ලබන්නේ මසකට දෙවතාවක් ඒ ඒ ගොඩ බැසීමේ ස්ථානයන්වලදීය. කළුතර ප්‍රදේශයේ ඉස්සන්ගේ දිග, ස්ත්‍රී පුරුෂ භාවය හා වැඩීම පිළිබඳ දත්තයන් ද රැස්කරන ලදී.

වර්ෂයේ අවසාන භාගයේ දී දිවයිනේ පැවැති භීෂණ තත්ත්වයන් හේතුකොටගෙන දත්තයන් රැස්කිරීමේ දී එක්තරා ප්‍රමාණයක දුෂ්කර තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවිය. මීගමුවේ දී ඉස්සන් නිෂ්පාදනය 1986 සිට 1987 දක්වා 51 % කින් ද 1987 සිට 1988 දක්වා 38 % කින් ද වැඩි වීමක් පෙන්නුම් කෙරේ. හලාවත ප්‍රදේශයේ ඉස්සන් නිෂ්පාදනය 1986 සිට 1987 දක්වා 46 % කින් ද 1987 සිට 1988 දක්වා 43 % කින් ද වැඩි වී ඇත. මෙම ප්‍රතිඵල කලින් පල කළ අනාවැකි ආදර්ශක වලට අනුකූල නොවේ. මෙම දෙපළාතේ කරන ලද ආදර්ශණ වැඩ ප්‍රමාණවත් නොවන බැව් පෙනී ගොස් ඇත.
එම නිසා මෙම පදේශවල කුඩා මසුන් තොග පිළිබඳව නිගමනයකට බැසීමට පෙර ආදර්ශක වැඩ පිළිවෙලවල් තවදුරටත් තර කිරීම් සිදු කළ යුතුය.

1.3.1.4 පොකිරිස්සන් ධීවර කර්මාන්තය.

ගාල්ල සිට කිරින්ද දක්වා මසකට දෙවරක් පොකිරිස්සන් ගොඩබාන ස්ථානවල ආදර්ශක කටයුතු කර ඇත. 1988 අගෝස්තු දක්වා පොකිරිස්සන් ඇල්ලීම හා ප්‍රයත්නයන් පිළිබඳ දත්ත රැස්කොට ඇත. ආරක්ෂක හේතූන්මත සමහර ගොඩබාන ස්ථානවලට නිලධාරීන්ට යා නොහැකි වූ හේතුවෙන් මෙම කාරක වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී යම් යම් දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුවිය. 1987 වර්ෂය හා සසඳා බලන කල වර්ෂයේ මුල් භාගය තුල පොකිරිස්සන් නිෂ්පාදනය පහළ බැස තිබිණ. මෙම ව්‍යාපෘතියේ සේවය කරමින් සිටි පර්යේෂණ නිලධාරියා පශ්චාත් උපාධියක් හැදෑරීම පිණිස සැප්තැම්බර් මස විදේශ ගත විය. එම හේතුවෙන් 1988 සැප්තැම්බර් මස සිට මෙම ව්‍යාපෘතිය වසා දමන ලදී.

1.3.2 විදේශ අරමුදල් යෙදූ ව්‍යාපෘති.

අයිපිටීපී/නාරා ආයතන විසින් කරනු ලබන ශ්‍රී ලංකාවේ ආදර්ශ මත්ස්‍ය වැඩ සටහන.

ඉන්දු පැසිපික් ටූනා වැඩ සටහන (අයිපිටීපී) සහ නාරා ආයතනය බද්ධව හම්බන්තොට, මාතර, බේරුවල, මීගමුව හා කල්පිටිය යන ප්‍රධාන ගොඩ බෑසීමේ ස්ථානවල කුඩා සමුද්‍ර මසුන්, ටූනා සහ ටූනා වර්ගයේ මසුන් පිළිබඳ ආදර්ශක වැඩ සටහනක් දැනට ක්‍රියාත්මක කොට ඇත. සෑම වැදගත් මසුන් වර්ගයකම දිග ඇතුළු ප්‍රයත්නයන් ද ඇල්ලූ මසුන් ප්‍රමාණයද පිළිබඳ දත්තයන් රැස්කිරීම සඳහා මෙම ස්ථානවල දත්ත රැස් කරන්නන් දස දෙනෙකු යොදවනු ලැබීය. 1988 වර්ෂයේ දීමෙම ක්‍රියාකාරී වැඩසටහන් දිගටම පවත්වන ලද අතර දත්ත පිළිබඳ විශ්ලේෂණ කටයුතු නාරා ආයතනයේ නිලධාරීන් විසින් කරනු ලැබීය. ටූනා මසුන් පිළිබඳත්ත කොම්පියුටර් යන්ත්‍ර වලට කැවීම හා කොම්පියුටර් වැඩ සටහන් සැකසීම් කටයුතු කෙරෙහි ලා ඉන්දු පැසිපික් ටූනා වැඩ සටහන (අයිපිටීපී) ආයතන - නාරා ආයතනයට සහාය විය.

1.3.2.2 ශ්‍රී ලංකාවේ ටූනා ධීවර කර්මාන්තය.
ආ.කෘ.ස/නාරා ගවේශක ( ටී.සී.පී/එස්ආර්එල්/6653(1) )

මෙම සමීක්ෂණය 1988 වසරේදීත් ක්‍රියාත්මක විය. වර්ෂය තුළ මසුන් ඇල්ලීම සඳහා 36 වතාවක් මුහුදු චාරිකා කළ අතර ඒ සඳහා ධීවර දින 130 ක් ගතවිය. එක් මුහුදු ගමනක දී මසුන් කි.ග්‍රෑම්.235 ක සාමාන්‍ය මසුන් නිශ්පාදනයක් වාර්තා විය. යෙලෝෆින් ටූනා (Yellowfin ) හා ස්කිප් ජැක් ටූනා ( Skipjack ) වර්ගයේ මසුන්ගේ ආහාර භක්ෂණයේ පුරුදු පිළිබඳ හා ජීව විද්‍යාත්මක අධ්‍යයනයක් කරන ලදී. 1988 දෙසැම්බර් මාසයේ දී සමීක්ෂණය අවසන් කරන ලදී.

2.0 මිරිදිය ජලජ සම්පත් අංශය.

2.1 පරමාර්ථ

2.1.1 මිරිදිය හා කිවුල් දිය ජලජීවීවගාවන් දියුණු කිරීම පිළිබඳ කෙටි හා මධ්‍යම කාලීන පර්යේෂණ හා නියාමක මෙහෙයුම්.

2.1.2 ඔරුවාර්පීනා හා වාරකාල වැනි උපයෝගීකර ගැනීම හා වැඩි දියුණු කිරීම

2.1.3 ජලජීවී වගාවන් සංවර්ධනය කිරීම උදෙසා උපදෙස් සේවා සැලසීම හා ජලජීවී වගාවන්ගේ අභ්‍යාසවලින් පරිසරයට බලපාන ප්‍රතිඵල අධීක්ෂණය කිරීම.

2.2. සේවක මණ්ඩලය.

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 17 |
| පර්යේෂණ සහකාරවරුන් | 10 |
| විද්‍යාගාර සේවකයින් | 05 |
| යතුරු ලේඛකයින් | 01 |
| සැලසුම්කරු | 01 |

5 ....

සමාලෝචනයට භාජනය වූ කාල සීමා තුළ පර්යේෂණ නිලධාරීන් 17 දෙනෙකු ද පර්යේෂණ සහකාරවරුන් 06 දෙනෙකු ද විද්‍යාගාර සේවකයින් 05 දෙනෙකු ද මෙම අංශයට සම්බන්ධව කටයුතු කළහ. පර්යේෂණ සහකාරවරුන් 04 දෙනෙකු ද යතුරු ලේඛකයෙකු ද සැලසුම් කරුවෙකු ද කොන්ත්‍රාත් පදනම මත සේවය කළහ. පී. විජේගුණවර්ධන මහත්මිය සහ බී. ඊ. එස්. ජයමහ මහතා ද යන අය සේවයෙහි ස්ථිර කරන ලද අතර විද්‍යාගාර සේවක ජේ. කොස්තා මහතා ගබඩා භාරකාරවර යෙකු වශයෙන් පත්වීම ලැබීය.

2.3. කාර්ය වැඩ සටහන හා ප්‍රගතිය.

නාරා ආයතනය විසින් අරමුදල් යෙදූ ව්‍යාපෘති.

2.3.1 මීගමු කලපුවේ කල මී මසුන් පැටව් පිළිබඳ සමීක්ෂණය.

පරමාර්ථ:

වගාවන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේ අදහස යටතේ කල මී මසුන් පැටවුන්ගේ සංඛ්‍යාව ඔවුන්ගේ වාරකාල අනුව වෙනස්වීම හා එම මසුන් ඇති ස්ථාන පිළිබඳ තක්සේරු කිරීම. අගෝස්තු මාසයේ දී ආදර්ශක කටයුතු ආරම්භ වූ අතර සාර්ථක ලෙස කෙරීගෙන යයි. පැටවුන්ගේ බර හා දිග මිම් වාර්තාගත කොට ඇත. එක්රැස් කිරීම් ස්ථානවල භෞත රසායනික තත්ත්වයන් ද වාර්තා ගතකොට ඇත.

2.3.2 රතු තිලාපියා ව්‍යාපෘතිය.

පරමාර්ථ:

රතුතිලාපියා මසුන් වගාව හා බෝ කිරීමෙන් 100% ක්ම රතු වර්ගයේ වර්ගයේ පැටවුන් ලබා ගැනීම හා තිලාපියා මසුන් සඳහා රුචිකත්ත්වයන් වැඩි කිරීම.

අප්‍රේල් මාසයේ දී ව්‍යාපාතිය ආරම්භ වීය. ජූලි මස අවසානයේ දී රකින්නන් ලබා ගන්නා ලදී. කුඩා තිලාපියාවන් නාරා ආයතනයෙහි ඇති සිමෙන්ති ටැංකි වලට හඳුන්වන ලද අතර මීගමුවේ කිවුල් දිය පොකුණුවලට ද සුළු ප්‍රමාණයක් දමන ලදී. පොකුණුවල භෞත රසායනික තත්ත්වයන් හා මසුන්ගේ වැඩීමේ මිම් ද වාර්තා කොට ඇත. ආහාර දීම ද ක්‍රමානුකූලව කෙරේ. කුඩා අතු රිකිලිවල පැටලී සිටි තිලාපියා මසුන් සිව් දෙනෙකු විවෘත වෙළඳ පොලේ දී අලෙවි කරන ලදී. ග්‍රෑම්. 750 ක් පමණ බර වූ මෙම මසුන් හතර දෙනා රු. 52/- ක කට මිළ වීය. වර්ණ තිලාපියා සඳහා දිරිගන්වන සුළු වෙළඳ පලක් තිබීමේ ලකුණකි මෙය.

2.3.3 ආඳා පැටවුන් සමීක්ෂණය

පරමාර්ථ:

ආඳා පැටවුන් ගංගාවලට සංක්‍රමණය වීමේ රටාවන් සහ වගා වන් සඳහා ලබා ගත හැකි ප්‍රමාණය නිගමනය කිරීමේ සමීක්ෂණය අගෝස්තු මාසේ දී ආරම්භවිය. බටහිර හා දකුණු මුහුදු බඩ විවිධ ප්‍රදේශවල විවිධ වර්ගවල දැල් භාවිතය පරීක්ෂා කරන ලදී. දෛනික සමීක්ෂණ ද කරනු ලැබීය. ප්‍රවාහන ප්‍රශ්න හා මෑතකදී පැවැති කලබලකාරී තත්ත්වයන් සමීක්ෂණයට දැඩිලෙස බාධා කාරී විය.

2.3.4 ජල ජීවී වගාවන් සඳහා භාවිතා කරනු පිණිස පිරියොනික්ස් එක්ස්කැවටා (**Periyonyx Excavata**) අගැයීමක් ද කොට අවසන් කරන ලදී. මත්ස්‍යයන් සඳහා පෝෂ්‍යදායක අගය, වගා තත්ත්වයන් හා ප්‍රති නිශ්පාදනයේ ප්‍රමාණයන් ආදිය පිළිබඳ අධ්‍යයනයක් ද කරන ලදී.

2.3.5 නුවරඑළියේ පිහිටි ග්‍රෙගරි වැවේ ජීවී පරිස්ථිති විද්‍යාත්මක තත්ත්වය පිළිබඳ සමීක්ෂණය. මෙය වර්ෂයකට පමණ කාලයකට ආරම්භකරන ලද්දක් වුව රටේ පැවැති අසහනකාරී තත්ත්වය හේතුවෙන් සැප්තැම්බර් මස අවසානයේදී නවත්වා දමන ලදී.

2.3.6 කඩොලාන නිශ්පාදකතාව හා කුණුරොඩු දිරාපත්වීම පිළිබඳ අධ්‍යයනය.

පරමාර්ථ:

ඕලන්ද වරාය අද්දරෙහි හා ගංගා මාර්ගයෙහි ප්‍රධාන කඩොලාන පරිසර පද්ධතීන් වර්ගවල සම්පූර්ණ රොඩු නිශ්පාදනය හා ප්‍රමාණය නිගමනය කිරීම.

මෙම පරිසර පද්ධතීන් අතර කඩොලාන ගස්වල වාර්ෂික කාණ්ඩ වර්ධනය පිළිබඳ මැන බැලීම. ඕලන්ද වරායෙහි කඩොලාන පරිසර පද්ධතීන් වල ශුද්ධ මූලික නිශ්පාදනතාවය (**NPP** ) නිගමනය කිරීම.

ප්‍රමුඛ කඩොලාන වර්ගවල කොළරොඩු දිරාපත්වීම පරීක්ෂා කිරීම. එනම්, මෙම භාජනවල රයිසෝෆෝරා මියු ක්‍රොනිටා (**Rhizophora Mucroneta** ) සහ අවිසීනියා මරිනා (**Aviceania Marina**) පරීක්ෂා කිරීම.

මෙම කඩොලාන ප්‍රදේශවලින් මුහුදුබඩ ජලයට වාර්ෂිකව එකතුවන කාබනික ද්‍රව්‍ය (**detritus**) පිළිබඳ ඇස්තමේන්තු කිරීම.

නිපදවන ප්‍රමාණය :

කලාඔය මෝය කට ප්‍රදේශයේ ගංගාන්තර භාජනවල කුණුරොඩු නිශ්පාදනය අවුරුද්දට හෙක්ටෙයාරයකට ටොන් 6.0 ක් ලෙස ඇස්තමේන්තුකර ඇති අතර බිමට හැලෙන සම්පූර්ණ රොඩු වලින් 81% ක් පමණ කොළරොඩු ලෙස ගණන් බලා ඇත. නොකඩවා නිපැදවෙන කාබනික ද්‍රව්‍ය (Detritus) ප්‍රදෙස ආධාරවන සම්පූර්ණ කුණුරොඩු අතරින් ඉතා වැදගත්ම කොටස වැටෙන කොළරොඩු වන අතර ඒවා කලපුවේ සහ මෝය කටේ කඩොලාන දියෙහි ආහාර දැල් කැදැලි වැඩි හරියක්ම සඳහා ආහාර පදනමක් ද වී ඇත.

කලාඔය අවට වාර්ෂික කඩොලාන ගස්වල දැව වැඩීම වර්ෂයකට හෙක්-ටෙයාරයකට ටොන් 6.20 ක් වන අතර එරුමතිවු අවට මෙම දැව වැඩීමේ ප්‍රමාණය වර්ෂයකට හෙක්ටෙයාරයකට ටොන් 2.9 වේ.

ගංගාන්තරවල කඩොලාන පරිසර පද්ධතීන්හි ගොඩබිම දළ ප්‍රාථමික නිෂ්පාදනය (NPP) වාර්ෂිකව හෙක්ටෙයාරයකට ටොන් 12 ක්(කාබනික ද්‍රව්‍ය වියළිබර) වියහැකි අතර ඉරුමතිවූ අද්දර ඇල් කැඳැලිවල (NPP) ප්‍රමාණය වර්ෂයකට හෙක්ටෙයාරයකට ටොන් 07 යයි ඇස්තමේන්තු කොට ඇත. මෙම ව්‍යාපෘති යේ දී යොයාගත් සමීක්ෂණ තොරතුරු අලලා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශන ශාස්ත්‍රපති උපාධියක් සඳහා ප්‍රවාදයක් ද සකස් කොට ඉදිරිපත් කර ඇත.

2.3.7 කඩොලාන පරිසර පද්ධතීන්හි පෝෂ්‍ය/ජරික් සම්බන්ධතාවය.

ඕලන්ද වරායෙහි ඉරුමතිවූ අසල ඇල් කැඳැලි අවක්‍රමනය කරන්නාවූ කඩොලාන කොළරොඩු අතර වෙසෙන උල් ගොලුබෙල්ලන් (gasteropods ) හෙවත් terebralia Palustic නම් බෙල්ලාගේ කාර්යභාරය .
(මෙය ක්‍රියාත්මකවෙමින් පවතින ව්‍යාපෘතියකි)

පරමාර්ථ:

උල් ගොලුබෙල්ලාගේ( gasteropods . ) ජනගහණ ව්‍යුහය හා ව්‍යාප්තිය නිගමනය කිරීම ( ජනගහණ ගති විද්‍යාව)

ගොලුබෙල්ලන්ගේ භක්ෂණ පරිසර විද්‍යාව හෙවත් නියමිත ප්‍රමාණයක ස්වාස්ථිත ද්‍රව්‍යයක් ලෙව කැමේ හැකියාව ඇස්තමේන්තු කිරීම.
කඩොලාන කොළරොඩු අවක්‍රමණය වීමට(Terebra Palustric බෙල්ලාගේ දායකත්වය.කාබනික ද්‍රව්‍ය නිපදවීමේ ලා ඇස්තමේන්තුකිරීම.
බෙලි කටුවෙහි දිග හා සම්පූර්ණ වියළිබර අතර සම්බන්ධතාවය නිගමනය කර ඇත. බෙල්ලන්ගේ ජනගහණ ඝනත්වය මැන බැලීමට( Mangal ඇල් කැඳලි හරහා වැටී ඇති මීටර් 2 x 50 ප්‍රමාණයේ බෙදුම් තීරු ආධාර කරගෙන ඇත.
ආහාර භක්ෂණයේ ප්‍රමාණය හා ආහාර සඳහා ඇති කැමැත්ත පිළිබඳ ක්ෂෙත්‍ර වශයෙන් හා විද්‍යාගාර මගින් පරීක්ෂාකර බැලීමට සැලසුම් කරඇත.

2.3.8 අඩෙලවණ පසෙහි කඩොලාන ආහාර දීමේ වැඩීම.

පරමාර්ථ:

විවිධ ලවණතාවයන්ගෙන් යුතු හා තත්ත්වයන්ගෙන් යුතු පසෙහි අවිසේනියා මරිනා ( Avicenia Marina ) හා රිසෝ/ෆෝරා මියුක්‍රොනාටා Rhizophora Mucronata ) බීජ පැල වැඩීමේ ප්‍රමාණයන් නිගමනය කිරීම.
විවිධ ලවණතාවයන්ගෙන් යුතු ජල බලපෑම් ඇති රජයනයන්හි ඉහත කී පැල වර්ගවල වැඩීමේ පරිමාවන් නිගමනය කිරීම.

2.3.9 " නරේසා " ආයතනය මගින් අරමුදල් යෙදූ ව්‍යාපෘති.

2.3.9.1 - ආර්ටේමියා ව්‍යාපෘතිය.

ශ්‍රී ලංකාවේ ආටේමියා පිළිබඳ පහත සඳහන් ය යන් අධ්‍යයනය කරනු ලැබීය.

අ. ජීවිත චක්‍රය හා ප්‍රජනනය.
ආ. රැක්කවීමේ ප්‍රතිශතය සහ වෙනස්වන උෂ්ණත්වයන් සහ හයිඩ්‍රජන් අයන් සාන්ද්‍රණය (Ph ) තත්ත්වයන් මත ආර්ටේමියා කෝෂ්ඨ කාර්යක්ෂමතාවය.
ඇ. විද්‍යාගාර තුළ මුහුදු පෙඳ ( Dunaliella ) වගා කිරීම.
ඈ. පලා විහි පරීක්ෂණ පොකුණු 04 ක් ඉදිකිරීම.

2.3.9.2 – විසිතුරු ධීවර කර්මාන්තය

තාරා හි සාමාන්‍ය බලාගැනීමේ ඒකකයක් ඇත. විසිතුරු මසුන් ඇති කරන්නන්ට නාරා ආයතනය මගින් දේශන මෙහෙයවනු ලැබේ. පෞද්ගලිකව විසිතුරු මසුන් වගා කරන්නන්ට ව්‍යාපෘති ආරම්භ කිරීමට ආධාර දෙනු ලැබේ.

2.3.9.3 – මඩකකුළු ධීවර කර්මාන්තය:

1988 ජනවාරි සිට 1988 දෙසැම්බර් මස දක්වා කාලය තුළ පහත සඳහන් මඩ කකුළු ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයන අංශයන් මෙහෙයවන ලදී.

<u>ප්‍රජනක ජීව විද්‍යාව</u> – මීගමුව කලපුවෙන් අල්ලා ගනු ලද ගැහැණු කකුළුවන් ඔවුන්ගේ ඒ ඒ කල්පිරීමේ අදියරයන් සොයාගැනීමට ව්‍යවච්ඡේදනය කරන ලද අතර එම දත්ත මසක් තුළ වැඩුණු ගැහැණු කකුළුවන්ගේ සංඛ්‍යාතය දැන ගැනීම සඳහා විශ්ලේෂණය කෙරුණ ලදී. පෙබරවාරි-ජූනි කාලය තුළ වැඩුණු ගැහැණු කකුළුවන් ප්‍රමාණයක් තිබෙන බව සොයා ගත හැකිවිය.
කල් පිරීමේ අදියර වලදී ගර්භ බීජ විශ්කම්භයේ සංඛ්‍යාතයන්, තෙමේරීම, දියුණුවීම, මේරීම, බිත්තර ඇමීම හා කෝම්බය පිළිබඳ විවිධ මේරුම් අවධි වල ගර්භ බීජ විශ්කම්භයන් දුර දක්නයන් මාර්ගයෙන් මැන බලන ලදී.

<u>භක්ෂණ ජීව විද්‍යාව</u> –
මඩ කකුළුවාගේ භක්ෂණය විලාශය හා ආහාර වල වාරකාල අනුව වෙනස්වීම් පිළිබඳව අධ්‍යයනය කරන ලදී. කකුළුවාගේ ප්‍රමාණය අනුව භක්ෂණ විලාශයන් වෙනස්වේ. කුඩා ප්‍රමාණයේ කකුළුවෝ කොර සහිත මත්ස්‍ය වර්ගයක් හා ලොකු කකුළුවෝ මට්ටියන් වර්ග කෑමට ප්‍රිය කරති. ( Scylla Serrata ) දෛනික සමීක්ෂණ මගින් කකුළුවන්ගේ භක්ෂණ වේලාවන් අධ්‍යයනය කර තිබේ.

<u>කීට හා බාලක ජනගහණය</u> :

වාරකාලිකව හා දෛනිකව මඩ කකුළුවන්ගේ කීට හා බාලක ජනගහණයන් පිළිබඳව ද අධ්‍යයනය කර ඇත.

<u>ඉට්‍රෝප්ලස් සුරටෙන්සිස් ( Etroplus Suratensis ) අභිජනනය.</u>

ජීවී නිදර්ශක Etroplus Suratensis . නාරා ආයතනය වෙත ගෙන එන ලදුව සිමෙන්ති ටැංකිවල ඇති කරනු ලැබීය. වේදනාව ඇතිවූවිට ඔවුන් වෙන් කරනු ලැබීය.

දිනකට වරක් ආහාර වශයෙන් **Hydrilla sp** දෙන ලදී. සාත්තු කිරීමේ දී ඇතුවුණු හිරිහැර ආයක තත්ත්වයන් අනුව අවසාන භාගයේ දී ඔවුන් ටැංකි තුල ඇඩී තිසලතාවයකින් පසුවනු දක්නා ලදී.

2.3.10 - ජඩ්බී/එන්ඩ්බී වැඩබිම සමීක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය - අදියර II.

1988 ජනවාරි මස අදියර II ආරම්භ විය. ප්‍රධාන වශයෙන් නවාතැන් පහසුකම් සොයාගැනීම සහ වැඩබිම හඳුනා ගැනීම පිණිස දකුණේ මාතර දක්වා මූලික ගමනක් යොදා ගන්නා ලදී. අලුත්ගම සිට මාතර දක්වා වැඩ බිම් 11 ක් තෝරා ගන්නා ලදී. එවකට රටෙහි පැවැති වාතාවරණය හේතුවෙන් මාතර පමණක් සමීක්ෂණ කටයුතු තාවකාලිකව අරඹන ලදී. 1988 අප්‍රේල් මාසයේ සිට ශ්‍රී ලංකාවේ දකුණු මුහුදු බඩ තීරුවෙහි සමීක්ෂණ මගින් පහත සඳහන් ලක්ෂණ වාර්තා ගත කරන ලදී.

<u>භෞත රසායනික ලක්ෂණ</u>

ලවණතාවය, උෂ්ණත්වය, හයිඩ්‍රජන් අයන් සාන්ද්‍රණය(Ph ) Do අගය සහ පෝෂක යනාදිය මෙයට ඇතුලත්ය.

<u>අධ්‍යයනය.</u>

1988 අප්‍රේල් මස දී ආදර්ශ කටයුතු ආරම්භකරන ලදී. බෙන්තොට හා මාතර අතර වැඩබිම් 08 ක් හඳුනා ගන්නා ලදී.
සම්පූර්ණ ප්‍රදේශයේම කටයුතු සඳහා දැනට කෙරීගෙන යන වැඩබිම් ගණන ප්‍රමාණවත් නොවන බැව් වැටහී ගියෙන් මෙම අලුත් වැඩ බිම් ද ජූලි මාසයේ දී සමීක්ෂණ වලට එකතු කරන ලදී.
ජගත දිග වෙරළබඩ ප්‍රදේශ හා සංසන්දනය කරන විට මෙම කලපුවල නිතලවාසීහු( **Benthos** ) මන්ද ජනගහණයකින් යුක්ත බව අධ්‍යයනවලින් පෙනීගොස් ඇත. සමහර ස්ථානවල මෙම ජීවියා කොහෙත්ම සොයාගත නොහැකි විය. වැඩබිම් වැඩි හරියකම මුහුදු කටවල් වැසී පැවතීම මෙයට හේතුව යයි සිතිය හැක. මෙම කලපුවලින් වැඩි හරියක්ම ප්‍රදේශයේ පොල් කෝම්බ සහ අනිකුත් අපද්‍රව්‍ය දැමීමට යොදාගත් ඒවාය. සැප්තැම්බර් මාසයේ දී අධ්‍යයන කටයුතු තාවකාලිකව නවතා දමන ලදී.

<u>පසෙහි භෞත රසායනික ලක්ෂණ:</u>

ඉස්සන් වගාව සඳහා පොකුණු ගොඩනැගීමට අදාලව පසෙහි භෞත රසායනික තත්ත්වයන් පිළිබඳ විග්‍රහයක් කරනු වස් මෙම අභ්‍යාසය මෙහෙයවනු ලැබීය. කොස්ගොඩවැව, බෙන්තොටගඟ, කළු ගඟ සහබොල්ගොඩ වැව අවට විහව ප්‍රදේශවල ආදර්ශක කටයුතු ක්‍රියාත්මක කරන ලදී. පස් පිළිබඳ යාන්ත්‍රික විග්‍රහයක් හා පසෙහි හයිඩ්‍රජන් අයන් සාන්ද්‍රණය( Ph ) වල පරාමිති අධ්‍යයනය කරන ලදී.

කඩොලාන සමීක්ෂණය :

පහත සඳහන් විෂයයන් පිළිබඳ අධ්‍යයන කරන ලදී.

බොහැරීමේ රටාව:

බොල්ගොඩ වැවෙයි කඩොලාන වර්ග රාශියකින් සමන්විතය. කඩොලාන හා සමාන ගස්වර්ගයක් ද බොහෝය. තෝරාගත් වැඩ බිම් වල ද කඩොලාන වර්ගයන් සොයාගෙන ඇත Bruguriore සහ Rhyzophora Apiculata නම් ගස් වර්ග ද මෙයට ඇතුලත්ය. වාද්දුව ප්‍රදේශයේද කඩොලාන හා අනුබද්ධිත වර්ගවල ගස් බොහෝ ඇත.
නොවැලැක්විය හැකි හේතූන් නිසා 1988 සැප්තැම්බර් මාසයේ දී සමීක්ෂණ කටයුතු තාවකාලිකව අත්හිටවනු ලැබීය.

## 2.4. විදේශාධාර ලැබූ ව්‍යාපෘති.

### 2.4.1 ශ්‍රී ලංකා ඉස්සන් රෝහලීමේ ස්ථාන IFS(Sweden) පිළිබඳ රෝගාශ්‍රිත සීමාවන්.

ප්‍රමුඛ අදියරේ පරමාර්ථ:

හැචරියේ දී ඒක න මහුන් ආරක්ෂා කර ගැනීමේ පිළිවෙත් වැඩි දියුණුකිරීම වශයෙන් කිහුදු ජෛව වේදීය ආශාත්වය නිගමනය කිරීම.

නිපදවන ප්‍රතිඵල:

හලාවත පිටිටි ආයතියන් මැරිකල්වරි හැචරියෙන් නොකඩවා ජල සාම්පල ලබා ගැනම- එම ජලයෙහි අඩංගු බැක්ටීරියල් වර්ග ක්ෂුද්‍ර ජෛවවේදීය සාම්පල අධ්‍යයනය. මෙතෙක් අධ්‍යයනය කරන ලද්දේ මාසික ජෛව පදනමින් මනය බැක්ටීරියල් වර්ග අමිශ්‍ර වගාවක් ලෙස වෙන් කරන ලද අතර හැචරි ජලයෙහි ඒවායේ ප්‍රමාණය බණ්ඩව ඇස්තමේන්තුකර ඇත.

### 2.4.2 මොලුස්කාවිය ( Mollusca ) වගා ව්‍යාපෘතිය.

අයිඩිආර්සි ( IDRC ) මගින් මුල්‍යාධාර දෙන ලදී.

පරමාර්ථ:

කුඩා පරිමානයේ කටු සහිත වගාවන් ආශ්‍රිතව කලාඹය මෝය කටේ(පුත්තලම් කලපුවේ)කාවාටියා පැටවුන්( PRSSSOSFREA MADRASENSIS )පිළිබඳ වාරකාල වෙනස් වීම් පරීක්ෂා කිරීම.
පුත්තලම් කලපුවේ තෝරාගත් සුදුසු ස්ථානවල බෙල්ලන්( Crassostres Madrasensis පිළිබඳ සහ මට්ටියන් වර්ග( Pernavividis Perna Porna හා Marcia ;Opima.M.hiantina බහාලීම පිළිබඳ පරීක්ෂා කිරීම.
පුත්තලම් කලපුවේ මට්ටි සහ බෙල්ලන් කර්මාන්තය ධීවර කර්මයට උපයෝගීකර ගැනීමේ මට්ටම හා ආර්ථික තත්ත්වයන් පිළිබඳ අගැයීම සහ කළමනාකරණමය උපක්‍රම යෝජනා

11 .....

වයඹ
ශ්‍රී ලංකාවේ/වෙරළබඩ(කල්පිටිය) හා දකුණු පළාතේ(තංගල්ල,මිරිස්ස) ද
පහත සඳහන් වැඩබිම් ඔස්සේ පරීක්ෂණ වැඩ කටයුතු ආරම්භකොට ඇත.

1. තංගල්ල ධීවර වරාය - රක්වාන කපොල්ල
2. මිරිස්ස ධීවර වරාය
3. පුත්තලම් කලපුව - කල්පිටිය ඕලන්ද වරාය
   - කලාඔය මෝය කට
   - මොහොත්තුවාරම්

<u>තංගල්ල ධීවර වරාය.</u>

දිවයිනේ දකුණු ප්‍රදේශයේ ආවරණය වූ ස්ථානයක පිහිටා ඇති මඳ මුදු රැල්ලෙන් යුතු එකකි. වල් බෙල්ලන්(Saccostrea sp ) බහුලව ඇති අතර දුඹුරු බෙල්ලන්( Perma Perma ) විවෘත මුහුදු තීරයෙහි ගල්පර සහිත වෙරළබඩ දැකිය හැකිය. මුතු බෙල්ලන්ගේ( Oyster spats ) පැවැත්ම දුලබ අතර වරාය ප්‍රදේශයේ හා රක්වාන ගල්පොත්ත අසල දුඹුරු බෙල්ලන් ඉතා බහුලව ලැබේ. 1988 අධ්‍යයන කාල සීම තුල වරායෙහි බෙල්ලන් සඳහා ( 8x 5 මී.) ප්‍රමාණයේ බම්බු පහුරු යොදවනු ලැබීය. මෙම බම්බු පහුරු වලින් එකතුකරගත් දත්තයන් අනුව බෙල්ලන්ගේ වැඩීමේ ආකීර්ණ තත්ත්ව සාධක, කොල්ලකාරි හැසිරීම සහ අපිරිසිදු පරාමිති ආදී නිගමනය කිරීමේ කටයුතු මසකට වරක් බැගින් කරන ලදී. තවදුර අධ්‍යයන කටයුතු කරනු ලැබේ.

<u>රක්වාන ගල්පරය.</u>

දකුණු පළාතේ ඇති හොඳම ආවරණය වූ ගල්පරය මෙය වන අතර බෝකිරීම සඳහා බෙල්ලන් පැටවුන් ලබා ගැනීමේ සුදුසුම ස්ථානය ද වේ. මාස්පතා තන්තත්තාරේ සැරිසරන බෙල්ලන්ගේ වෘත්තපාද සාම්පල ලබාගෙන උන්ගේ භෞත රසායනික පරාමිති වාර්තාගත කොට තිබේ. තත්ත්ව සාධක හා වැඩීමේ අධ්‍යයනයන් සඳහා මට්ටි සාම්පල ලබා ගෙන ඇත.

<u>මිරිස්ස ධීවර වරාය.</u>

ඉතාමත් කාර්ය බහුල වරායකි.මනාලෙස ආවරණය වී ඇතිවා මෙන්ම කාවාටයන් හා බෙල්ලන් ගහණ ප්‍රදේශයකි. මට්ටි පැටවුන් එකතු කිරීමට සුදුසුය.1988 වසරේ දී මුතු බෙල්ලන්ගේ පැවැත්ම ඉතා අල්ප විය.තවදුර අධ්‍යයනය සඳහා භෞත රසායනික පරාමිති,සත්ත්ව ජලවාංග( Zooplankton )ශාක ජලවාංග ( Phytoplankton ) සහ වල් කාවාටියා සාම්පල ලබා ගන්නා ලදී. රාක්ක වල බෙලි පැටවුන් එකතුවීම පිළිස පෝ ලිකටු,ඇස්බෙස්ටෝස් පතුරු ජනෙල් වල වසන කාවාටි බෙලිකටු රඳවා තබනු ලැබේ.

<u>පුත්තලම් කලපුව:</u>

1. කල්පිටිය ( ඕලන්ද වරාය)
කාවාටියන් හා බෙල්ලන් වගාව සඳහා උකබම්බු පාරු 3 ක් සවිකරඇත.

12 .....

බෙල්ලන් - දුඹුරුපාට බෙල්ලන් (Perna Pe na )
කොළපාට බෙල්ලන් (Perna vividis )

කාවාටියන් ( Grassostrea Madrasensis)

වර්ෂය තුළ දුඹුරු බෙල්ලන් පිළිබඳ පහත සඳහන් වැඩ කටයුතු කරනු ලැබීය.

1. පළතුරු කඩාවල, පොල්කටුවල හා දැලැස් බටවල බෙල්ලන්ගේ වර්ධනය පිළිබඳ අධ්‍යයනය.
2. - එම - සත්ත්වයපිළිබඳ අධ්‍යයනය.
3. **ඊර්තපක** අධ්‍යයනය.
4. කොල්ලකාරි හැසිරීම.
5. මළ ගැසීමේ චෛත්‍රිකයා
6. තත්ත්ව සාධකය

ත්‍රිකුණාමලයේත ගෙන්වන ලද කොළපාට බෙල්ලන් 1988 ඔක්තෝබර යේදී එම ස්ථානයේ පැල කරන ලදී.
කොළපාට බෙල්ලන්ගේ වැඩීමේ අධ්‍යයනය, කොල්කාරි හැසිරීම, මළගැසීමේ චෛත්‍රිකයන් වාර්තා ගත කරන ලදී.
කලාඔය මෝය කටෙන් එකතුකර ගන්නා ලද මට්ටියා පැටවුන් පහත සඳහන් පර්යේෂණ කටයුතු සඳහා පැල කරන ලදී.

1. වැඩීමේ අධ්‍යයනය.
2. කොල්ලකාරි හැසිරීම හා මළ ගැසීමේ චෛත්‍රිකයන්

මෙම බෙල්ලන් වර්ග තුන පිළිබඳ පර්යේෂණ කටයුතු මුත්තුවරමිහි දී කරන ලදී.
අදාල භෞත රසායනික පරාමිති සත්ත්ව ප්ලවාංග( Zooplankton සහ ශාක ප්ලවාංග( (phytoplankton) ) පිළිබඳ සති දෙකකට වරක් බැගින් සාම්පල රැස්කරන ලදී.

__කලාඔය.__

කලාඔය වැඩ බිම් තුනක (Oyster Crassostrea ) සහ Madrasensis පිළිබඳව අධීක්ෂණ කටයුතු කරන ලදී. බෙල්ලන් පැටවුන් එකතුවීම පිණිස රාක්ක තුනක් තනන ලදී. සෑම දෙසතියකට වරක් බෙලි පැටවුන් ඇම්ම පිණිස පාරුවල පොල්කටු, කාවාටි කටු, ජනෙල්වල වසන කාවාටි කටු තබන ලදී. වැඩිදුර අධ්‍යයනය සඳහා භෞත රසායනික පරාමිති සත්ත්ව ප්ලවාංග ( Zooplankton ) ශාක ප්ලවාංග( Phytoplankton ,සාම්පල රැස්කරන ලදී.

__මට්ටි සහ කොර සහිත ධීවරය.__

මට්ටි සහ කොර සහිත මසුන් දෙවර්ගයට සඳහා පුත්තලම කලපුවේ කුඩා එහෙත් ව්‍යාප්ත වන්නාවූ ධීවර කර්මාන්තයක් පවතී. ප්‍රධාන මසුන් වර්ගයන් නම්:

1. මට්ටි Gafrarium Kumidum
2. කොරල් සහිත මසුන් Marcia Opina
3. පැතලි කොර සහිත මසුන් Marcia Hiantina

මෙම මට්ටි සහ කොරළ මසුන් පිළිබඳ පහත සඳහන් පර්යේෂණ කටයුතු සඳහා උණ බම්බු කඩු තුනක් ඉදි කරනු ලැබීය.

1. වැඩීම පිළිබඳ අධ්‍යයනය.
2. තත්ත්ව සාධක අධ්‍යයනය.
3. සනත්ත්ව අධ්‍යයනය
4. කොල්ලකාරී අධ්‍යයනය.

පුත්තලම් ප්‍රදේශයෙහි මට්ටි සහ කොරළ සහිත මසුන් වර්ග තුනක් පිළිබඳ අලෙවි සමීක්ෂණයක් හා සහජ ආර්ථිකය ද විභාග කරනු ලැබීය.

2.4.3 මුහුදු පැලෑටි වගා ව්‍යාපෘතිය:

මුදල් යොදවන ඒජන්සිය - බෙන්ගාල බොක්ක වැඩසටහන ( බීඕබීපී)

පරමාර්ථ:

අ. පුත්තලම කලපුවෙහි නියාමක පරිමාණයේ මුහුදු පැලෑටි ගොවි පලක් ආරම්භකොට මෙහෙයවීම.

ආ. වගාකරනු ලැබූ මුහුදු පැලෑටි වල වැඩීම සහ තත්ත්වය පිළිබඳ පර්යේෂණය කිරීම.

ඇ. නේවාසිකයන්ගේ ආදායම වැඩිකර ගැනීම සඳහා වගා කිරීමේ තාක්ෂණය ඔවුන් වෙත යොමු කිරීම.

මෙම ව්‍යාපෘතිය 1988 මුල් අවධියේ දී ආරම්භකරන ලද්දේ බෙන්ගාල බොක්කේ වැඩසටහන ආධාර යටතේය. 1988 මැයි මාසයේ දී බීජාණු තැන්පත් කිරීමේ පහසුකම් ද සහිතව බීජාණු පිළියෙළ කිරීම සඳහා මඩුවක් ඊතලෙයිහි ඉදිකරන ලදි. ජූනි මාසයේ දී පර්යේෂණ වැඩ ආරම්භ විය. ග්ලැසිලේරියා ( **Glacilaria** ) නම් විවිධ මුහුදු ශාක වර්ග පවතින ප්‍රමාණ හා ස්ථාන සොයාගැනීම හා බෙදා හැරීම පිළිබඳ සමීක්ෂණ ගණනාවක් බෝට්ටු මගින් පුත්තලම කලපුවේ දී කරන ලදි. ප්‍රදේශයේ ඇත්තේ මෙයින් දෙවර්ගයක්(**Glacilaria edulis,Glacilaria Verrucosa** පමණක් බව සොයාගනු ලැබීය. අගෝස්තු මාසයේ දී බීජාණු පිළියෙල කිරීම් පරීක්ෂණ 10 ක් පවත්වන ලදි. මේ සඳහා යොදා ගනු ලැබූ රාමු විවිධ වර්ගයේ අමු ද්‍රව්‍ය හතරක්. එනම්, රැෆියා (**Raffia** ) කෙඳි, ශුද්ධ කළ රැෆියා කෙඳි, මොනෝ ෆිලමන්ට් කෙඳි හා කොහු ලණුය. ආලෝකය, පොහොර යෙදීමෙන් හා සුළං කැවීමෙන් බීජාණුවල වර්ධනයන් පිරික්සන ලදි.

රාමුවල යෙදූ බීජ ද්‍රව්‍ය කලපුවේ තබා බීජාණු වර්ධනය පරීක්ෂාකරනු ලැබේ. පළමු මාස දෙකේ දී රාමුවල ඉතිරිවී තිබ්බේ පැල කිහිපයක් පමණි. ඔක්තෝබර සහ නොවැම්බර් මාසවල පැල වැඩියෙන් වැඩීමට පටන් ගත් අතර සෙන්ටිමීටර 10 ක් පමණ දිගවූ විශාල පැල දෙසැම්බර් මාසයේ දී දක්නට ලැබිණ. රාමුවල වැඩෙන පැලෑටි වලින් සමහරක් බීජාණු පිළියෙල කිරීම මගින් නොවැඩෙන ඒවා විය හැකි අතර ඒවා ස්වාභාවිකව වැඩෙන පැලෑටි විය හැක. කලපුවේ බීජ නොදැමූ ද්‍රව්‍ය සහිත රාමුද යොදවන ලදි.

14 .....

සැප්තැම්බර් මාසයේ දී වර්ධක ප්‍රචාරණය පිළිබඳ පර්යේෂණ ද අරඹන ලදී. වර්ධක කපා කොටු කඩපටෙහි රඳවා මසුන් විසින් භක්ෂණය කිරීමෙන් ආරක්ෂා වීම පිණිස මීටර් 10 x 15 ක ප්‍රමාණයේ කඩුවක් තුළ කලපුවේ දියයට තැන්පත් කරනු ලැබේ. සති දෙකකට වරක් පැලැටියේ වර්ධනය අධ්‍යයනය කරනු ලබන්නේ මැන්මෙනි. තෙමසක් තුළදී සෙ.මී.20 ක් පමණ දිගට මේ වා වැඩී තිබිණ.

## 2.4.4 ප්‍රභවාත්මක මසුන් ව්‍යාපෘතිය:

( IDRC ) අයිඩීආර්සී මගින් මුදල් යොදවන ලද්දකි. ශ්‍රී ලංකාවේ ජලාශවල හඳුන්වා දී ඇති සික් ලිඩ මසුන් ( Cichlids ) දෙමුහුම් කිරීමේ වැඩ පිළිවෙල අගැයීමට හා ධීවර කර්මාන්තයට එමගින් ලැබුණු ප්‍රතිඵල කොතෙක් දුරට ඵල දායක වී දැයි සොයා බැලීමට පර්යේෂණ ව්‍යාපෘතියක් 1988 අප්‍රේල් මස දී ආරම්භ කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථ මෙසේය:

1. තෝරාගත් ජලාශවල දෙමුහුම් කළ සික්ලිඩ මසුන්ගේ ජනගහණය කොපමණදැයි නිශ්චය කිරීම හා එම දෙමුහුම මගින් අභිකූත් තනි ජනගහණයේ නිශ්පාදනයට පහරක් වැදීමේ ප්‍රමාණයෙහි අන්‍යොන්‍ය සම්බන්ධයක් ඇති කිරීම.
2. ඉහත තොරතුරු ආශ්‍රිතව ධීවර කර්මාන්තයට සුදුසු කළමනාකරණ පියවර යෝජනා කිරීම.
3. ධීවර කර්මාන්තය සඳහා එමගින් ලැබෙන පිලවි භොගවල තත්ත්වය කොතෙක් දුරට යහපත් දැයි නිගමනය කිරීම.

## 2.5 - අවසන් කරන ලද වැඩ

1. රුහුණු විශ්ව විද්‍යාලය සඳහා විස්තරාත්මක ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර ඇත.
2. රුහුණු විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කිරීම සඳහා සාහිත්‍යික සමීක්ෂණයක් නිම කොට ඇත.
3. පහත සඳහන් හේතූන්මත ධීවර කර්මාන්තයට හැරවීමට සුදුසු උතුරු මැද පළාතේ ජලාශ තුනක් තෝරාගෙන ඇත.

   (අ) 1987 ද සිල්වා වාර්තාව අනුව බොහෝ කැලයක් පවත්නාවූ ජලාශ වලින් වැඩි හරියක්ම ප්‍රධාන වශයෙන් පිහිටා ඇත්තේ දිවයිනේ වියළි කලාපවලය
4. Euzyme loci හෙවත් අක්මාව, රතු පේශින්, සුදු පේශින් හා ඇස් පිළිබඳ දෙමුහුම් විකිරියය හඳුනා ගැනීම සඳහා විද්‍යුද් ධරක පරීක්ෂණ පවත්වා ඇත.

15 ...

නිමවෙමින් පවතින වැඩ:

1. විවිධ මසුන් ජනගහනයන්ගේ ඇල්ලීමේ තත්ත්වයන් වාරකාල හා සම්බන්ධතා-වයක් ඇද්දැයි නිගමනය කරගනු වස්, වියළි, තෙත් හා අන්තර් මධ්‍ය කාල වලදී ඉහත කී ජලාශවල වාණිජ්‍ය ධීවර කර්මාන්තයෙන් සාම්පල රැස්කොට ගන්නා ලදී. සාම්පලවල ප්‍රමාණය නිගමනය කරනු ලබන්නේ දෘෂ්ඨි පුනරං-කරණ ලක්ෂණ( visual meristic characten ) විභාග කොට මිශ්‍රවීමේ මට්ටම බැලීමෙනි.

2. සියලුම මසුන් සාම්පල ඒවායේ රූප විද්‍යාත්මක හා රූපප්‍රමිතික ලක්ෂණයන් පිළිබඳ විග්‍රහයන් කරනු ලැබේ.මෙයට අමතරව එක් එක් මසුන් ජනගහණයන්ගේ කල් පිරීමේ දී මධ්‍යනය ප්‍රමාණය හා ජනක ශක්තිය ද තක්සේරු කරනු ලැබේ.

3. වාණිජ්‍ය ධීවරයෙන් ලබාගත් මසුන්ගේ ඇස්,සුදු පේශීන්,රතු පේශීන් හා අක්මාවන්හි පටක උද්ධෘතවල ජෙල් විද්‍යුත් ධරක( gel electrophoresis භාවිතාකොට දෙමුහුම් කිරීමේ ප්‍රමාණය අගයනු ලැබේ. විද්‍යුත් ධරක ලකුණු කිරීමේ දී ලැබෙන ප්‍රධාන වාසිය නම් සමයුග්මකයන්ගෙන්( Homozygotes විෂමයුග්මකයින්(Heierozygotes ) හඳුනා ගැනීම පිළිබඳ හැකියාවයි.

2.6 <u>ඉස්සන් ගොවිපලවල් ආරම්භ කිරීම පිළිබඳව නාරා ආයතනය විසින් සපයනු ලද උපදෙස් සේවා :</u>

| දිනය. | සැපයූ සේවාවන් | සේවා ආයකයා |
|---|---|---|
| 1988 ජුනි | කළිස්සන් වගාව සඳහා වැඩබිම පරීක්ෂාව | -ගොඩිවින් ප්‍රනාන්දු සමාගම, 2/208 බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව,කොළඹ .7 |
| 1988.03.29 | පස විග්‍රහ කිරීම | -ඒ.එච්.එම්.විජේනායක මහතා ,28,කොළඹපාර, මීගමුව. |
| 1988.04.11 | පස් ජලය විග්‍රහ කිරම | -ඒ.නානායක්කාර මයා , පන්සල පාර,මීගමුව |
| 1988.04.25 | පස් විග්‍රහ කිරීම | -සී.ස.අලෙවිඋපදෙස් හා සේවා. |
| 1988.07.11 | ඉස්සන් ගොවිපල යඳහා ආඬිමුනේ උඩප්පුවෙහි වැඩබිම තක්සේරුකිරීම | -ආර්.එම්.රාමනාදන්, කොන්ට්‍රේන් වීදිය, උඩප්පුව. |
| | හලාවත ඉස්සන් සඳහා සුදුසු වැඩබිම | -ආර්.එම්.බර්ට්‍රම් ක්‍රිසෙඩ් ප්‍රනාන්දු හලාවත. |

1988.07.11 වයිරන් කට්ටුව ඉස්සන් වගාව
සඳහා වැඩ බිම තෝරා ගැනීම - ඩෙනිස් පෙරේරා

ආරච්චි කට්ටුවේ කුඹුටු කුලිය හි
ඉස්සන් වගාව පිළිබඳ තක්සේරුකිරීම - පැට්‍රික් ලාවේ.

198806.02 වයිරන් කට්ටුව, මුතුපන්ති, පංචිවිල්ලු
හා නවඩම්කුලම ඉස්සන් වගාව සඳහා
වැඩ බිම තෝරා ගැනීම - ( IREC )
අයිරෙක් ආයතනය.

1988.08.17 රාජකඩලුව ඉස්සන් ගොවිපල සඳහා
වැඩ බිම තෝරා ගැනීම - ලෙනාඩ් ද සිල්වා

1988.11.21 වයික්කාල ඉස්සන් ගොවිපල සඳහා
වැඩබිම තෝරා ගැනීම - පළඟතුර මෝල

ආරච්චිකට්ටුව ඉස්සන් ගොවිපල
සඳහා වැඩබිම තක්සේරු කිරීම - ඩබ්ලිව්.ඒ.ප්‍රනාන්දු

මදුරන්කුලියේ ඉස්සන් ගොවිපොල
වැඩබිම තෝරාගැනීම - ලක්ෂ්මන්ද අල්විස්.

1988.12.15 ආර්ටේමියා නිෂ්පාදනය ඉස්සන්
ගොවිපල සඳහා වැඩබිම් ව්‍යාපෘතිය
තක්සේරු කිරීම - බ්‍රිගේඩියර් ලෝරි ප්‍රනාන්දු

ආරච්චිකට්ටුව හා වයිරන් කට්ටුව
ඉස්සන් ගොවිපල සඳහා වැඩබිම
තක්සේරු කිරීම - ඩබ්ලිව්.නිමල්.ලාවේ

1988.10.03 ආරච්චි කට්ටුව හා සුරුවිල
ඉස්සන් ගොවිපල සඳහා වැඩබිම
තක්සේරු කිරීම - ජෝශප් ෆොන්සේකා

කල්පිටිය හා පල්ලිවස්තුරෙයි ඉස්සන්
ගොවිපල සඳහා වැඩබිම තක්සේරු
කිරීම. - අලිකාන්

## 3.0 පශ්චාත් පලදා - තාක්ෂණික ආයතනය:

### 3.1 පරමාර්ථ :

3 .1.1 - අස්වැන්නට පූර්ව අවධියේ දී පාඩු අඩුකර ගැනීම හා මසුන් ගොඩ බෑමේ දී, බෝට්ටුව තුළ දී, ගබඩා කිරීමේ දී හා බෙදාහරින විට දී වඩාත් හොඳින් මසුන් අතපත ගෑම මගින් මසුන් වල තත්ත්වය උසස්ව තබා ගැනීම.

3.1.2.- පාරම්පරික ධීවර නිෂ්පාදන වන කරවල හා උම්බලකඩ ආදිය සකස් සකස් කිරීමේ දී තාක්ෂණික තත්ත්වයන් දියුණු කිරීම හා ඒවායේ තත්ත්වය දියුණු කිරීම.

3.1.3 - කුණිස්සන් හා පොකිරිස්සන් වැනි මුහුදු අපනයනයන් වල තත්ත්ව ප්‍රමිතීන් දියුණු කිරීම.

3.1.4 - සකස් කිරීමේ නව තාක්ෂණික ක්‍රම මගින් මිනිස් පාරිභෝජනයට අලුත් නිෂ්පාදන සංවර්ධනය කිරීම.

3.1.5 - සත්වාහාර හා මත්ස්‍යාහාර සැකසීම

ආයතනය විසින් දැනට මෙම ක්ෂේත්‍රයන් පිළිබඳ පරීක්ෂණ පවත්වනු ලබන අතර එමගින් ලබා ගනු ලබන දැනුම ධීවරයින්ටත් වෙනත් මසුන් නිෂ්පාදන සකස් කරන්නන්ටත් සම්මන්ත්‍රණ හා වැඩ මුළු මගින් ප්‍රචලිත කරනු ලැබේ.

3.2. සේවක මණ්ඩලය:

පර්යේෂණ නිලධාරීන් 07 දෙනෙකුගෙන් සමන්විත ආයතනය ස්වකීය කාර්ය භාරයන් ඉටුකරනුයේ අධ්‍යක්ෂ වරයෙකුගේ ප්‍රධානත්වයෙනි. තව ද පර්යේෂණ සහකාරවරුන් 04 දෙනෙක් ද, විද්‍යාගාර සේවකයින් 04 දෙනෙකු ද් යතුරු ලේඛිකාවක් හා කම්කරුවන් 08 දෙනෙකු ද සේවක මණ්ඩලයට අයත්ය.

1986 හා 1987 වර්ෂවල පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා විද්‍යාත්මක නිලධාරීන් දෙදෙනෙකු රටින් බැහැරව යන ලද අතර ඔවුහු 1988 වසරේදී එහි සිටියහ. 1988 ඔක්තෝබර් මාසයේ දී තවත් නිලධාරියෙක් පශ්චාත් උපාධියක් හැදෑරීමට එක්සත් රාජධානියට ගියේය.

අතියට් විද්‍යාත්මක නිලධාරියෙකු වූ ඇම්.ටී.වණ්කුලසූරිය මහතා අප්‍රේල් මාසයේ දී ආයතනයෙන් අස්වී ගිය අතර කම්කරු වරියකව සිටි කේ.පී.ශ්‍රියාලතා මෙනෙවිය උපස්ථායක තනතුර සඳහා උසස් කරන ලදී. ක්ෂේත්‍ර සහකරුවකු අතියම් පදනමක් මත බඳවා ගන්නා ලදී.

3.3 කාර්ය වැඩ සටහන හා ප්‍රගතිය.

3.3.1 ඇතිකරනු ලැබූ කුණිස්සන්ගේ විවිධ උෂ්ණත්වයන් මත ගොවිපලෙහි ගබඩා කාලය

මෙම ව්‍යාපෘතිය කලින් අධ්‍යයනය කරන ලද ක්ෂුද්‍ර ශාක ගොවිපල කුණිස්සන් පිළිබඳව ම වඩාත් පුළුල් වූවකි. මෙම අවුරුද්ද තුල කුණිස්සන්ගේ ගබඩාකාලය සෙල්සියස් අංශක 0(0^C) හා පරිසර උෂ්ණත්වයන් පිළිබඳ අධ්‍යයනය කරන ලදී. **Salmonella Parahaemolyticus** සහ **Esch Coli** යන වැදගත් ව්‍යාධිකරණ යින් කිහිපයක් පැවතීම නිසා ඝන තරක් වූ ක්ෂුද්‍ර ශාබ රටාවන් පිළිබඳව ද පරීක්ෂා කරන ලදී. මෙම අධ්‍යයනය අවසන්කොට පත්‍රිකාවක් ද සකස් කරන ලදී. පරිසර උෂ්ණත්වයේ දී ඉස්සන්ගේ මංචතුළ තබා ගැනීම පැය 12 - 15 ක් පමණ වූ අතර අයිස් දැමූ ඉස්සන් සති 2 ක් පමණ තබාගත හැකි බව පෙනී ගොස් ඇත.

3.3.2 වාණිජ්‍ය වැදගත් කමක් ඇති මසුන් ශීත ගබඩා ගත කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ බලයා ගබඩා කිරීම පිළිබඳව පරීක්ෂණය කරන ලදී බැඳුම් කාරකයක් හා ඔක්සි කෘත මර්දනය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනයේ කොටසක් වී දිස්නය පිළිබඳ පරීක්ෂණ මෙහෙයුම රටේ පැවැති අහිතකර වාතාවරණය නිසා නොකරන ලදී. එහෙත් බැඳුම් කාරකයන් හා ඔක්සිකෘත මර්දනය සම්බන්ධ පරීක්ෂණ අවසන් කොට වාර්තාවක් සූදානම් කිරීම පිණිස එම ප්‍රතිඵල විග්‍රහ කෙරෙමින් පවතී.

3.3.3 උම්බලකඩ.

කෘමි සතුන් බහුල ගබඩාවල උම්බලකඩ තැබීමේ දී කෘමීන් විසින් ඒවා කා දමන ආකාරය හා ස්වභාවය අගැයීම පිණිස විද්‍යාගාර මට්ටමින් අධ්‍යයනය කරන ලදී. උම්බලකඩවලට හා කරවල වලට **Lascodemsa Sirricorne** හා **Dernestos spp** යන කෘශක වර්ග දෙක වෙන් වශයෙන් හා කලවම් වශයෙන් ද යොදා පරීක්ෂා කරන ලදී. වර්ෂය අවසාන වනවිට මෙම අධ්‍යයනය අවසන් කොට වාර්තාවක් පිළිපල වෙමින් පවතී.

බලයා මසුන් බහුලව පවත්නා කාල වලදී හා වැසි සමයේ දී වේලා ගැනීමේ ක්‍රම රටාවන් හා උම්බලකඩ වල නියම මාංශ ජනක තත්වය ආරක්ෂාකර ගැනීම පිළිබඳ අධ්‍යයනය කරන ලදී. නියම මාංශජනක තත්ත්වයන් හීන වීමේ හේතුව මුල් අවස්ථාවේ දී වේලීමේ වේගය අඩුවීම නිසා සිදු වූවක් බැවින් මෙම පරීක්ෂණ කරන ලදී. රස හීනවීමේ හේතුව පුස් බැඳීම හා බැක්ටීරියා වර්ග හා ඒවායේ වර්ධනය බැව් පෙනීගොස් ඇත. ඇෆ්ලාටොක්සින් ( **Aflatoxin** ) නම් දිලීරයට භාජනය වීම ඉන් සමහරකි. වාර්තාව නිමවෙමින් පවතී.

නිවර්තන තත්ත්වයන් සහිත ගබඩා කිරීමේ දී ඉතා මඳ වශයෙන් දකින්නට ලැබෙන ( **Lassodermn Semicome** ) යනුවෙන් හඳුන්වනු ලබන පලිබෝධකයාගේ මූලික අවස්ථාව පිළිබඳ අධ්‍යයනය කර ඇත. මසුන් නිශ්පාදනවල මෙම පලිබෝධක වර්ග වැඩි වශයෙන් නැතත් එය උම්බලකඩ කා දමන්නක් බව පෙනී ගොස් ඇත. මෙම පලිබෝධකයා වියළි මසුන් ආහාර ගබඩාවල හා සිල්ලර වෙළඳ සැල්වල ඇති බව සොයා ගෙන ඇත.

ආනයනය කරන ලද උම්බලකඩවල මෙම පලිබෝධකයා නොතිබෙන බව මූලික පරීක්ෂණ වලින් පෙනී ගොස් ඇ.

3.3.4. බෙල්ලන් තුළ ව්‍යාධිජනක දිලීරයන් තිබීම.

1988 මාර්තු මාසයේ දී මෙම අධ්‍යයන කටයුතු ආරම්භ වී තවමත් කෙරී ගෙන යනු ලබයි. **Salmonella,vibrio ; Cholerae** සහ **V,Parahaemolytiem** යන ව්‍යාධිජනක යන් පිළිබඳව අධ්‍යයනයක් ද කරන ලදී. සාමාන්‍ය ක්ෂුද්‍රාශක රටාවන් ගැනද අධ්‍යයනය කරන ලදී. ජලයෙහි තත්ත්වයන් පිළිබඳව ද අධ්‍යයනය කරන ලදී.

19...

බෙල්ලන්ගේ සුදුසු ප්‍රමිතීන් සාදා ගැනීම පිණිස මෙම අධ්‍යයනය උපකාරවිය හැකි අතර බෙල්ලන් තුල ව්‍යාධිකරණයන්ගේ පැවැත්ම අගැයීම පිණිස වර්ෂයක් පාසා එම අධ්‍යයන කාර්යයන් කළ යුතුව ඇත.

3.4 අත්හදා බැලීමේ සේවා:

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ හා වෙනත් සේවා ආයකයින්ගේ ඉල්ලීම් මත ඉස්සන්, පොකිරිස්සන්, දැල්ලන් ආදී ශීත කළ මුහුදු ආහාර වර්ග 200 ක් පමණ අත්හදා බැලීම් වලට භාජනය කරන ලදී. ටින් කළ මසුන් වර්ග කිහිප යක් ද ශීත කළ හා තෙත මසුන් ද ඒවායෙහි තත්ත්වයන් පිළිබඳව පරීක්ෂා කරන ලදී.

ලං.ධී.සංස්ථාවේ ඉල්ලීම පරිදි මසුන් වලට ෆෝමලීන් මුසුකොට ඇද්දැයි සොයා බැලීම සඳහා සාම්පල ගණනාවක්ම පරීක්ෂාවට භාජනය කරන ලදී. තවද මත්ස්‍යාහාර සහ කුකුළුන්ගේ ආහාර ද පරීක්ෂාවට භාජනය කරන ලදී.

3.5 වෙනත් ඒජන්සි ආයතන සමග නිම කිරීමට භාරගත් ව්‍යාපෘති:

1. ශ්‍රී ලංකාවේ මුහුදු පැලෑටි කර්මාන්තය.නොවැම්බර් මාසයේ දී ව්‍යාපෘති කටයුතු ආරම්භ විය. පසු බිම් තොරතුරු රැස්කිරීම ලේඛණගත තොරතුරු සමීක්ෂණ කොට සම්පාදනය කිරීම හා ග්‍රන්ථකරණය කිරීම ද අවසන් කොට ඇත. ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු රැස්කොට ඇත. 1989 පෙබරවාරි මස වන විට වාර්තාව නිමවනු ඇත.

2. මෙම ව්‍යාපෘති කටයුතු 1988 නොවැම්බර් මාසයේ දී ආරම්භ කරන ලදී. දිවයිනේ බටහිර වෙරළේ පුළුල් ලෙස ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු කරන ලදී. දකුණු හා වයඹ වෙරළබඩ ප්‍රදේශවලට මෙම සමීක්ෂණ කටයුතු ඉක්මනින්ම ව්‍යාප්ත කරනු ඇත.

4.0 ඉංජිනේරු තාක්ෂණික ඒකකය:

4.1 පරමාර්ථ:

4.1.1 **TCP/SRL/6653** යටතේ එන්.ඩබ්ලිව්.35 ධීවර සම්පත් සමීක්ෂණ යාත්‍රාව මගින් මසුන් ඇල්ලීමේ මෙහෙයුම් පරීක්ෂණ පැවැත්වේ.

4.1.2 ශ්‍රී ලංකාවේ යාත්‍රා සහ ධීවර ආම්පන්න පිළිබඳ දත්ත රැස්කොට ලේඛන ගත කිරීම.

20 ....

4.2 සේවක මණ්ඩලය.

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 02 |
| පර්යේෂණ සහකාරවරුන් | 02 |
| විද්‍යාගාර සහකාරවරුන් | 01 |

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල සමීක්ෂණ ඒකකට පස් දෙනෙකුගෙන් සමන්විතවිය. පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු,පර්යේෂණ සහකාරවරුන් දෙදෙනෙකු හා විද්‍යාගාර සහකාර වරයෙකු ද වශයෙනි.
එක්සත් රාජධානියේ ශිෂ්‍යත්වයක් සඳහා ගොස් සිටින කේ.ටී.වීරසූරිය මහතා පෙරළා පැමිණෙන තෙක් පර්යේෂණ නිලධාරී ඇස්.ඇල්.සුරවීර මහතා සේවා හා මෙහෙයුම් අංශයට මාරු කරන ලද අතර III ශ්‍රේණියට උසස් වීමක් ද පිරිනමා ඇත. එම අංශයේ සම්බන්ධීකරණ කටයුතු පිළිබඳ වගකීම ඔහුට පවරා ඇත. විද්‍යාගාර සහකරු ඩබ්ලිව්.ජී.සිරිසේන මහතා I ශ්‍රේණියට උසස් කරනු ලැබීය.

4.3. කාර්ය වැඩ සටහන හා ප්‍රගතිය.

4.3.1 මෙය නාරා ආයතනය මගින් මුදල් යෙදූ ව්‍යාපෘතියකි.

4.3.1.1 ධීවර ආම්පන්න හා යාත්‍රා ඉන්වෙන්ට්‍රි ගත කිරීම.

1988 දී ඕ.සී.පී. ටූනා සම්පත් සමීක්ෂණ ව්‍යාපෘතියේ වැඩවල යෙදී සිටි නිසාත්,මෙම ව්‍යාපෘතියේ සැලකිය යුතු වැඩ කොටසක් සේවක සංඛ්‍යාව සීමා වූ නිසා නිම කිරීමට අපහසුවිය. කෙසේවුව කල්පිටිය සිට මීගමුව දක්වා සියලුම ගොඩ බෑසීමේ ස්ථාන පිළිබඳ සමීක්ෂණ අවසන් කරන ලදී.

4.3.2 විදේශ මුදල් යෙදවූ ව්‍යාපෘති.

4.3.2.1 ටූනා සම්පත් සමීක්ෂණ ව්‍යාපෘතිය ටීසීපී/එස්ආර්එල්/6653.

1987 ජනවාරියේ දී බෙන්ගාල බොක්ක ව්‍යාපෘතිය මගින් මුදල් හා තාක්ෂණික සහාය යොදවනු ලැබ නාරා ආයතනය විසින් විධායක තත්ත්වය දරා "ගවේෂී ටූනා ධීවර ව්‍යාපෘති" යේ වැඩ කටයුතු 1988 දෙසැම්බර් මස දී අවසන් කරන ලදී.පසුගිය අවුරුදු දෙකක කාලය තුල මෙම අංශය විසින් මේ යාත්‍රාවේ මෙහෙයුම් ඉතා සාර්ථක ලෙස කරන ලද අතර මුහුදු චාරිකා 74 ක් මගින් ගවේෂණාත්මක මසුන් ඇල්ලීමේ පරීක්ෂණ නිම කර ඇත. ටූනා ධීවර කර්මාන්තය පිළිබඳ ඉතා වටිනා තොරතුරු රැසක් එක්රැස්කොට ඇති අතර ඒවා විග්‍රහයන්ට භාජනය කොට ඇත 1989 පෙබරවාරි මාසයේ දී මාලදිවයිනේ පවත්වනු ලබන රැස්වීමට අවසාන සමාලෝචන කටයුතු සඳහා ඒවා ඉදිරිපත් කරනු ඇත.

ව්‍යාපෘති කාලසීමාව තුල පර්යේෂණ සහකාර වරයෙකුගේ සම්පූර්ණ සේවා කාලය යොදවා මෙම අංශයේ සම්බන්ධීකරණ මෙහෙයුම් කටයුතු කරන ලද අතර ඊට අවශ්‍ය වූ වැඩ සඳහා තවත් පර්යේෂණ සහකාර වරයෙකුගේ සහ විද්‍යාගාර සහකරුවෙකුගේ සේවය ලබා දෙන ලදී. කලින් පිළියල කරන ලද වැඩ කාල සටහනක් අනුව අංශයේ සියලුම සේවක පිරිස් දින 05-06 දක්වා වූ මුහුදු ගමන් වලට වරින් වර සහභාගී වූහ.

4.3.2.2. ස්වයං මුදල් යෙදවීමෙන් ව්‍යාප්ත කරනු ලැබූ ටූනා සම්පත් සමීක්ෂණ ව්‍යාපෘතිය.

ටීසීපී/එස්ආර්එල්/6653 ව්‍යාපෘතිය යටතේ 1987/88 කාලය තුළ ඉහත සඳහන් කළ ආකාරයට ටූනා සම්පත් පිළිබඳ ඉතා වටිනා තොරතුරු එකතු කරනු ලැබීය. කෙසේ වුව ඇත මුහුදේ ධීවර කර්මාන්තය සතුටුදායක මට්ටමකට දියුණු කරවීමට අපට ඇති දැනුම තවමත් අඩු පාඩු සහිත එකකි.

එබැවින් 1989 වසරේ දී මෙම එන්.ඩබ්ලිව්.35 යාත්‍රාව තවදුරටත් පර්යේෂණ කටයුතු වල යෙදවීමට යෝජනා කර ඇති අතර පාලකයින්ටත්, ධීවර කර්මාන්ත යෙහි යෙදී සිටින සමාගම් වලටත් ධීවරයින්ටත් අතිශය වැදගත් වන්නාවූ එම දැනුම සපුරා ගැනීමට අදහස් කර ඇත.

පසුගිය වසරේ අවසානය වන විට මෙ මඟින් ඇල්ලූ මසුන් විකිණීමෙන් ලැබුණු රු.9,00,000/= ක ආදායම සේවකයින්ගේ යැපීම් දීමනා, අතිකාල හා ගමන් වියදම් හැර මෙම ව්‍යාපෘතිය පවත්වාගෙන යාම පිළිබඳ වියදම් හා අතිකුත් බැරපැන සඳහා යොදවනු ඇත.

මෙම ව්‍යාපෘතිය ධීවර අමාත්‍යාංශය හා නාරා ආයතනය ද විසින් අනුමත කොට ඇත. එන්.ඩබ්ලිව්.35 යාත්‍රාවේ වාර්ෂික අලුත්වැඩියා කටයුතු මීගමුවේ දී කරනු ලැබූ අතර මී ලඟ මෙහෙයුම් කටයුතු 1989 ජනවාරි 12 දින ආරම්භ කිරීමට නියමිතව ඇත.

4.5 සැලසු සේවාවන්.

(අ) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයට සහායවීම.

(ආ) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අඩු.65 ඒකාබද්ධ යාත්‍රාවල නිරීක්ෂණ චාරිකාවලට සහාය වීම.

5.0 සමුද්‍ර විද්‍යා අංශය.

5.1. පරමාර්ථ

5.1.1 ශ්‍රී ලංකා බල ප්‍රදේශයන්ට අයත් මහා සමුද්‍රීය උරුමය රට වැසියාට ප්‍රයෝජනවත් වන ලෙස ක්‍රමවත්ව ගවේෂණ කිරීම මගින් සන්තාපය කොට පාලනය කිරීම.

5.1.2 ශ්‍රී ලංකාවේ මහාද්වීප ආන්තිකයේ පිහිටීම පිළිබඳ වැඩි අවබෝධයක් ලබාගැනීම හා මුහුදු භූ විද්‍යාව පිළිබඳ දැනීම වැඩි කරගැනීම සඳහා මහාද්වීප ආන්තිකයේ පවතින භූ සෑකැස්ම අධ්‍යයනය කිරීම හා මුහුදු තීරයේ ස්වභාවය හා මහා ද්වීප ආන්තිකයේ පතුළ පිළිබඳ අධ්‍යයනය කිරීම

22 ....

ප්‍රධාන පර්යේෂණ කටයුතු පහත සඳහන් පරිදි වේ :-

(අ) රූපාකාරය ද ඇතුළුව මහාද්වීප ආන්තිකයේ මුහුදු භූ විද්‍යාව පිළිබඳ අධ්‍යයනය හා භෞතික ලක්ෂණයන්, ඛනිජ විද්‍යාව හා මුහුදු තීරුවෙහි ඇති මඩ්වල රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීම.

මුහුදු බිම සාම්පල හා ක්‍රමානුකූලව සිතියම් කිරීම මෙම පර්යේෂණයේ සැලකිල්ල වන අතර ලබා ගත් මඩ් විග්‍රහකොට ඒවායේ රසායනික හා ඛනිජ විද්‍යාත්මක සංයෝග අධ්‍යයනය ද වේ.

(ආ) තණිකාණු හෑ කම්පන පැතිකඩ කිරීමේ මාර්ගයෙන් බෑවුම් ව්‍යුහය හා මහා ද්වීපික රාක්ක පිළිබඳ අධ්‍යයනය කිරීම.
මහාද්වීප ආන්තිකයේ උප මුහුණත සිතියම් කිරීමට අධිබල විභේදන භූ කම්පන ප්‍රළිඟු හා බාධක භාවිතා කරනු ලැබේ. ප්‍රදේශයේ ව්‍යුහය සබ්මැරීන් කැනියොන් වැළලෙන ලද ගංගා කාණු, මඩ්වල ඝනකම ආදිය මෙම අධ්‍යයනයන්ගේ මාර්ගයෙන් ලබා ගනී.

(ඇ) මඩ් ගැසීමේ ක්‍රියාවලිය.

මුහුදු ජලය ඇතුළු පස් මඩ්වල විද්‍යා මානවන දේ පිළිබඳ අධ්‍යයනය කරන ලදී.
මෙම පර්යේෂණයන්හිලා අපගේ ප්‍රධාන අරමුණ වන්නේ වෙරළාසන්නයේ සිට ගසාගෙන යන මඩ් හා එම මඩ් ගැඹුරු මුහුදු පත්ලට ප්‍රවාහනය කරන මං යාන්ත්‍රික තත්ත්වය පිළිබඳ වත් අධ්‍යයනය කිරීමය.

(ඈ) මුහුදු ඛනිජ සම්පත් භූ විද්‍යාත්මකව තැන්පත් වන ආකාරය පරීක්ෂාකිරීම.

භූ විද්‍යාත්මකව තැන්පත් වන්නාවූත්, තැන්පත්වන ඛනිජ ද්‍රව්‍ය, ගොඩනැගිලි ද්‍රව්‍ය, රාක්කවල කාබනේට් වැලි සහ බෑවුමේ ඇති දිළිසෙන ද්‍රව්‍ය සෑදීමේ ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණ වැඩ සටහනෙන් බලාපොරොත්තු වේ.

(ඉ) අන්තර් ජාතික ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහනට සහභාගී වීම.

සමුද්‍රය විදීමේ ව්‍යාපෘතිය (ඕඩීපී) සහ ශ්‍රී ලංකාවේ දකුණු මහාද්වීප ආන්තිකය සමීක්ෂණය කිරීමේ නාරා ආයතනය සහ ස්ක්‍රිප්ස් ඉන්ස්ටිටියුෂන් ඔෆ් ඕෂනෝග්‍රැපි නම් වූ බද්ධ සමීක්ෂණ වැඩ පිළිවෙල මගින් කරනු ලබන සමුපකාර පර්යේෂණ වැඩසටහනට අපද සහභාගී වීම මෙම පර්යේෂණ වැඩ සටහනට අයත් වන්නේය.

5.2. සේවක මණ්ඩලය

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 04 |
| පර්යේෂණ සහකාරවරුන් | 02 |
| විද්‍යාගාර සහකාරවරුන් | 01 |
| සැම්පල් කරුවන් | 01 |
| කම්කරුවන් | 01 |

23 ....

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ මෙම අංශයේ සේවක මණ්ඩලයට පර්යේෂණ නිලධාරීන් 04 දෙනෙකු ද පර්යේෂණ සහකාරවරුන් 02 නෙකු ද විද්‍යාගාර සහකරුවන් එක් අයෙකු ද සාම්පල කරුවෙකු හා කම්කරුවෙකු ද ඇතුලත් වූහ.

එක් පර්යේෂණ පර්යේෂණ නිලධාරියකු අයිඕඑම්ඒසී ( IOMAC )ලේකම් කාර්යාලයේ සේවය සඳහා ද්විතීයතය පදනමක් මත ගොස් ඇත. තවත් පර්යේෂණ නිලධාරියෙකු එක්සත් රාජධානියේ ආචාර්ය උපාධිය සඳහා ලියාපදිංචි වීමට ගොස් ඔක්තෝබරයේ දී ආපසු පැමිණ ඇත.
පර්යේෂණ නිලධාරී ආචාර්ය ශාන්ති වික්‍රමරත්න II වැනි ශ්‍රේණියට උසස්වීමක් ලබා මෙම අංශයේ ප්‍රධානියා හැටියට පත්කොට ඇත. සාම්පල් කරු පාලිත වික්‍රමසිංහ මහතා ඔහුගේ තනතුරෙහි ස්ථිර කරනු ලැබීය.

5.3 කාර්ය වැඩසටහන හා ප්‍රගතිය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පහත සඳහන් කටයුතු නිමකිරීම සඳහා භාරගෙන තිබිණ.

5.3.1 1988 වර්ෂයේ සමුද්‍ර විද්‍යා මුහුදු ගමන් වැඩසටහන යටතේ භූ විද්‍යාත්මක සමුද්‍ර විද්‍යා පිළිබඳව දින 40 ක් ද ජීව විද්‍යාත්මක සමුද්‍ර විද්‍යා ව පිළිබඳදින 15 ක් ද එකතුව දින 55 ක් මුහුදු චාරිකා මෙහෙයවන ලදී. කලින් යොදාගත් පරිදි අලුත් උපකරණ අත්හදා බැලීමේ චාරිකා දෙකක් ද සමුද්‍ර විද්‍යා චාරිකා 6 ක් ද ඇතුළුව භූ විද්‍යාත්මක සමුද්‍ර විද්‍යා වැඩසටහනක් සාර්ථකව නිම කරන ලදී.
(නාවුක දින 37 කි), නියමිත උපකරණ මිලයට ගැනීමේ ප්‍රමාදය හා යුඑන්ඩීපී දෙවන අදියර ව්‍යාපෘතියේ ආරම්භ කිරීමේ දී ඇති වූ ප්‍රමාදය ද හේතුවෙන් බෑවුම් ස්ථාවරය පිළිබඳ අධ්‍යයනය කිරීම නොකරන ලදී.

5.3.2 ධීවර සිතියම් සටහන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ වෙන්නප්පුව ප්‍රදේශය දෙවැනි ධීවර සිතියම් සටහන නිමකිරීමත් සමගම ප්‍රගතියක් පෙන්නුම්කරන කරන ලදී. ජලප්‍රවාහනය, වඩදිය, කාලගුණය ආදී තොරතුරු ලබාගෙන පතුලේ මඩ් සහ රූපාකාරය පිළිබඳ දත්ත ද සිතියම් සටහන්වල පෙන්වා ඇත. ධීවරයින් විසින් මෙම සිතියම් සටහන්තාක්ෂණික වශයෙන් වටහා ගැනීම් ගැටළුවලට පිළියමක් වශයෙන් ධීවරයින් විසින් මුහුදේ ඈත සිට ඇසින් දැකිය හැකි ගොඩබිමේ සංඥා ලකුණු ද මෙම සිතියමේ සටහන්වල පෙන්වා ඇත.
නාරා ආයතනයේ ඉංජිනේරු හා තාක්ෂණික විද්‍යා අංශයේ ද සහයෝගිතාවය ඇතිව ධීවරයින් විසින් භාවිතා කරනු ලබන වට්නා දැල් ආම්පන්න බියකින් තොරව ප්‍රයෝජනයට ගැනීමට වඩාත් උචිත ඒ ඒ මසුන් ඇල්ලීමේ ස්ථාන හා දැල් ආම්පන්න කවරේදැයි මෙම සිතියම් සටහන් වල හඳුන්වා දී ඇත.

5.3.3 ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගංගාවල මඩ් සහ ඒවායේ ප්‍රභවය පිළිබඳ ව්‍යාපෘතිය යටතේ කළු ගඟ බේසමේ කුඩා ඇට ප්‍රමාණයේ පරාමිති සඳහා මඩ් සාම්පල 200 ක් පමණ විග්‍රහ කොට සීඝ්‍ර ප්‍රගතියක් පෙන්වීය.

5.3.4 ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ ඉල්ලීමක් අනුව පුරානවැ ල්ල රළවේග වැටියේ ඉදිකිරීම පිළිබඳ තත්ත්වය හා ඒ සඳහා යොදාගන්නා ලද ද්‍රව්‍යවල තත්ත්වය නිගමනය කිරීමට සමීක්ෂණයක් පවත්වා වාර්තාවක් සපයන ලදී.

5.3.5 විජයානන්ද මහතා ආපසු පැමිණ සිටින නමුත් දිවයිනේ පැවැති කලබල තත්ත්වය හේතුවෙන් හිරිගල් හා බෙලිකටු තට්ටුව පිළිබඳ ව්‍යාපෘතියේ වැඩකටයුතු නොකෙරිණ.

5.3.6 ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ මහාද්වීපික මංචයේ මඩිවල නොගැඹුරු ජල කාබොනේට් /පැසිය හා /පැසි ආකෘති පිළිබඳ අධ්‍යයනයක් කලින් යොදා ගත් ආකාරයටම අවසන් කරන ලදී. ආවරණය වූ ප්‍රදේශ නම් කල්පිටිය සිට මීගමුව දක්වාය.
මෙම අධ්‍යයනයෙන් ලබාගත් ප්‍රතිඵල අනුව මෙම ප්‍රදේශවල නොගැඹුරු ජල කාබොනේට් /පැසි හතරක් අඩංගුබව පෙන්නුම් කෙරිණ. මෙහිදී කැපී පෙණුනු ලක්ෂණයක් නම් නීතල වාසී වර්ගයන් ඉතා බහුල ලෙස සිටීමත් ප්ලවාංගී වර්ගයන් ඉතා අඩු ප්‍රමාණයක් සිටීමත්ය.
මෙම අධ්‍යයනයේ දී සඳහන් කළ හැකි තවත් දෙයක් නම් තට්ටු ආන්තික පරවල පූර්වක්‍රමණය හා තැවත මඩි ගැසීමේ ක්‍රියාවලිය /පැසි අනුක්‍රමය නිගමනය කිරීමේ ප්‍රධාන කර්තව්‍යයන්ය.

5.3.7 විජයානන්ද මහතා ලන්ඩන් නුවර ඉම්පීරියල් විද්‍යාලයේ වර්ෂයක පශ්චාත් උපාධි පරීක්ෂණයක් අවසන් කොට 1988 ඔක්තෝබර් මස 15 දින ශ්‍රී ලංකාවට පැමිණියේය. මෙම ව්‍යාපෘතිය යටතේ නැගෙනහිර ඉන්දියන් සාගරයෙන් ලබාගත් සාම්පල 500 කට වැඩි ප්‍රමාණයක් ඔහු විසින් රසායනිකව විග්‍රහකොට මූලද්‍රව්‍ය 18 ක් සඳහා මඩි බෙදාහැරීමේ සිතියම් සටහන් සකස් කරන ලදී.
ඉම්පීරියල් විද්‍යාලයේ 1989/90 කාලය තුල පර්යේෂණ කටයුතු සඳහා විජයානන්ද මහතා විසින් පසුගිය මාස නව තුල ශ්‍රී ලංකාවේ මහද්වීපික මංච හා බෑවුම් වලින් මුහුදු පාත්ති මඩි සාම්පල රැස් කර ගන්නා ලදී.

5.3.8 කල්පිටිය සිට ගාල්ල දක්වා වූ ප්‍රදේශ ආවරණය කොට කලින් මුහුදු චාරිකා වලින් රැස්කරගත් දත්ත ශ්‍රී ලංකාවේ සම්පූර්ණ බටහිර මහා ද්වීපික මංච සඳහා තනි රූප සටහන් වලට ඒක රාශි කොට ඇත.

අ. ශ්‍රී ලංකාවේ බටහිර මහා ද්වීපික මංචයේ මඩිවල ඇට ප්‍රමාණයේ මධ්‍යක බෙදා හැරීම.

ආ. ශ්‍රී ලංකාවේ බටහිර මහාද්වීපික මංචයේ මඩි තෝරා වෙන් කොට බෙදා හැරීම.

ඇ. ශ්‍රී ලංකාවේ බටහිර මහාද්වීපික මංචයේ මඩිවල ඇලවීමේ ගතිය බෙදා හැරීම.

ඈ. ශ්‍රී ලංකාවේ බටහිර මහා ද්වීපික මංචයේ පතුළේ ඇති මඩි බෙදාහැරීම

ඉ. ශ්‍රී ලංකාවේ බටහිර මහා ද්වීපික මංචයේ මංඩිවල බර ඛනිජ කොටස් බෙදා හැරීම.

ඊ. ශ්‍රී ලංකාවේ බටහිර මහාද්වීපික මංචයේ මංඩිවල කාබොනේට් බෙදා හැරීම.

උ. ශ්‍රී ලංකාවේ බටහිර මහා ද්වීපික මංචයේ මංඩිවල ප්‍රාණෝද්භිය කොටස් බෙදා හැරීම.

ඌ. ශ්‍රී ලංකාවේ බටහිර මහා ද්වීපික මංචයේ මංඩිවල ඇරගොනියට් සහ අඩු හා අධි මැග්නේසියම් කැල්සයිට් බෙදාහැරීම.

ඍ. ශ්‍රී ලංකාවේ බටහිර මහා ද්වීපික මංචයේ මංඩිවල සොයා ගැනීමේ ද්‍රව්‍ය මූලයන් බෙදා හැරීම.

5.3.9 සමුද්‍ර මාරු යාත්‍රාවේ මුහුදු චාරිකාවේ දී භූ කම්පන පැතිකඩ කිරීම් මගින් ලබාගත් සාම්පල අධ්‍යයනය කරනු ලැබූ අතර කාබොනේට් ද්‍රව්‍ය වල හා ගෙලා-කොනයිට් වල අඩංගු ද පිළිබඳව අස්ථිර තක්සේරුවක් නිගමනය කරනු වස් ඒවායේ සනත්වය ගණන් බලන ලදී. මෙම ගණන් බැලීමේ දී එක් මීටර ගැඹුරක 75% කටත් වැඩි කැල්සියම් කාබොනේට් සහිත කාබොනේට් ද්‍රව්‍ය ටොන් බිලියන 2 කට ආසන්න ප්‍රමාණයක් තිබෙන බව හෙළි වී ඇත.
තව ද පානදුරට ඔබ්බෙන් ඇති ගෙල්කොනයිට් ප්‍රමාණය ටොන් 36,000 ක් පමණ වේ.

5.3.10 සමුද්‍රමාරු යාත්‍රාවේ චාරිකා කාලය තුළ රැස්කළ පතුලේ රූපාකාරය පිළිබඳ දත්ත සමුද්‍රමාරු වාර්තාවට අමුණා ඇති අතර ඒවා පත්‍රිකා 3 කට ඇතුලත් කොට ප්‍රකාශයට පත් කිරීමට පිළියෙල කොට ඇත.

සැලසූ සේවාවන් :

ආචාර්ය වික්‍රමරත්න ස්වාභාවික සම්පත් පිළිබඳ නරේසා ආයතනයේ ක්‍රියාකාරී කමිටුවේ සේවය කරන ලදී. ඔහු 1988/90 කාල සීමාව සඳහා තෝරාගෙන ඇත.
පාකිස්තානයේ ඉස්ලාමාබාද් නුවර පැවැති මධ්‍යම ඉන්දියන් සාගරය සඳහාවූ අයිඕසී(IOC) ප්‍රාදේශීය කමිටුවේ පළමු ප්‍රාරම්භක රැස්වීමට මුහුදු භූ-විද්‍යාව පිළිබඳ විශේෂඥයකු ලෙස සහභාගී වීම සඳහා ආචාර්ය වික්‍රමරත්න මහතා ඇරයුම් ලැබ සේවය කරන ලදී.

පකිස්තානයේ කරච්චි නුවර පැවැති ඉන්දියන් සාගරයේ ඈත මුහුදේ බලාපොරොත්තුවිය හැකි ඛනිජ සම්පත් පිළිබඳ විශේෂඥයින් ගේ පළමු රැස්වීමට ආචාර්ය වික්‍රමරත්න සහ ඩියුප්‍රිප් ජයවර්ධන මහතා ද විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

1988 නොවැම්බරයේ දී පවත්වන ලද ජීවත් නොවන සම්පත් පිළිබඳ අයිඕඑම්ඒසී(IOMAC ) 3 වැනි නිත්‍ය කාරක සභාවට උපදේශකවරුන් වශයෙන් ආචාර්ය ගාමිණී රණතුංග, ආචාර්ය ඇස්.වික්‍රමරත්න හා ඇන්.පී. විජයානන්ද මහතා ද ශ්‍රී ලංකාව නියෝජනය කළහ.

26 ....

මලයාසියාවේ ක්වාලාලම්පූර් නුවර පැවැති මුහුදු සම්පත් කළමනාකරණය පිළිබඳ ( IOMAC -IOC ) පුහුණු වැඩසටහනට බාහිර දේශකයකු වශයෙන් ආචාර්ය එස්.වික්‍රමරත්න සේවය කරන ලදී.

ආචාර්ය එස්.වික්‍රමරත්න මහතා චීනයේ ප්‍රසිද්ධ කරනු ලබන වෙරළ සම්පත් සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ සඟරාව සඳහා වූ අන්තර් ජාතික කර්තෘ මණ්ඩලයේ සේවය කරන ලදී.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ ඉල්ලීමක් අනුව මෙම අංශය ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය විසින් පුරාන වැල්ල ධීවර වරාය වඩදිය බැම්ම පරීක්ෂාකර බලා වාර්තා දෙකක් ඉදිරිපත් කරන ලදී.

ධීවර අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව ගුවන් විදුලි නිලධාරීන් 6 දෙනෙකු සඳහා එක් සතියක කෙටි පුහුණු වැඩ සටහනක් මෙම අංශය විසින් සලසන ලදී.

ධීවර අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව අමාත්‍යාංශය විසින් කරගෙන යනු ලබන ගුවන් හා මුහුදු මුදවා ගැනීමේ මෙහෙයුම් සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් මෙම අංශය විසින් සපයනු ලැබේ.

නරේසා ආයතනයේ ආධාර යටතේ පර්යේෂණ සහකාරවරයෙකු හා විශ්ව විද්‍යාල පුහුණු වන්නන් දෙදෙනෙකු එක්ස්රේ ඩිෆ්‍රැක්ටොමීටර් ( X-Ray diffractometer ) විග්‍රහ කිරීමේ ක්‍රමයට හඳුන්වා දෙනු ලැබීය. යූඑන්ඩීපී මගින් අප විසින් ලබා ගන්නා ලද ෆ්‍රෑන්ක් අයිසෝ ඩයිනමික් සෙපරේටරය( Frank Iso Dynamic Separater ) ක්‍රියාකාරී කරවන ලදී.

## 6.0 ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය.

### 6.1 පරමාර්ථ

ශ්‍රී ලංකාවේ ජලමාන සමීක්ෂණ හා සටහන් කිරීමේ මූලික වගකීම ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයට පැවරී ඇත. ශ්‍රී ලංකාවේ තනි ආර්ථික කලාපයට අයත් වන ඇත මුහුදේ ජාතික සමුද්‍ර තීරුව දක්වා සහ අසල ද දිවයින ඇතුළත මුහුදේ ජල ස්ථාන වල ද සිවිස්තරාත්මක ජල ශාස්ත්‍රීය සමීක්ෂණ මෙහෙයවීම මෙම කාර්යාලයේ ප්‍රධාන වගකීම වන්නේය. තව ද මෙම සමීක්ෂණ වල ප්‍රතිඵල සම්බන්ධව සාධාරණ සටහන් පිළියෙල කිරීම, ජලතරණ සටහන් පිළියෙල කිරීම සහ වෙනත් ලියවිලි පිළියෙල කිරීම ද එහි වගකීම වේ.

6.1.1 කාර්යාලයේ ප්‍රධාන කාර්ය භාරයන් නම් පහත සඳහන් දේ ඉදිරිපත් කිරීමය.

අ. ශ්‍රී ලංකාවේ තනි ආර්ථික කලාපයට අයත් දේශීය ආධාරක රේඛාව සිට පිටත සීමාව දක්වා ජල තරණ සටහන් තැබීම.

ආ. ජාතික ජල වඩදිය සටහන්.

ඇ. ජාතික ජල සම වඩදිය සටහන්.

ඈ. මුහුදු කරුවන්ට දැන්වීම් සම්පාදනය කිරීම හා නිකුත් කිරීම.

ඉ. ආලෝක ලේඛණය පිළියෙල කිරීම හා නිකුත් කිරීම.

ඊ. ඉහත සඳහන් ලියවිලි නොකඩවා පවත්වා ගැනීම.

6.2 සේවක මණ්ඩලය.

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 05 |
| ජලමාන මිනින්දෝරු | 01 |
| ගොඩබිම මිනින්දෝරු | 02 |
| සැලසුම්කරු | 02 |
| සමීක්ෂණ වාර්තා තබන්නන් | 02 |
| යතුරු ලේඛකයින් | 01 |
| සමීක්ෂණ සහකාර | 04 |
| කාර්යාල කාර්ය සහකාර | 01 |
| සිතියම් ඇඳීමේ උපදේශක | 01 |
| ජලමාන විශේෂඥ | 01 |

1988 වර්ෂයේ ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලයේ කාර්ය මණ්ඩලය උපදේශකයකු, සිතියම් ඇඳීමේ උපදේශකයකු, විශේෂඥ ජලමානක, සමීක්ෂණ භාර සිවිල් දෙනෙකු, ජලමානක මිනින්දෝරුවකු, සමීක්ෂණ වාර්තා තබන්නන් දෙදෙනෙකු, සමීක්ෂණ සහකාර වරුන් සිව් දෙනෙකු, යතුරු ලේඛකයකු හා කාර්යාල කාර්ය සහායකුගෙන් ද සමන්විත විය.

1988 ජූලි මාසයේ දී උපදේශක නිමල් ඇස්.විජේසිංහ මහතා ස්වකීය කොන්ත්‍රාත් කාල සීමාව නිම කොට විදේශගත විය. ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය ශක්තිමත් කරවීම උදෙසා, මෙම ව්‍යාපෘතියට GMBH හි හැම්බර්ග් වරායේ උපදේශකයකු වූ විශේෂඥ ජලමානක මයිකල් ගෲබර් ( **Michael Gruber** ) මූලික වශයෙන් අවුරුදු දෙකක උපදේශයකු වශයෙන් සැප්තැම්බරයේ දී පත්විය. මෙම ව්‍යාපෘතිය හැම්බර්ග් වරාය උපදේශක සමාගම (**Hamburg Port-Consulting GMBH** ) හා තාක්ෂණික සහයෝගිතාවය සඳහාවූ ජර්මානු ඒජන්සිය ද ( **German Agency for Technical Co-operation**) යන ආයතන දෙක සහභාගී වීමෙන් ශ්‍රී ලංකාවත් ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවත් අතර තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියකි.

ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලයේ ප්‍රධානියා හැටියට ආචාර්ය ශාන්ති වික්‍රමරත්න මහතා නොවැම්බර්මාසයේ දී පත් කෙරිණි. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ හිටපු සිතියම් නිශ්පාදක නිලධාරී වෝල්ටර් ගුණරත්න මහතා පෙබරවාරි සිට සිතියම් ඇඳීමේ උපදේශක වශයෙන් පත්විය. ඇස්.ඩබ්ලිව්. ඇස්.වීරසිංහ, ඇස්.විතාන හා ඇම්.ඒ.ආරියවංශ යන වැඩ භාර මිනින්දෝරු මහතුන් ඔවුන්ගේ පරිවාස කාලය අවසන් කරන ලද හෙයින් තනතුරුවල ස්ථිර කරනු ලැබීය.

යතුරු ලේඛිකා ඇම්.ඩී.සී.ජයන්ති මෙනෙවිය හා සැලසුම්කරු පී.බී. රත්නපාල මහතා ද සිය තනතුරුවල ස්ථිර කරන ලදී.

6.3 කාර්ය වැඩ සටහන හා ප්‍රගතිය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ පහත සඳහන් කාර්ය භාරයන් මෙම අංශය විසින් ඉටුකරනු ලැබීය.

6.3.1. උණවටුන බොක්කේ කොරල් පර පිළිබඳ සමීක්ෂණ

නාරා ආයතනයේ කොරල් අංශයේ ඉල්ලීමක් අනුව උණවටුන බොක්කේ කොරල්පර පිළිබඳ සමීක්ෂණයක්කොට කොරල්පර පෙන්නුම් කරන සැලසුමක් පිළියෙල කිරීම සඳහා 1988 ජනවාරි 30 සිට දින 10 ක් සමීක්ෂණ කටයුතු වලට මිනින්දෝරුවන් දෙදෙනෙකු යොදවනු ලැබූහ.

6.3.2 නෝර්ටන් බ්‍රිජ්, කැනියොන් සහ ලක්ෂපාන යන ස්ථානවල ජල විදුලි ජලාශ පොකුණු සමීක්ෂණය:

නෝර්ටන් බ්‍රිජ්, කැනියොන් සහ ලක්ෂපාන ජලාශ පොකුණුවල ජල මට්ටම පාලනය කිරීමට අදාලව ගබඩා කළ හැකි ජල ධාරිතාව සොයා බලන ලෙස ලංකා විදුලි බල මණ්ඩලය විසින් කරන ලද ඉල්ලීමක් අනුව මෙම සමීක්ෂණය කරන ලදී. 1987 දී සමීක්ෂණ ආරම්භවුණු අතර 1988 දී ද දිගයම එම කටයුතු කරන ලදී.
මෙහි ක්ෂේත්‍ර වැඩ කටයුතු අදියර දෙකකින් යුක්තය.

අදියර I - පාලන ස්ථාන ආරම්භ කිරීම හා පොකුණු තුනේම හෑ ලක්ෂණයන් සමීක්ෂණය කිරීම

අදියර II. - පොකුණුවල පිරික්සුම් කටයුතු කිරීම.

සටහන් නිමාවට පත්කොට 1988 ඔක්තෝබර් 14 දින ලංකා විදුලි බල මණ්ඩලය වෙත භාරදෙන ලදී.

6.3.3 ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සඳහා ගල් පර්වත පුපුරුවා හැරීමේ සමීක්ෂණ.

1988 මාර්තු මාසයේ සිට තම්මුටගේ වරාය, රොත්තගෙවැල්ල හා උනාකුරුව යන ස්ථානවල සමීක්ෂණ කටයුතු කරන ලදී. කලින් යොදාගත් ආකාරයටම මිනින්දෝරුවන් දෙදෙනෙකු යොදවා අවශ්‍ය සටහන් පත් පිළියල කරන ලදී. පළමු සමීක්ෂණයදීහෙළි නොවූ ගල්පර අවහිරයක් ඇති ස්ථානවල ගැඹුර නිගමනය කිර බැලීමට දෙවැනි සමීක්ෂණයක් ද පවත්වනු ලැබීය.
දෙවෙනි සමීක්ෂණයේ වාර්තාව පිළිබඳ සැලසුම්පත් ධීවර අමාත්‍යාංශයට භාරදෙන ලදී. මෙම ස්ථානවලම ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සමග ද සාමූහිකව ගල්පර අවහිර ඉවත් කිරීමේ සමීක්ෂණයක් ඉදිරියේ දී කිරී නිම කිරීමට ඉතිරිව ඇත.

6.3.4 ගෝල්බක් ඉඩමේ ජලමාන සමීක්ෂණ කටයුතු.

නාරා ආයතනයේ සභාපතිගේ ඉල්ලීමක් අනුව කොළඹ කොටුවේ ගෝල්බක් ප්‍රදේශයේ වෙරළ ලක්ෂණ හා පතුළ හෑ ලක්ෂණ පෙන්නුම්කරන සටහන් සැලැස්මක් සඳහා ජල මාන සමීක්ෂණයක් කරන ලදී.

1988 පෙබරවාරි 24 දින සිට 1988 අප්‍රේල් 06 දින දක්වා කාලය තුල සමීක්ෂණ කටයුතුවල නියුතු වූ අතර ඉන්පසු සැලසුම් සටහන් නිම කරන ලදී.

6.3.5 කල්පිටියේ ඉතලයි හි ගොඩබිම සමීක්ෂණය.

නාරා ආයතනයේ ජලජීව වගා ඒකකයේ ඉල්ලීමක් අනුව 1988 මාර්තු මස දී කල්පිටියේ ඉතලයි හි ගොඩබිම සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයට භාජනය වූ ඉඩම ජල ජීවී වගා ඒකක ව්‍යාපෘතියක් සඳහා නාරා ආයතනයට පවරා ගැනීමට නියමිත වූවකි.

6.3.6 නුවර එළියේ ග්‍රෙගරි වැවේ ඉඩම සහ ජලමාන සමීක්ෂණය.

වැවේ සෝදිසි සිතියම් හා රේඛා සටහන් පිළියෙළ කරන ලදී. 1988 ජුනි 16 දා සමීක්ෂණ වැඩ අරඹන ලද අතර 1988 ජුලි 13 දින අවසන් කරන ලදී. 1988 නොවැම්බර් මාසයේ දී සිතියම් හා සැලැස්ම අවසන් කරන ලදී.

6.3.7 පුරාණ වැල්ල ධීවර වරාය සමීක්ෂණය.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ අධීක්ෂණය යටතේ සීමිසහිත කොන්ස්ට්‍රක්සන් ඇන්ඩ් ඩිවෙලොප්මන්ට් ඉංජියරිං විසින් ධීවර අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව පුරාණවැල්ල ධීවර වරාය සමීක්ෂණ කටයුතු 1988 මැයි 12 දින ආරම්භ කොට 1988 මැයි 27 දින අවසන් කළ අතර වඩදිය බැම්ම, හැඩය හා දැනට එහි තත්ත්වය පිළිබඳ සවිස්තර වාර්තාවක් සකස් කරන ලදී.

6.3.8 ත්‍රිකුණාමලයේ නාවික තටාකාංගනයේ ගොඩබිම සහ ජලමාන සමීක්ෂණ

ත්‍රිකුණාමල වරායෙහි තැනීමට අදහස්කොට ඇති නැව් තොට සම්බන්ධව ශ්‍රී ලංකා නාවුක හමුදාවේ ඉල්ලීමක් අනුව, නාවික තටාකාංගනය් හා ත්‍රිකුණාමල වරාය ප්‍රදේශයේ ගොඩබිම හා ජලමාන පුළුල් පරීක්ෂණයක් 1988 ජුනි 15 දින සිට 1988 ජුලි 22 දින දක්වා කාලය තුළ ජාතික ජලමාන කාර්යාලය මගින් මෙහෙයවන ලදී. 1988 අගෝස්තු මාසයේ දී සැලැස්මේ වැඩ අවසන් කරන ලද අතර සමීක්ෂණ යේ අනු පිටපතක් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

ඉන් අනතුරුව මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාලයේ ඉල්ලීමක් අනුව ජාතික ජලමාන කාර්යාලය විසින් 1988 සැප්තැම්බරයේ දී නාවික තටාකාංගනයේ ස්ථාන දෙකක දී ඉංජිනේරු සමීක්ෂණයක් පවත්වන ලද අතර 1988 ඔක්තෝබරයේ දී එහි සැලසුම් පත් අවසන් කොට ලංකා විදුලි බල මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

6.3.9 - මීගමු කලපුවේ සිතියම්.

සභාපතිතුමාගේ ඉල්ලීමක් අනුව මීගමු කලපුවේ හා අසබඩ ප්‍රදේශ පිළිබඳ සිතියමක් 1:10,000 ක පරිමාණයකින් හා සුදුසු පාට වලින් ද යුක්තව සකස් කරන ලදී.

6.3.10 මීගමු කලපුවේ ගොඩබිම හා ජලමාන සමීක්ෂණ.

ධීවර අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව මීගමු කලපුවේ රොන්මඩ ඇති ස්ථාන හා ජල ප්‍රවාහයේ රටාව නිගමනය කිරීම සඳහා ,ගොඩබිම හා ජලමාන සමීක්ෂණයක් කොට 1988 නොවැම්බර මස දී අවසන් කරන ලදී.

6.3.11 මීගමු කලපුවේ කඩොල්කැලේ ගොඩබිම සමීක්ෂණය:

නාරා ආයතනයේ සේවා හා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලීමක් අනුව නාරා ආයතනයට ඉඩමක් පවරා ගැනීම සඳහා කඩොල්කැලේ ගොඩ බිම සමීක්ෂණයක් කරන ලදී.
මෙම සමීක්ෂණයේ වැඩ අවසන් කොට සැලසුම් පත්‍ර 1988 දෙසැම්බර් මස දී සකස් කරන ලදී.

6.3.12 සාගර විද්‍යා ඒකකයට ජල තරණ උපකාර :

(I) ජලමාන ඒකකයට යාත්‍රා කිරීමේ උපකාර සැලසීම වශයෙන් සමුද්‍ර මාරු යාත්‍රාවේ අංක. එස්එම් 18,එස්එම් 19,එස්එම්20,එස්එම්21, ,එස්එම්22 හා එස්එම් 23 දරණ මුහුදු චාරිකා සඳහා ජාතික ජලමාන කාර්යාලයේ මිනින්දෝරු මහතුන් යොදවනු ලැබීය.

(II) ජලමාන ඒකකය විසින් කල්පිය සහ උඩප්පුව අතර ප්‍රදේශයේ මුහුදු තීරයේ සාම්පල් කිරීමට 1988 පෙබරවාරි 24 සිට 28 දක්වා පැවැති සමීක්ෂණ කටයුතුවල පිහිටුම් සවිකිරීම් වැඩ සඳහා ආධාර වශයෙන් ජාතික ජලමාන කාර්යාලයේ මිනින්දෝරුවකුගේ සේවය ලබා දෙන ලදී.

(III) ශ්‍රී ලංකා නාවුක හමුදාවේ ඉල්ලීමක් අනුව පුත්තලමේ කලපුවේ ඇල සමීක්ෂණයේ සැලැස්ම කලින් සකස් කළ ප්‍රමාණයෙන්ම ඒ! ඇට ප්‍රමාණයේ කඩදාසිවල නැවත අඳින ලදී.

(IV) පහත සඳහන් විවිධ ලියවිලි ද සකස් කරන ලදී.:-
ජාතික ජලමාන කාර්යාලයේ ජලමාන සටහන් වල අංක යෙදීමේ ක්‍රමය රේඛා සටහන් මගින් පෙන්නුම් කිරීම. ශ්‍රී ලංකාවේ මුහුදුකර කලාප හා ඒවායේ ප්‍රමාණයන් සිතියම් වලින් පෙන්නුම් කිරීම

(V) ඉහත සඳහන් කරුණු වලට අමතරව සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ නාරා ආයතනයේ ඒ ඒ ඒකකවලට සිතියම් සෑදීම,කටු සටහන් පිළියෙල කිරීම,සටහන්වල අකුරු යෙදීම මිනින්දෝරු දෙපාර්තමේන්තුවත් සංස්ථාවත් සමග සමීක්ෂණ ආශ්‍රිත විමසීම් ආදී ආධාර ද සලසන ලදී.

(VI) සමාලෝචනයට භාජනය වූ කාලසීමාව තුළ ජාතික ජලමාන කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හතක් පවත්වන ලදී.

6.4 ජාතික ජලමාන කාර්යාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය.

සැප්තැම්බර් මාසයේ දී ජලමාන විද්‍යාව පිළිබඳ ජර්මානු විශේෂඥ මයිකල් ග්‍රෑබර් මහතා දිවයිනට පැමිණීමත් සමග ආරම්භ වූ අන්තර් ජාතික ජලමාන මණ්ඩලයේ උත්සාහයක් සඵල කර ගැනීම් වස් ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව මගින් ශ්‍රී ලංකාවේ ජලමාන සේවාව ශක්තිමත් කරවීමේ ලා අවශ්‍ය තාක්ෂණික විශේෂඥණය හා උපකරණය කිරීම ඉලක්ක කොටගෙන සපයනු ලබන ව්‍යාපෘතියකි මේ. ග්‍රෑබර් මහතා විසින් සංවිධානයේ දැනට ඇති තත්ත්වය අධ්‍යයනය කිරීමෙන් ටික දිනකට පසු මෙම ව්‍යාපෘතියේ මූලික සැලැස්ම සකස් කරන ලදී. විශේෂඥයා විසින් ජලමාන ක්ෂේත්‍රයට සම්බන්ධ කොළඹ පිහිටි සංවිධානවලට යාම, වාහන සැපයීම සඳහා මිලගණන් කැඳවීම, ෆ්‍රික්වන්සි බලපත් ලබා ගැනීම, දේශන ස්ථාන හා ප්‍රතාදිවතිමානතය(ජීඑස්) වැඩසටහන් පිළියෙල කිරීම සහ පරිඝණක ක්‍රියා කරවීම ආදිය 1988 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් වලදී කරන ලද මූලික කටයුතුවලට ඇතුලත්වේ.

7.0 පාරිසරික අධ්‍යයන ඒකකය:

7.1 පරමාර්ථ:

7.1.1 ජලජ පාරිසරිකයන් හා ඊට බලපාන සාධක පිළිබඳව සොයා බැලීම, අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳ වාර්තා සැපයීම.

7.1.2 පවතින ජලජ අවි ක්‍රම පිළිබඳ ආධාරක රේඛා දත්ත සම්පිණ්ඩනය කිරීම.

7.1.3 ජලජ පාරිසරික ගැටළු හා හදිසි අවශ්‍යතාවයන් පිළිබඳ උපදෙස් දීම හා වගකීම.

7.1.4 (අ) විශ්ලේෂණ සේවා

(ආ) පාරිසරික ප්‍රති විපාක තක්සේරුව පිළිබඳ උපදෙස්

(ඇ) උපදේශක සේවා

(ඈ) රාජ්‍ය හා පෞද්ගලික අංශද්වයටම පාරිසරික දැනුවත් බව සංවර්ධනය කිරීම යන ජලජ පාරිසරිකයට සම්බන්ධ ව්‍යාප්ත සේවා සැලසීම.

7.1.5 ජලජ පරිසරය අපවිත්‍රවීම වැලැක්වීම කම්හල් වලින් පිට කරනු ලබන අප ද්‍රව්‍ය වල තත්ත්වය අධ්‍යයනය කිරීම.

7.2. සේවක මණ්ඩලය:

පර්යේෂණ නිලධාරින් 02 යි.

වර්ෂය තුලදී පර්යේෂණ නිලධාරීන් 04 දෙනෙකු ද, පර්යේෂණ සහකාරවරුන් 02 දෙදෙනෙකු ද යතුරු ලේඛකයකු ද විද්‍යාගාර සහකරුවකු ද හා කම්කරුවකු ගෙන් ද සමන්විත සේවා මණ්ඩලයක් මෙම අංශයට අයත් විය. 1988 සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාසවල පිළිවෙලින් ආචාර්ය රවී පෙරේරා හා එච්. යටපාත මහතාත් යන පර්යේෂණ නිලධාරීන් දෙදෙනා සේවයෙන් ඉල්ලා අස්වූහ.

32 ......

7.3. කාර්ය වැඩ සටහන හා ප්‍රගතිය:

7.3.1 නාරා ආයතනය හා නරේසා ආයතනය විසින් මුදල් යෙදවූ ව්‍යාපෘතියකි.

7.3.1.1 නුවර එළිය වැව:

වැවේ සඹගර තැන්වල බහුලව වැවී ඇති ශාඛාණු සමග දැනට එහි ඇති තත්ත්වය තක්සේරු කිරීම් වස් බහු විධ පර්යේෂණ මෙහෙයුමක් කරන්නට යෙදිණ. මෙහි මූලික සොයා ගැනීම් 1988 දෙසැම්බර් මාසයේ දී පැවැති ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ තාක්ෂණික සැසි වාරයට ඉදිරිපත් කරනු ලැබීය.

7.3.1.2 බෙලිහුල් ඔය ගඟ.

හෝර්ටන් තැන්න ගම් ප්‍රදේශයේ දැනට ඇති තත්ත්වය අධ්‍යයනය කරනු වස් බෙලිහුල් ඔය අතු ගංගාවේ ස්ථාන පහකින් සාම්පල රැස් කරන ලදී. මෙහි ප්‍රතිඵල අනුව බෙලිහිල් ඔය හරහා හෝර්ටන් තැන්න අසලින් ගලා බසින ගඟේ ජලයෙහි ප්‍රති ක්‍රියාව මධ්‍යස්ථ බවත් ඛණිජ හෝ ලවණ සංයුති නොවැඩිව ඇති බවත් හෙළිවී ඇත.

7.3.2 මහකොළඹ ආර්ථික කොමිෂම පාරිසරික අධීක්ෂණ වැඩසටහන

7.3.2.1 කාර්මික අපද්‍රව්‍ය අධීක්ෂණය.

7.3.2.1.1 කටුනායක අපනයන සැකසුම් කලාපය.

කටුනායක අපනයන සැකසුම් කලාපයට නිරීක්ෂණ ගමන් 52 ක් යන ලදී. සාම්පල 250 ක් රැස්කොට පරාමිති පහළොවක් සඳහා විශ්ලේෂණ කටයුතු කරන ලදී. මෙම සාම්පල වලින් 101 ක් ම ප්‍රසිද්ධ කසල කාණුවලට හරවා අපද්‍රව්‍ය මහ කොළඹ ආර්ථික කොමිසමේ විශේෂ විස්තර නිගමනයන්ට අනුකූල නොවන බව ඔප්පු වී ඇත.මෙම අපද්‍රව්‍ය පිට කිරීම පිළිබඳ ගත යුතු ක්‍රියා මාර්ග හා පරිසරය අපවිත්‍ර වීම පාලනය කිරීම පිළිබඳ නිර්දේශ අඩංගු වාර්තා මහ කොළඹ ආර්ථික කොමිසම වෙත යවා ඇත.

7.3.2.1.2 බියගම අපනයන සැකසුම් කලාපය

බියගම අපනයන සැකසුම් කලාපයට නිරීක්ෂණ ගමන් 46 ක් යන ලද අතර වර්ෂය තුළ සාම්පල 122 ක් රැස්කරන ලදී. මේ වායින් 37 ක්ම ම.කො.ආ.කො. විශේෂ විස්තර ප්‍රමිතීන්ට අනුකූල නොවන බැව් අනාවරණය වී ඇත. අවශ්‍ය ක්‍රියා මාර්ග සඳහා ගතයුතු පියවර පිළිබඳ නිර්දේශ ම.කො.ආ.කො. වෙත ඉදිරි පත් කොට ඇත.

7.3.2.1.3 ඒකල හා බියගම අපනයන සැකසුම් කලාප වලට පිටත පිහිටා ඇති අපද්‍රව්‍ය පිටකරනු ලබන කර්මාන්ත ශාලා වල අධීක්ෂණයන් :

ඒකල පිහිටි කාර්මික ජනපදයේ කර්මාන්ත ශාලා සති දෙකකට වරක් බැගින් පරීක්ෂා කර බලන ලදී.
සාම්පල රැස්කොට අවශ්‍ය විශ්ලේෂණයන් කරන ලදී.
වැලිගම් පිටියේ සීමිත ඇම්.කේ.සී.ඉන්ඩස්ට්‍රීස් හා බියගම සීමිත පියෝ බෙවරේජස් යන සමාගම් දෙකේ කම්හල්වල ඇති යන්ත්‍ර සූත්‍ර නිසි පරිදි පවත්වාගෙන යනු නොලබන බව පෙනී ගිය අතර නිසි ක්‍රියා මාර්ග ගැනීම සඳහා ම.කො.අා.කො. වෙත දන්වා ඇත.

7.3.2.2 ඒකල අපනයන සැකසුම් කලාපය සහ බියගම අපනයන සැකසුම් කලාපයන් පොදු කසල ද්‍රව්‍ය හැසිරවීමේ යන්ත්‍ර:

මෙම අපනයන සැකසුම් කලාපදෙකේ පොදු කසල ද්‍රව්‍ය හැසිරවීමේ යන්ත්‍ර සතිපතා පරීක්ෂාකොට බලන ලද අතර අවශ්‍ය සාම්පල ද්‍රව්‍ය ඇතුළුවන ස්ථාන වලින් හා පිටවන ස්ථාන වලින් ලබා ගන්නා ලදී. කටුනායක කසල ද්‍රව්‍ය හසුරුවන යන්ත්‍රවලින් ලබාගත් සාම්පල අසූ නවයකින් තිස් නවයක්ම නියමිත (බීඕඩී) මට්ටමට වඩා වැඩි වීමේ හේතුවෙන් අසතුටුදායක තත්ත්වයක පවතින බවත් බියගම කසල ද්‍රව්‍ය හසුරුවන යන්ත්‍ර වලින් ලබා ගත් සාම්පල 75 න් දොළහක් ම (බීඕඩී) මට්ටමට වැඩි අසතුටුදායක ඒවා විය.

7.3.2.3 මිරිදිය ජලය මත බියගම අපනයන සැකසුම් කලාපයයෙන් නිකුත් කරනු ලබන අප ද්‍රව්‍ය අධීක්ෂණය කිරීම:

7.3.2.3.1 කැළණි ගඟ.

තෝරාගත් ස්ථාන කිහිපයකින්ම සාම්පල රැස්කොට විශ්ලේෂණය කරන ලදී. ගඟේ එම ස්ථාන වලින් බීමට ලබා ගන්නා ජලයෙහි අඩංගු රසායනික තත්ත්වය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශිත උපදෙස් වලට අනුකූල බව මෙම පරීක්ෂණ වලින් හෙළිවී ඇත. මෙම ජලයෙහි මළ ජෛන්ද්‍රියයන් ඇති බව පෙනෙන හෙයින් ගෘහස්ථ ප්‍රයෝජනයට ගැනීමට පෙර නිසි පරිදි සකස් කර ගත යුතු වේ.

7.3.2.3.2 අඬුගම ඔය:

අඬුගම ඔයේ කටුනායක අපනයන සැකසුම් කලාපයෙන් අපද්‍රව්‍ය ගලා බසින තෝරාගත් ස්ථාන තුනක සමීක්ෂණ වැඩ කටයුතු කරන ලදී. සතියකට වරක් බැගින් සාම්පල රැස්කොට රසායනික පරාමිති 20 හා ක්ෂුද්‍ර ජෛව වේදිය 02 පරාමිති සඳහා විශ්ලේෂණය කරන ලදී.

7.3.2.4 - ඒකල අපනයන සැකසුම් කලාපය හා බියගම අපනයන සැකසුම් කලාපවල බීමට ගන්නා ජලයෙහි තත්ත්වය හා ආරක්ෂාව පිළිබඳ අධීක්ෂණ කිරීම:

7.3.2.4.1. සකස්කළ ජලය.

ම.කො.ආ.කො. මගින් අපනයනය සැකසුම් කලාප සඳහා සපයනු ලබන බීමට ගන්නා ජලයෙහි රසායනාගාර රසායනික හා බැක්ටීරියා විද්‍යාත්මක විශ්ලේෂණයන් කරන ලදී. බෙදා හැරීමේ ක්‍රමවල ශේෂ ක්ලෝරීන් මට්ටම ද නිගමනය කරන ලදී. බොයිලේරු ගත කරනු ලබන ජලය සඳහා වූ සම්මත ප්‍රමිතීන්ට අනුකූල වන්නේ දැයි ද විග්‍රහ කර බලන ලදී.

7.3.2.4.2 කටුනායක අපනයන සැකසුම් කලාපයේ බීමට ගන්නා ජලය.

කටුනායක අපනයන සැකසුම් කලාපයේ පිහිටි නල ළිංවල ජලය සාම්පල රැස්කරන ලදී. සාම්පල අටකින් පහක්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන්ට නොගැලපෙන බව හෙළිවී ඇති අතර අවශ්‍ය නිර්දේශ සහිත වාර්තා ම.කො.ආ.කො වෙත යවා ඇත.

7.3.2.5 - බියගම අපනයන සැකසුම් කලාපයේ පිහිටා ඇති ජලාශවල මසුන් ඇති කිරීම.

ජලාශවල මසුන් ඇති කිරීමේශක්‍යතාව අධ්‍යයනය කිරීම සඳහා සැකසුම් කලාපයේ පිහිටි ජලාශවල ජලය පිළිබඳ තත්ත්වය නිතිපතා නිගමනය කරන ලදී. අවශ්‍ය නිර්දේශ හා තොරතුරු ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කොට ඇත.

7.3.3 - විශේෂ ව්‍යාපෘති :

7.3.3.1 සීමිත යුනියන් කාබයිට් ලංකා සමාගමෙන් ඉවත ලන ඝන ද්‍රව්‍යයන්

CEA, CISIR සහ GCEC මගින් ඒකාබද්ධ පරීක්ෂණ පවත්වන ලදී. නිරීක්ෂණ හා අදහස් ද ඇතුළුව යුනියන් කාබයිට් සමාගම විසින් පාරිසරික බලපෑම් අංශයෙන් ආරක්ෂා වීමට ඉවත ලන ද්‍රව්‍ය පාලනමය මෙහෙයුම්, ගතයුතු ආරක්ෂිත පියවර යන්ද සඳහන් කොට ම.කො.ආ.කො. වෙත යවන ලදී.

7.3.3.2 කණ්ණාඩි සෑදීමේ කර්මාන්තය

රසායනික පරාමිති 20 ක් සඳහා පරීක්ෂණ මෙහෙයවා සාම්පල රැස්කොට විශ්ලේෂණයන් කරන ලදී. ආරක්ෂා සහගත පියවරයන් අනුගමනය කළයුතු බවට යටත්ව මෙම කර්මාන්තයන් සඳහා අනුමැතිය නිර්දේශ කරනු ලැබීය.

7.3.3.3 මුහුන් (Yeast ) නිෂ්පාදනය සඳහා ව්‍යාපෘතියක්:

ම.කො.ආ.කො. සමග ඒකාබද්ධ විමසුමක් කරන ලදී. ව්‍යාපෘතිය සඳහා ස්ථාන අනුමැතිය, නිරීක්ෂණයන් හා අදහස් ම.කො.ආ.කො. වෙත ඉදිරිපත් කරන ලදී.

35 ......

7.3.3.4 දෙහිවල සත්ත්ව උද්‍යානය තුළ පොකුණු දෙකක් පවිත්‍ර වීම.

දෙහිවල ජාතික සත්ත්ව උද්‍යානයේ අධ්‍යක්ෂ වරයාගේ ඉල්ලීමක් අනුව ජලය පිරුණු ගල්වලවල් දෙකක මූලික පරීක්ෂණ මෙහෙයවන ලදී. පොකුණුවල ජීව විද්‍යාත්මක හා රසායනික විශ්ලේෂණයන් කරන ලද අතර ඒ පිළිබඳ නිරීක්ෂණයන් සහිත වාර්තා සත්ත්ව උද්‍යානයේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන ලදී. මේ සඳහා වඩාත් ස්ථිර සාර වැඩ පිළිවෙලක් සැකසීම අවශ්‍ය බැවින් ජාතික සත්ත්ව උද්‍යාන දෙපාර්තමේන්තුව සමග අධ්‍යයන එකගත්ත්වයක් මත එම කර්තව්‍යයන් ආරම්භ කෙරෙනු ඇත.

7.3.3.5 මුතුරාජවෙල මඩ වගුරු සංවර්ධනය කිරීම.

මුතුරාජවෙල මඩවගුරු සංවර්ධනය කිරීමේ විෂයය පිළිබඳව මි.කො.ආ.කො. විසින් පැවැත්වූ රැස්වීම් වලට ESU විසින් නාරා ආයතනය නියෝජනය කරන ලදී.

විශේෂයෙන් රජයේ නොවන ආයතන (NGOs) ද හා EIA ආයතනයේ ද ව්‍යාපෘතික සංහිඳියාවකින් තොරව මොනම විදියේ සංවර්ධනයක් වත් නොකළ යුතු බවට නාරා සහ CEA යන ආයතන දෙක මගින් අනතුරු ඇඟවීමක් කරන ලදී. මුතුරාජවෙල හා මීගමුව පිළිබඳ පුළුල් සංවර්ධන අවබෝධයක් ලබා ගැනීමට නාරා ආයතනය සූදානමින් සිටී.

7.3.3.6 සීමාසහිත ඒවරි සමාගමේ ජලය බෝතල්වල ඇසිරීමේ ව්‍යාපෘතිය.

නාරා ආයතනයේ සභාපතිගේ ත් සී.ස.ඒවරි සමාගමේ සභාපතිගේ ත් ඉල්ලීමක් අනුව ඒවරි සමාගම විසින් තෝරාගනු ලැබූ ඩෙවොන් ෆෝල්ස් (Devon falls) නම් ස්ථානයට ගොස් සොයා බැලීමේ දී එම ස්ථානයේ ඇති ජලය අතිශය අපිරිසිදු බව බැලූ බැල්මටම පෙනෙන බැවින් බීමට ගැනීම සඳහා එක්රැස් කිරීම සුදුසු නොවන බැව් පෙනී ගොස් ඇත. එබැවින්, බීම සඳහා ජලය බෝතල් වල පිරවීම පිණිස වෙනත් ස්ථානයක් සොයා බලා දැන්වූ පසු එහි ජලය පරීක්ෂා කර බැලීම කළ හැකි බව සමාගමේ නියෝජිතයාට දන්වන ලදී.

7.3.3.7 ගවතරිස් පුල් සංවර්ධනය.

ජාතික ජලමාන කාර්යාලයේ ආචාර්ය රවී පෙරේරා සහ නිමල් විජේසිංහ යන මහත්වරු ඇතුළු තවත් එම ආයතනයේ නිලධාරීන් කිහිප දෙනෙකු ද නාරා සභාපතිවරයා ද එක්ව ඉහත සඳහන් ව්‍යාපෘතියේ ගෘහ නිර්මාණ ශිල්පීහු 1988 පෙබරවාරි මස 23 දින මුණ ගැසුනාහ. යෝජිත ගොඩනැගිලි කටයුතු ආරම්භ කිරීමට පෙර තවදුර සාකච්ඡා කිරීමට නියමිතය.

7.3.4 හදිසි අධ්‍යයනයන්

7.3.4.1 කටුනායක අපනයන සැකසුම් කලාපයෙහි සීමිත කටුනායක ගාමන්ට්ස් සමාගමේ බෝවෙන රෝග පැතිරයාම.

ම.කො.ආ.කො මගින් සපයා ඇති ජලය පිළිබඳ තත්ත්වය හා මෙම කර්මාන්ත ශාලාවේ බෝවෙන රෝග පැතිර යාමත් අතර ඇති සම්බන්ධතාවය ගැන අධ්‍යයනයක් කරන ලදී. එම පරීක්ෂණ ප්‍රතිඵල අනුව කර්මාන්ත ශාලාවට සපයා තිබෙන ජලයෙහි බෝවෙන රෝග පැතිරීමේ අංශු කිසිවක් එහි අඩංගු නොවන බව හෙළි වී ඇත.

7.3.4.2 කැළණි ගඟේ හා අඩුගම් ඔයේ ඇති UFD හේතු කොට ගෙන මසුන් මැරී යාම.

නාරා ආයතනයේ ජලජ වගා ඒකකයේ ද සහයෝගිතාවය ද ඇතිව අඩුගම ඔයේ හා කැළණි ගඟේ මසුන් මැරීයාම පිළිබඳ අධ්‍යනය මෙහෙයවන ලදී. මසුන් මැරී යාමට ඇති මූලික හේතුව ජලය රසායනික අපවිත්‍රතාවයකින් යුතු නිසා බව රසායනික පරීක්ෂණ වලින් හෙළිවී ඇත. ඒ ඒ ස්ථානවලින් රැස්කර ගත් මසුන් සාම්පල ව්‍යාධිවේදීයව පරීක්ෂා කිරීමේ දී මසුන්ගේ ශරීරයෙහි හා කරමලවල විපත්තක ව්‍රණමයතාව හා ද්විතීයක බැක්ටීරියානු හා දිලීරිය පුස් සංක්‍රමණය වීමේ ලක්ෂණ ව්‍රණමයතා මසුන් රෝගද ඇති බව පෙනී ගොස් ඇත.

7.3.4.3 නලමාර්ගයක තෙල් කාන්දු වීමක් නිසා ජලය අපවිත්‍ර වීමක් පිළිබඳ වාර්තාවක් විභාග කිරීම.
මගුරුවිල සහ ගෝනවල ගොඩබිම ජලය තත්ත්වයන් පිළිබඳ මූලික අධ්‍යයනයක් කරන ලදී. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හා නාරා ආයතනයේ සභාපති වෙත අදාල රසායනික විශ්ලේෂණයන් ද සමග එම වාර්තා යවා ඇත.

7.4 ව්‍යාප්ති සේවා.

7.4.1 ලංකා ධීවර සංස්ථා භූමියෙහි ජල තත්ත්වයන් පරීක්ෂා කිරීම.

ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහණ මණ්ඩලය මගින් ලංකා ධීවර සංස්ථාවට සපයනු ලබන ජලය පිළිබඳ තත්ත්ව අධ්‍යයනයක් සඳහා පරීක්ෂණයක් මෙහෙයවන ලදී.

7.4.2 ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා භූමිය තුළ ජලය තත්ත්වයන් පරීක්ෂා කිරීම.

ජාතික ජල සම්පාදන ජලප්‍රවාහන මණ්ඩලය විසින් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත සපයනු ලබන ජලය පිළිබඳ තත්ත්ව අධ්‍යයනයක් සඳහා පරීක්ෂණයක් කරන ලද. ශ්‍රී ලංකා ප්‍රමිතිත්ට අනුකූල නොවන ශාඛාණු විද්‍යාත්මක තත්ත්වයන් හා හයිඩ්‍රජන් අයන් සාන්ද්‍රණය( Ph ) පිළිබඳව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සාමාන්‍යාධිකාරී වෙත දැන්වීමක් කරන ලදී.

8.0 පරිසර පද්ධතිය පිළිබඳ අධ්‍යයන ශාඛාව:

8.1 පරමාර්ථ

8.1.1 නාරා ආයතනයේ කොරල්පර වැඩ සටහනට සම්බන්ධව ප්‍රතිපත්ති හා අභිප්‍රාය අනු ස්ථාපනය කරන්නාවූ පරීක්ෂණ කිරීම.

37 .....

8.1.2 ශ්‍රී ලංකාවේ අවසාන වශයෙන් ඉතිරිව තිබෙන ගාල්ලේ උණවටුනේ කොරල් පර පිළිබඳ බහු ප්‍රයෝජන මුහුදු පර්යේෂණයක් ආරම්භ කිරීම.

8.1.3 දිවයිනේම ඇති කොරල් පර හා වැලිගල් පිළිබඳ සිතියම් කිරීම.

8.1.4 අදාල ප්‍රදේශයන්හි ඇති සම්පත්වලට මිනිස් ප්‍රේරිත ක්‍රියා හා ස්වාභාවික යත ක්‍රියා දෙකින්ම බලපාන ප්‍රති ක්‍රියා සහ කොරල් පර හා සම්පත් විභවයන් තක්සේරු කිරීම.

8.1.5 මිනිසුන්ගේ භාවිතා සීමාවන් ස්ථාපනය කිරීම.

## 8.2. සේවා මණ්ඩලය.

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 02 |
| කිමිදුම් කරුවන් | 02 |

වර්ෂය තුළ සේවා මණ්ඩලය පර්යේෂණ නිලධාරියෙකු ද කිමිදුම් නිලධාරියෙකු ද කිමිදුම් තාක්ෂණිකයෙකු හා අනියම් කිමිදුම් කරුවෙකුගෙන් ද සමන්විත විය.

කිමිදුම්කරු තාක්ෂණික ලක්ෂ්මන් ගිහිගේ සැප්තැම්බර් මස දී තනතුරෙහි ස්ථිර කරන ලදී. වේල්ස් විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂක ඒ.සී.මීදෙණිය මහතා.

## 8.3. කාර්ය වැඩ සටහන හා ප්‍රගතිය.

කොරල්පර පිළිබඳ සියලුම වැඩ සටහන් යටතේ ඇති වියදම් සඳහා නාරා ආයතනය විසින් මුදල් යොදවා ඇත. ජලාශ මතුපිට ඇදගෙන යනු ලබන ලණුවක් මගින් **Scuba** කිමිදුම් මගින් **Snorted Diving** හෙවත් ශබ්ද කරමින් කිමිදීම මගින් උණවටුන බොක්කේ ඇතුළත අවට පරීක්ෂණ පවත්වන ලද අතර (ජනවාරි--ජූලි) මෝසුන් නොවන කාල සීමාව තුළ මසකට එක්වරක් බැගින් නිතිපතා ගොස් කිමිදුම් කරු වකු සහිතව, මසුන්, කොරල් සහ වෙනත් ප්‍රමුඛ ඓන්ද්‍රියයන් පිළිබඳව වාර්තා කිරීම හා නිරීක්ෂණයන් කරන ලදී.

උණවටුන බොක්ක ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය, ධීවර කර්මාන්තය හා වෙනත් ඒ හා සම්බන්ධ ක්‍රියාවන් පිළිබඳ තොරතුරු කෙළින්ම නිරීක්ෂණය කිරීමෙන් හා ධීවර අමාත්‍යාංශයේ නිලධාරීන්, ධීවර කාර්මිකයින්, හෝටල්කරුවන් සහ ගම්මුන්ද සම්මුඛව තොරතුරු ලබා ගන්නා ලදී.

මෙයට අමතරව ආරක්ෂිත මායිම් නිගමනය කරගනුවස් නාරා ආයතනයේ ජාතික ජලමාන කාර්යාලය ද සමග ගොඩබිම සමීක්ෂණයක් හා මුහුදු සමීක්ෂණයක් ද කරන ලදී.

රටෙහි ඇති කොරල්පර/වැලිගල්පර පිළිබඳ සිතියම් කිරීමේ අරමුණින් යුතුව මෙම සමීක්ෂණ කණ්ඩායම විසින් කොළඹ ප්‍රදේශය ආවරණය කරන ලදී.

**Scuba** කිමිදුම් හා ශබ්ද කිරීමේ කිමිදුම් මගින් තක්සේරු කිරීම් කරන ලදී.

මියගිය හා ජීවත්වන කොරල් කට්ටි මසුන් සහ වෙනත් ජෛව්ද්‍රිකයින්ගේ වර්ග පිළිබඳ ප්‍රතිශතයන් වාර්තා කරන ලදි. නාරා ආයතනයේ රැස්කොට ඇතිකොරල් තොරතුරු වලටමෙම අලුත් වාර්තා ද එකතු කරනු ලැබීය. (මෝසම් කාලයට මුහුදේ වැඩ කළ නොහැකිය) ස්වාභාවික හේතුන්මත වර්ෂයේ හය මසක කාලයක් තුළ පමණක් කොරල් පර පිළිබඳ සමීක්ෂණ කරනු ලැබේ. මෙම කාල සීමාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට නම් මෙම අංශය විසින් අවශ්‍ය කිමිදුම් උපකරණ හා කිමිදුම් කරුවන් වැඩි ප්‍රමාණයක් යොදවා ගත යුතුවේ. උණවටුණ සමීක්ෂණ කටයුතු කඩිනමින් කළ යුතු වූ හෙයින් මෙම අඩු පාඩුව එක හෙළා පෙනී ගියේය. කොම්ප්‍රෙසරය ඇතුළු සියලුම කිමිදුම් උපකරණ ද සේවකයින් ද රැගෙන යා හැකි ආකාරයේ වාහනයක් තිබීම අත්‍යාවශ්‍යයය.

9.0 ජාතික මුහුදු ක්ෂීරපායි සත්ත්ව වැඩ සටහන:

9.1 පරමාර්ථ:

9.1.1 කුඩා සෙටාසියන් ජීවියා ගේ ජනගහණ ගතිකයන් පිළිබඳ අධ්‍යයනය කිරීම.

9.1.2 සම්බන්ධක මගින්, සෘජු නිරීක්ෂණ මගින්, මැරීමේ අධ්‍යයන මගින් ඩොල්පින් මසුන්ගේ ගබඩා කිරීමේ ප්‍රමාණය අධ්‍යයනය කිරීම.

9.1.3 ගබඩා කිරීමේ ප්‍රමාණය, ගමන්කිරීම අධ්‍යයනය කිරීමට විශාල තල්මසුන් සමීක්ෂණයක් කිරීම.

9.2 සේවක මණ්ඩලය:

| | |
|---|---|
| පර්යේෂණ නිලධාරීන් | 02 |
| සහකාර පර්යේෂණ නිලධාරීන් | 02 |

මෙම වැඩ සටහන පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු හා පර්යේෂණ සහකාරවරුන් දෙදෙනෙකුගෙන් සමන්විතය.

සැප්තැම්බර් මාසයේ දි පර්යේෂණ නිලධාරිනී අනෝක් ඉලංකෝන් මෙනෙවිය හා පර්යේෂණ සහකාර කාන්ති සුබසිංහ මෙනෙවියත් ඩබ්ලිව්.පී. මහේන්ද්‍ර මහතාත් ඔවුන්ගේ තනතුරුවල ස්ථිර කරන ලදි.

9.3. කාර්ය වැඩ සටහන හා ප්‍රගතිය:

ඩොල්පින් මසුන්ගේ මර්ත්‍යතාව තක්සේරු කිරීම සඳහා මීගමුව, කෝට්ටගොඩ, මුහුදු බඩ ප්‍රදේශයේ මසුන් ගොඩබාන ස්ථානවල අධීක්ෂණ කටයුතු 1988 3 වෙනි කාර්තුව දක්වා දිගටම කෙරීගෙන යන ලදි. ඔක්තෝබර්-දෙසැම්බර් කාර්තුව තුළ රටෙහි පැවතුණ අසහනකාරී තත්ත්වය මත දත්ත රැස්කිරීමේ වැඩ නවත්වන ලදි. ධීවර කාර්මිකයින් හමුවී කරුණු අසා දැන ගැනීමෙන් ඩොල්පින් මසුන් අල්ලා ගැනීමේ දුර ප්‍රමාණයන් ආදී වෙනත් තොරතුරු සටහන් කරන ලදි. නිරීක්ෂණ චාරිකාවන් හා සම්බන්ධක වැඩ සටහන් සඳහා බෝට්ටු පහසුකම් නොලැබීමේ හේතුවෙන් මගහැරී යන ලදි.

1986 සිට මර්ත්‍ය හා අධ්‍යයන කටයුතු ශ්‍රී ලංකාවේ දකුණු හා බටහිර මුහුදු බඩ පෙදෙස්වලට පමණක් සීමා කරන ලදී. වර්ෂය තුළදී විශාල තල්මසුන් පිළිබඳ අධ්‍යයනයන් සඳහා ඉඩක් නොලැබිණි.
ඉහත දැක්වූ අපහසුකම් හේතුවෙන් ඩොල්ෆින් ජනගහණය පිළිබඳ සැලකිය යුතු ස්ථාවරයක් ලබා ගැනීම සඳහා අධ්‍යයන කටයුතු 1989 අවසානය දක්වා වැඩ සටහන් දීර්ඝ කිරීමට අදහස් කෙරේ.

10.0 ප්‍රවෘත්ති ශාඛාව.

10.1 පරමාර්ථ

10.1.1 ශ්‍රව්‍ය දෘශ්‍ය හෝ විද්‍යුත් ක්‍රමයට හා වෘත්තාන්ත දත්ත වාර්තා සහ ප්‍රසිද්ධ කළ හා නොකළ නිශ්පාදන රැස්කිරීම.

10.1.2 ශ්‍රී ලංකාවේ මුහුදු කටයුතු හා ජලජ සම්පත් සංවර්ධනය කිරීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි තොරතුරු පළ කිරීම නැවත සකස් කිරීම හා ගබඩා කිරීම.

10.1.3 මුහුදුකටයුතු හා ජලජ සම්පත් තොරතුරු සේවාවක් ආරම්භ කිරීම හා ජාතික මට්ටමේ සිට ප්‍රාදේශීය හා අන්තර් ජාතික මට්ටම දක්වා එහි ක්‍රියාකාරිත්වය ප්‍රගතිශීලීව පුළුල් කිරීම.
පරමාර්ථ පහත සඳහන් ආකාරයට තේරුම් ගත යුතු වේ.

මුහුදු කටයුතු පිළිබඳ පර්යේෂණ පුස්තිකාලයක් හා ජාතික සුරක්ෂිතාගාරයක් ස්ථාපිත කිරීම.

ලේඛණ බෙදා හැරීමේ සේවාවකින් සමන්විත ග්‍රන්ථ විඥාණාත්මක නිපැයුම් සේවාවක් හා පර්යේෂණය කිරීමට සැලැස්වීම සඳහා ජාතික මුහුදු හා ජලජ සම්පත් පිළිබඳ විස්තර අඩංගු කිරීමට කොම්පියුටර් ගත දත්තාගාරයක් ඇති කිරීම.
රැස්කරන ලද තොරතුරු ජාතික, ප්‍රාදේශීය හා අන්තර් ජාතික මට්ටමින් සකස් කිරීමට, නැවත ගොනු කිරීමට හා පළ කිරීමට හැකි අයුරින් ලේඛණ ඒකකයක් ආරම්භ කිරීම. වාර්තා සඟරා වලින් උපුටා ගැනීම්, නාමාවලි, අත්පොත් හා තොරතුරු කාණ්ඩ මෙම ශාඛාවේ නිශ්පාදනයන් වේ.
පාරිභෝගික ප්‍රජාවට සමීප සේවාවක් සැලසීම හා එදිනෙදා සිදුවීම් පිළිබඳ හැඟීමක් ඇති කිරීමට ව්‍යාප්ති සේවා ඒකකයක් ආරම්භ කිරීම.

10.2 සේවා මණ්ඩලය.

| | |
|---|---|
| ප්‍රවෘත්ති නිලධාරීන් | 05 |
| පුස්තකාලයාධිපතීන් | 02 |
| දත්තකැවීමේ ක්‍රියාකරු | 01 |
| සම්බන්ධීකරණ නිලධාරී | 01 |
| යතුරු ලේඛක | 01 |
| කම්කරු | 01 |

වර්ෂය තුළදී අලුත් නිලධාරීන් බඳවා ගැනීමෙන් අංශයේ කාර්යයන් ශක්තිමත් කරන ලදී. ජනවාරිමස මුලදී මයිකල් බෙරෙන්ජර් මෙනෙවියගේ සේවය ස්ථිර කරන ලදී.

## 10.3 කාර්ය වැඩ සටහන හා ප්‍රගතිය.

### 10.3.1 පුස්තකාලය

1988 ජනවාරියේ දී IDRC ආයතනයේ ධන යෝජනයෙන් මාරිස් (MAARIS ) ව්‍යාපෘතිය ආරම්භ කිරීමත් සමගම තිබුණාවූ ඉඩකඩ ප්‍රමාණ යන් අනුව පුස්ථකාලය පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කෙරිණ. පුස්ථකාලයට වම් පසින් තිබුණ රසායනාගාරය එළි පෙහෙළි කොට කොම්පියුටර් පහසුකම්, ප්‍රකාශ කිරීමේ පහසුකම් හා සේවා කාර්යාල පහසුකම් සංවිධානය කරන ලදී.

#### 10.3.1.1 පවරා ගැනීම්

මාරිස්(MAARIS ) ව්‍යාපෘතියෙන් පොත් මිලයට ගැනීම සඳහා රු.75,000/- දී තිබීණ බැවැත් කලින් වසරේ 14 ක්ව තිබුණු ප්‍රකාශණ නාම ගණන 24 දක්වා වැඩි කර ගැනීමට හැකි විය.
මුහුදු භූ විද්‍යාව, ජලමාන විද්‍යාව, සාගර විද්‍යාව, ආදී ඒක විෂය සංග්‍රහ රැස්කිරීම තරකර ගැනීමට පොත් පිළිබඳ ප්‍රසිද්ධියක් ඇති ප්‍රකාශණ ආයතන විලින් හා අන්තර් ජාතික සංවිධාන වලින් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ පොත්වල ලේඛණයක් සියලු විස්තර ද සහිතව යවනු ලැබීය.

#### 10.3.1.2 සේවාවන්.

පාසල් විෂය මාලාවට මුහුදු ජලජ සම්පත් පිළිබඳ විෂයයන් ඇතුලත් කිරීමෙන් පාසල් ළමුන් ද බොහෝ පිරිසක් ඇදී ආහ. තව ද පාසල් ළමුන්ගේ ප්‍රයෝජනය සඳහා පහසුවෙන් මිලයට ගැනීමට හැකිවන ආකාරයට සරළ බසින් සකස් කරන ලද ප්‍රකාශණ නිකුත් කරන ලෙස මව් පියන්ගෙන් ද ඉල්ලීම් ලැබිණ. මාරිස් (MARIS ) ආයතනයේ වියදමින් තොරතුරු අත් පොත් දෙකක් 1989 දී මුද්‍රණය කිරීමට සැලසුම් කරන ලදී.

පිටස්තර පුස්තකාලවලින් හා අපගේම නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව 1988 දී අන්තර් පුස්තකාල ණය පහසුකම් ප්‍රයෝජනයට ගැනීමේ සීඝ්‍ර වර්ධනයක් සිදුවී ඇති බව පෙනී ගොස් ඇත. පුස්තකාලයට අනුබද්ධ වූ සියලු පොත් වලලේඛණයක් නාරා සේවක මණ්ඩලය වෙත ත්‍රෛයි මාසිකව ප්‍රකාශණය කරන ලදී.

ජාතික ජලජ සම්පත් නියෝජිතායතනයේ සඟරාව සඳහා පහත සඳහන් නව කර්තෘ මණ්ඩලය 1988 අගෝස්තු මස දී පත් කරනු ලැබීය.

ආචාර්ය හිරාන් ඩබ්ලිව්.ජයවර්ධන ( සභාපති)
ආචාර්ය පී.සී.එන්.ජයසූරිය
මහාචාර්ය එච්.එච්.කොස්තා
මහාචාර්ය සේන ද සිල්වා
මහාචාර්ය සී.බී.දිසානායක
මහාචාර්ය පී.ඒ.ජේ.පෙරේරා
ආචාර්ය එස්.සුබසිංහ
ආචාර්ය රවී පෙරේරා
මහාචාර්ය ආර්.ජේ.රොබට්ස්

ලලිතා බණ්ඩාරනායක මහත්මිය ( ලේකම්)

කෙසේවුව අවුරුද්දේ අවසානය දක්වාම ඔවුන්ට රැස්වීමට නොහැකිවිට සඟරාවේ 32 වැනි වෙළුම වසරේ 4 වැනි කාර්තුව තුළ මුද්‍රණයට සකස් කොට යැවූ නමුත් වානිජ්‍ය ආයතනවල පැවැති වැඩ අවහිර තත්ත්වයන් හේතුවෙන් වර්ෂය අවසාන වීමට පෙර මුද්‍රණයෙන් පිටකර ගැනීමට නොහැකි විය.

10.3.2 මුහුදු කටයුතු හා ජලජ සම්පත් තොරතුරු පද්ධතිය (MAARIS )

පළමු වර්ෂය සඳහා ( IDRC ) ආයතනය මගින් නාරා ආයතනයට සපයන ලද කැනේඩියානු ඩොලර් 50,000 ක මුදලින් මාරිස් ( MAARIS ) ව්‍යාපෘතිය 1988 ජනවාරි මාසයේ දී ආරම්භ විය. මෙම මුදල ලේඛණ ඒකකය ස්ථාපිත කිරීමත් පුස්තකාලය ශක්තිමත් කිරීමත් සඳහාය. තවද 1988 අප්‍රේල් මස දී ව්‍යාපෘති ඒකකය ශක්තිමත් කිරීම සඳහා මාරිස් ව්‍යාපෘතිය යටතේ කැනඩාවේ IOCD ආයතනයේන් කැනේඩියානු ඩොලර් 50,000 ක මුදලක් නාරා ආයතනයට ලැබිණ.

10.3.2.1 කොම්පියුටර් පහසුකම්.

ජාතික දත්ත පදනම සඳහා වූ කොම්පියුටර් අවශ්‍යතාවයන්ට අමතරව අදාල තද භාණ්ඩ සහ සැහැල්ලු භාණ්ඩ ද සහිතව මේසය මත තැබිය හැකි අංග සම්පූර්ණ මෙහෙයුම් හැකියාවකින් යුතු ප්‍රකාශණය කිරීමේ පද්ධතියක් ව්‍යාපෘතියේ පසුව සඳහන් කළ ව්‍යාප්ති ඒකකය සඳහාම පමණක්, ලබා දී ඇති එම මුදල් ප්‍රමාණයෙන්ම මිලයට ගන්නා ලදී. ප්‍රවෘත්ති නිලධාරියෙකු වශයෙන් පළපුරුදු පද්ධති විශ්ලේෂණය කරන්නෙකු බඳවා ගැනීමට අපට අනගි අවස්ථාවක් තිබුණ හෙයින් ඉතාම කෙටි කලකින් දත්ත පදනම පිහිටුවීම කරා වේගවත්ව පිය නැගීමට හැකි වූවා පමණක් නොව ව්‍යාපෘතිය මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණු මාරිස් MAARIS ව්‍යාපෘතියේ සේවය ද ලබා ගත හැකි විය. එම පද්ධතිය මුද්‍රණයේදී සිත්තම් වැඩ සඳහා යොදා ගැනීමට ලේඛණයේ පිටපත ලේසර කිරණ මුද්‍රිතයක් මගින් මුද්‍රණය කොට ගත හැකි අතර ලේබල්වල සැලැස්ම සලසා දීමට සමත් තිම් කැමරාවක් සහිත වෙන්චුරා ( VENTURA ) නම් මේසය මත තබනු ලබන ප්‍රකාශණය කිරීමේ සැහැල්ලු භාණ්ඩයකි.

42 .....

මාරිස් ව්‍යාපාති උපදේශකයකු වශයෙන් කටයුතු කරන 'මාර්ග' ආයතනයේ ගපූර් මහතාගේ සහාය ද ඇතිව මාරිස් දත්ත පදනම පද්ධතියක් සැලසුම් කරන ලදී. දත්ත පදනමට ඇතුලත් කරනු ලබන්නේ එම දත්තයේම උධෘතයක් ද සමගිනි. 1988 අවසානයේ දී ප්‍රකාශණ 83 ක් ඇතුළත් කරන ලද අතර මෙම දත්ත පදනම මගින් උපුටා ගැනීමේ සඟරාවක් බිහි කිරීම සඳහා අවශ්‍ය වැඩවල දැන් ප්‍රගතියක් දකිමින් තිබේ.

10.3.2.2. මුද්‍රණය කිරීමේ පහසුකම්.

කොම්පියුටර් ඒකකයෙන් සැලැස්ම පහසුකම් ලබා ගත හැකිව තිබුණු හෙයින් මුල දී මේ සඳහා අදහස් නොකරන ලද නමුත්, 1988 අවසානයේ දී අප සතුව තිබූ බරවැඩ ඡායා පිටපත් යන්ත්‍රය මගින් මූලික සැලැස්මේ සිට මුද්‍රණය දක්වා වූ අංග සම්පූර්ණ ලේඛණ සේවයක් අප විසින් නාරා ආයතනයට සලසන ලදී. මුලින් මේ සඳහා සේවක ප්‍රතිපාදන සලසා නොතිබුණේ වුව ද අංශයේ සියලුම සේවකයින්ගේ උනන්දුව හා කැපවීමත් එකම කණ්ඩායමක් මෙන්කාර්යාල වේලාවෙන් පසුව ද කටයුතු කිරීමේ ප්‍රතිඵලය හේතුවෙන් දැන් මෙම කටයුත්ත හොඳින් කෙරීගෙන යයි. මෙම පහසුකම ප්‍රයෝජනයට ගෙන ඉදිරියේ දී ප්‍රකාශණය කිරීමට බලාපොරොත්තුවන නාරා සඟරාව පිළිබඳ සැලැස්ම අකුරු යෙදීම හා සිත්තම් වැඩ යන සියල්ලම අප විසින් ම නිම කොට දැනට පිටස්තර වාණිජ්‍ය මුද්‍රණ ආයතනවලට මුද්‍රණ කටයුතු පැවරීමේ දී ටයිප් සෙටින් වැනි කටයුතු සඳහා වියදම් කරනු ලබන අධික මුදල් ප්‍රමාණය ඉතිරිකර ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කරමු.

තවද යුඑන්ඩීපී හා අයිඩීආර්සී ආධාර ද ඇතිව ලැමිනේටරයක් , ප්ලේට් මේකරයක්, ඕෆ් සෙට් මුද්‍රණ යන්ත්‍රයක් ආදී අංග සම්පූර්ණ මුද්‍රණ පහසුකම් වලින් යුතුව 1989 දී නාරා ආයතනයේ සියලුම ප්‍රකාශණයන්ට අදාල කර්තෘ කරණය, සැලැස්ම, මුද්‍රණය හා ප්‍රසිද්ධ කිරීමේ කාර්යයන් මෙ මගින්කර ගැනීමට අදහස් කරනු ලැබේ.

10.3.2.3 ව්‍යාප්ත සේවා පහසුකම්.

මෙම ඒකකයට ව්‍යාප්ත නිලධාරියෙකු හා සම්බන්ධතා නිලධාරියෙකු පත්කිරීමට අමතරව නාරා ආයතනයේ ඡායාරූප තාක්ෂණිකයන් දෙදෙනෙකුගේ ද සහාය ලබා දෙන ලදී. නාරා ඡායාරූප ලේඛනාරක්ෂණ කටයුතු සංවර්ධනය කිරීමේ කර්තව්‍යයන් (සම්පත් පදනමක් ලෙස) 1988 දී භාර ගන්නා ලදී.
නාරා ආයතනය විසින් ආරම්භයේ සිටම රැස් කරන ලද දහස් ගණනක් වූ ඡායාරූප සහ නෙගටිව් පටි තෝරා වෙන්කොට අංක යොදා ඒ ඒ විෂය හිස අනුව ගොනු කරන ලදී. දැනට එවැනි ගොනු එකතුව 50 කට අධිකව. සියලුම අතීත ප්‍රවෘත්ති සටහන් හා නාරා ආයතනය පිළිබඳ රූප වාහිනියෙන් විකාශණය කරන ලද වෘතාන්ත චිත්‍ර පට සහ ප්‍රචාරකාංග තෝරා වීඩියෝ ලේඛණාරක්ෂා කොට තැබීම සඳහා මිලයට ගැනීමට අදහස් කෙරේ. 1983 සිට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් ප්‍රචාරය කොට හරින ලද සියලුම වැඩ සටහන් නාරා ආයතනයේ නිලධාරීන් විසින් නැවත පටිගත කොට වාර්තා පිටිය තබා ඇත.

1988 ජනවාරි මාසයේ දී මෙම ඒකකය ආරම්භ වීමත් සමගම ත්‍රිකුණාමලයේ ගල් අඟුරු විදුලි බල නිපදවීමේ යෝජනාව ප්‍රකාශ වීම නිසා මත භේදයකට තුඩු දෙන ආන්දෝලනයක් ඇති විය. ගල්අඟුරු ගිනි තැබීම මගින් විදුලිබලය නිශ්පාදනය කිරීමේ දී ශක්‍යතා පරිසරයට සිදුවන හෝ සිදුවිය හැකි හානි, විශේෂයෙන්ම මුහුදු ජීවීන්ට බලපාන ආපදා පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට නාරා ආයතනයට පවරන ලදී.

මෙම මත භේදාත්මක විෂයය පිළිබඳ රූපවාහිනී, ගුවන්විදුලි හා පුවත්පත් ජන මාධ්‍යයන්ට මෙම ව්‍යාප්ති ඒකකය මගින් පසුබිම් තොරතුරු සැපයීමට ද පියවර ගනු ලැබීය. තව ද "විදුලි බලය සඳහා මිලක්: ත්‍රිකුණාමලයේ ගල් අඟුරු විදුලි බලස්ථානය ප්‍රශ්නයට පැති දෙකක්" හෙවත් Price for Power :two sides to the question on Trinco Coal Power/ Station නමැති මීටර් 45 ක කෙටි වෘතාන්ත චිත්‍රපටියක් නිපද වීමට ද මෙම ඒකකය ක්‍රියා කොට ඇත. ඇතුලත උපකරණ නොමැති කමින් මෙම නිශ්පාදනයේ මුද්‍රණයට සකස් කිරීමේ කටයුතු සම්පූර්ණ කළ නොහැකි විය. පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් වීඩියෝ පටි අඩි ගණන නිමවා ඇත.

ජාතික ජලමාන කාර්යාලයේ කාර්යයන්
නාරා/ආ.ක්‍ෂ.ස. මුහුදු පැලෑටි ව්‍යාපෘතිය
ඔබෙල්ලන් වගා ව්‍යාපෘතිය.
ආර්.වී.කොන්රාඩ් යාත්‍රාව.
ආර්.වී. සමුද්‍ර මාරු යාත්‍රාව.

කඩොලාන හා කැස්බෑවන් සංරක්ෂණය පිළිබඳ ජනමාධ්‍ය විස්තර ද ලබා දී ඇත. ඉන්දියන් සාගරයේ සමීක්ෂණ කටයුතුවල යෙදෙන" Joides Resolution නමැති විතණ්ඩවාදිවූ( Sophisticated ) ගැඹුරු ජලයේ හාරන යාත්‍රාවේ සමුද්‍රය හැරීමේ වැඩ සටහන පිළිබඳව පුවත්පත් වලට තොරතුරු සපයා ඇත.

10.3.5 ඉන්දියානු සාගරයේ මුහුදු කටයුතු හා ජලජ සම්පත් ප්‍රවෘත්ති පද්ධතිය ( IOMAARES )

මෙම ප්‍රාදේශීය ප්‍රවෘත්ති පද්ධතිය අයොමැක්(IOMAC ) රටවල් තුලේ මුහුදු කටයුතු හා ජලජ සම්පත් තොරතුරු සැපයීමේ හා දත්ත සැකසීමේ පහසුකම් තුනක් ඇති කරනු ඇත. කොළඹ පිහිටි අයොමැක්( IOMAC ) ලේකම් කාර්යාලය සමග මෙවැනි පහසුකමක් දැනට දියුණු කර ඇති අතර ශ්‍රී ලංකාවේ අයොමැක් ( IOMAC ) යොමු ලක්ෂයය වන නාරා ආයතන යෙහි ඇති ආශ්‍රී පුස්තකාලය මාරිස්( MAARIS ) පුස්තකාලය ලෙස හඳුනාගෙන ඇත. මාරිස් ආයතනයේ ලේඛණ කිරීම් හා පල කිරීම් ඒකකය දැන් අයොමැක් ලේකම් කාර්යාලයට එහි ලේඛන කිරීම හා මුද්‍රණ අවශ්‍යතාවයන් පිළිබඳ සේවා සැපයේ.මෙම වැඩ සටහනට අදාලව ශ්‍රී ලංකාවේ අයොමාරිස්(IOMAARIS ) නිෂ්පන්දයේ නැවත සැකසුම් කිරීමේ ඒකකය ලෙස තව දුරටත් ක්‍රියා කරනුඇත.

අයොමාරිස් ( IOMAARIS ) ආයතනය සඳහා කොම්පියුටර් ගත දත්ත මධ්‍යස්ථානය ඇතුළත දත්ත ලිපිගොනු තබා ගැනීමේ කටයුතු පටන් ගැනීමට අදහස් කරනු ලැබේ. මේ අතර දැනටමත් ඇති කොම්පියුටර් පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් තාරා ආයතනයේම ඒකාබද්ධ කටයුතු කරනු ඇත. ප්‍රදේශයට බෙදා හැරීමට අවශ්‍ය විද්‍යුත් මාධ්‍යයන් මගින් දත්ත ලබාගැනීමට වැඩ සටහන් පිළියෙල කිරීමේ විශේෂඥතාවය/සැලසුම් පද්ධතිය හා පිරිස්බලය උපකරණ ආදිය සම්බන්ධවූ හැකියාවන් මාරිස් ( MAARIS ) ආයතනයට දැනටමත් ඇත. සංඛ්‍යාමය දත්ත සැකසීමේ පහසුකම් සහ වැඩ පාලක පහසුකම් ඇති UNESCO/CDS/ISIS වැනි අන්තර් ජාතික වශයෙන් පිළිගත් සැහැල්ලු භාණ්ඩ මාරිස් ආයතනයේ ග්‍රන්ථ විඥානාත්මක දත්ත මූලස්ථානය විසින් භාවිතා කරනු ලබයි. තාරා ආයතනයේ පිහිටුවා ඇති මාරිස් දත්ත මධ්‍යස්ථාන සැලැස්මේ යන්ත්‍රය තුළට පණයක් ඇතුල් කිරීමේ අවස්ථාවේ සිට ඒ ඒ ප්‍රදේශයන් වෙත ප්‍රවේශ වීම හා බෙදා හැරිය යුතු වන්නා වූ ආකාරයට ප්‍රතිපාදන යන්ත්‍ර පද්ධතියේ සලසා ඇත.

කෙලින්ම අයොමැක් ලේකම් කාර්යාලය හා සංයුක්තව මෙහෙයුම්වල යෙදෙන තාරා ආයතනයෙහි පිහිටි වැඩ ජාලකයේ නිශ්පාදනය වූ මාරිස් ආයතනය සම්පූර්ණ මෙහෙයුම් තත්ත්වයට පත්වූ විට තොරතුරු හුවමාරු කිරීම් වලදී හා ආශ්‍රි කටයුතු වලදී "ස්විච්/ පුවිරුවක්" ලෙස ක්‍රියා කරනු ඇත.

මෙය [illegible] එහි ඇතුලත ප්‍රාදේශීය ග්‍රන්ථ විඥානාත්මක දත්ත ගොනුව සියලුම අයොමැක් රටවල් වලින් ලැබෙන ප්‍රකාශණවල ආශ්‍රි සංකේතයන්ගෙන් සමන්විතය. දැනට තාරා ආයතනයේ සකස් වෙමින් පවතින විශේෂඥයන්ගේ නාමාවලියක් ද සහිත කවත් දත්ත ගොනු කිහිපයක් ස්ථාපිත කරනු ඇත.

මෙ මගින් කෙළින්ම ප්‍රදේශයේ දත්ත ලබා ගැනීමට හා ප්‍රකාශණ වලට තොරතුරු ලබාකරවීමේ හැකියාව තාරා/ආයතනයට හා ශ්‍රී ලංකාවට ලැබෙන අතර දැනට තිබෙන පුස්තකාලය තත්ත්වයෙන් හා ප්‍රමාණයෙන් ශක්තිමත් කිරීමට හා උසස් කිරීමට අවශ්‍ය තොරතුරු පහසු කම් ද අතියම් වශයෙන් ලැබේ.

## සම්මන්ත්‍රණ, අධ්‍යයනචාරිකා හා පුහුණු වැඩ සටහන්

1.0 මුහුදු ජීව විද්‍යාත්මක සම්පත් අංශය.

1988 ජනවාරි මස 15 සිට පෙබරවාරි 11 දින දක්වා නාරා ආයතනයෙහි පැවැති මසුන් තොග තක්සේරු කිරීම පිළිබඳ FAO/DANIDA/NARA පුහුණු පාඨමාලාවට මෙම අංශයේ සියලුම නිලධාරීහු සහභාගී වූහ.

1988 මැයි මස 09 වැනි දින සිට 11 දින දක්වා නාරා ආයතනයෙහි " ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ TCP/SRL/6653 ටූනා මසුන් සඳහා වූ ධීවර ගවේෂණ" යන මැයෙන් පැවැති සමාලෝචන රැස්වීමට ආචාර්ය පී. දයාරත්න, ආර්. මල්දෙණිය මහත්මිය හා ජේ. ඒ. ද සිල්වා යන නිලධාරීහු සහභාගී වූහ.

ඉංදියාවේ ඔරිස්සාවේ 1988 ජනවාරි 11 සිට 15 දින දක්වා පැවැති බෙන්ගාල බොක්ක පිළිබඳ 12 වැනි උපදේශක කමිටු රැස්වීමට ආචාර්ය පී. දයාරත්න සහභාගි විය.

1988 ජූනි 22 සිට ජූලි 01 දින දක්වා මොරිසියස් හි පැවැති ඉංදියානු සාගරයේ ටූනා මසුන් පිළිබඳ තොග තක්සේරු කිරීමේ "විශේෂඥ සාකච්ඡා හමුවට හා දසවැනි IOFC සැසි වාරයට ද ආචාර්ය පී. දයාරත්න හා ජේ. ඒ. ද සිල්වා මහතාත් සහභාගීවූහ.

ඩී. එස්. ජයකොඩි මහතා පශ්චාත් උපාධි අධ්‍යයනයක් සඳහා 1988 සැප්තැම්බර් මාසයේ දී එක්සත් රාජධානියට යන ලදී.

1988 නොවැම්බර් 21 දින සිට 23 දින දක්වා කොළඹ පැවැති තුන්වෙනි අයොමැක් ( IOMAC ) ස්ථාවර කමිටුවේ රැස්වීමට ආචාර්ය පී. දයාරත්න හා ජේ. ඒ. ද සිල්වා මහතාත් සහභාගී වූහ.

2.0 මිරිදිය ජලජ සම්පත් ශාඛාව.

1988 සැප්තැම්බර් 26 - 30 දින දක්වා ටෝකියෝ නුවර පැවැත් වූ ජලජ වගාවන් පිළිබඳ සමීක්ෂණය කිරීමේ කාර්ය භාර පක්ෂයේ රැස්වීමට පි. පී. ජී. ඇස්. ඇන්. සිරිවර්ධන මහතා සහභාගී විය.

1988 ජූනි මස බැංකොක් හි පැවැති තුන්වෙනි ජාත්‍යන්තර පෝෂණදායී වැඩ මුළුවට ඇම්. ඇම්. කුරුප්පු මහත්මිය සහභාගී වූවාය.

1988 ජූනි සිට 1989 පෙබරවාරි දක්වා එක්සත් රාජධානියේ ස්ටර්ලිං විශ්ව විද්‍යාලයේ 09 මසක ආචාර්ය උපාධි අධ්‍යයනයක් ජේ. එම්. පී. කේ. ජයසිංහ මහතා අවසාන කරන ලදී.

1988 ජනවාරි 15 දින සිට පෙබරවාරි 11 දින දක්වා කොළඹ පැවැති මසුන් තොග තක්සේරුව කිරීමේ පුහුණු වැඩසටහනකට( FAO/DANIDA/NARA) ඇම්.ඇම්.කුරුප්පු මහත්මිය,ඇස්.සී.ජයමාන්න මහත්මිය,යූ.අමරසිංහ මහතා සහ ජේ.ඒ.ද සිල්වා මහතාත් සහභාගී වූහ.

ශ්‍රී ලංකාවේ මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය සඳහා නවීකරණ ප්‍රවේශ නිර්දේශ කිරීමට පත් කරන ලද කමිටුවට නාරා ආයතනය නියෝජනය කරන ලදී.

3.0 පෙර අස්වනු තාක්ෂණ ආයතනය.

1988 අප්‍රේල් 19 - 21 දක්වා තායි ලන්තයේ බැංකොක් නුවර පැවැති මසුන් හා තාක්ෂණය හා අලෙවිය පිළිබඳ ඉන්දු - පැසිපික් ධීවර කොමිෂමේ වැඩ කාර්ය කණ්ඩායමට ආචාර්ය ඇස්.සුබසිංහ,වී.ජයවීර මහත්මිය හා නාලිනි චිතිවාසගම් මෙනෙවිය ද සහභාගී වූහ.

4.0 ඉංජිනේරු හා තාක්ෂණික අංශය.

1988 නොවැම්බර් 21-24 දින දක්වා නිව්-පවුන්ඩ්ලන්තයේ පැවැති ධීවර ආම්පන්න හා ධීවර යාත්‍රා සැලසුම් පිළිබඳ ලෝක සමුළුවට ඇස්.ඇල්.සුරවීර මහතා සහභාගී විය.

5.0 සමුද්‍ර විද්‍යා අංශය.

කොලොම්බියාවේ කාර්ටෙගොන් නුවර ගැඹුරු මුහුදේ මංචක තැනීමේ සති හතරක පුහුණු වැඩ සටහනට හා එක්සත් ජාතීන්ගේ මුහුදු කාර්යාල නීතිය පිළිබඳ වැඩ සටහනට ඩියුලිප් ජනවර්ධන මහතා සහභාගී විය.

1988 ජූනි මස බංග්ලා දේශයේ ඩැකා නුවර පැවැති දුරස්ථ ග්‍රහණය කිරීමේ සති 03 ක පුහුණු පාඨමාලාවට ආචාර්ය පී.රණතුංග සහභාගී විය.

1988 ජූලි මස පකිස්ථානයේ කරච්චි නුවර,ඉන්දියන් සාගරයේ වෙරළට ඔබ්බෙන් බලාපොරොත්තු තැබිය හැකි ඛනිජ සම්පත් පිළිබඳව පැවැති සතියක රැස්වීමකට ආචාර්ය ඇස්.වික්‍රමරත්න මහතා ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී.

1988 ජූනි මස පකිස්ථානයේ ඉස්ලාමාබාද් නුවර පැවැති මධ්‍යම ඉන්දියන් සාගරය සඳහා වූ IOC ප්‍රාදේශීය කමිටුවේ දින 03 ක පළමු ප්‍රාරම්භක රැස්වීමට මුහුදු විද්‍යා විශේෂඥ යකු වශයෙන් සහභාගී වීම සඳහා IOC විසින් ආචාර්ය ඇස්.වික්‍රමරත්න මහතාට ඇරයුම් කරන ලදී.
ඇන්.පී.විජයානන්ද මහතා 1987 ඔක්තෝබර් 15 සිට 1988 ඔක්තෝබර් 15 දක්වා පළමු වසරේ පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා ලංඩනයේ ඉම්පීරියල් විද්‍යාලයේ ගත කරන ලදී.

6.0 ජාතික ජලමාන කාර්යාලය.

ජපානයේ අන්තර් ජාතික සහයෝගිතා ඒජන්සිය විසින් සංවිධානය කළ ටෝකියෝ නුවර ජලමාන අංශයේ මාස 3 1/2 ක නාවුක සටහන් පාඨමාලාවකට සහභාගී වීම සඳහා එස්.ඩබ්ලිව්.ඇස්. විජේසිංහ මහතා ජපානයට යන ලදී.
ආතර් සී.ක්ලාක් මධ්‍යස්ථානයේ අනුග්‍රහයෙන් දුරස්ථ ගෝචර ග්‍රහණයක්( Remote Sluging ) සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ පැවැති වැඩ මුළුවකට එස්.ඩබ්.එස්. විජේසිංහ මහතා සහභාගී වීය.

ආකාශ වස්තු දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලද නිවර්තන වා සුළිය පිළිබඳ සම්මන්ත්‍රණයකට එස්.විතාන මහතා සහභාගී විය.

කොළඹ සී.ස. ටේටෙක්ස්ට්(පෞ) සමාගමේ "මේසය මත තැබිය හැකි ප්‍රචාරක පද්ධතිය" පිළිබඳ දෙසතියක පුහුණු පාඨමාලාවකට පී.බී.රත්නපාල මහතා සහභාගී විය.

7.0 පාරිසරික අධ්‍යයන ශාඛාව.

1988 පෙබරවාරි 09-13 දින දක්වා යුනෙස්කෝ සහ සී.ඊ.ඒ.( UNESCO & CEA ) මගින් පවත්වන ලද පාරිසරික අධ්‍යාපන සම්මන්ත්‍රණයකට ආචාර්ය රවී පෙරේරා සහභාගී වීය.
1988 පෙබරවාරි 19 දින නරේසා ( NARESA ) ආයතනයෙහි පැවැති "පර්යේෂණ හා සංවර්ධන උත්සාහය අගැයීම" යන මැයෙන් පැවැති සම්මන්ත්‍රණයට ආචාර්ය පී.ද අල්විස් සහභාගී වූවාය.

1988 ඔක්තෝබර් 10 සිට දෙසැම්බර් 16 දින දක්වා මලයාසියාවේ ක්වාලාලම්පූර් නුවර පැවැති මුහුදු කටයුතු පිළිබඳ අයොමැක්( IOMAC-IOI ) පුහුණු වැඩ සටහනට ආචාර්ය පී.ඊ.ද අල්විස් සහභාගී වූවාය.

මාර්තු මාසයේ දී පැවැති ගුවන් විදුලි සාකච්ඡාවක දී ගංගා අපවිත්‍ර වීම හා මසුන්ට වැළඳෙන ව්‍රණමය රෝගය( UFD ) පැතිරයාම පිළිබඳව ආචාර්ය පී.ඊ.ද අල්විස් ගෙන් අදහස් විමසන ලදී. මෙම සාකච්ඡාවට සහභාගී වූ අනිකුත් අය ආචාර්ය උපාලි සේනානායක, ආචාර්ය යූ.පෙරේරා මෙනෙවියන්ය.

ත්‍රිකුණාමලයේ පිහිටුවීමට අදහස් කරනු ලබන ගල් අඟුරු විදුලි බලස්ථානය පිළිබඳව ද මාර්තු මාසයේ දී සී.ස.පාරිසරික පදනමේ ලලතාන් ද සිල්වා මහතා ගෙන් ද කරුණු විමසන ලදී.

8.0 පරිසර පද්ධති අධ්‍යයන අංශය

1988 ඔක්තෝබර් 10 සිට දෙසැම්බර් 18 දින දක්වා මලයාසියාවේ ක්වාලාලම්පූර් නුවර මුහුදු කටයුතු පිළිබඳ අයොමැක්- අයි.ඕ.අයි( IOMAC= IOI ) පුහුණු පාඨමාලාවකට ඒ. රාජසූරිය මහතා සහභාගී වීය.

10.0 ප්‍රවෘත්ති අංශය.

1988 මාර්තු 4 - 7 දින දක්වා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේදී පවත්වන ලද මාරිස්(MAARIS ) දත්ත මධ්‍යස්ථානය සඳහා වූ යුනෙස්කෝ සංවිධානය විසින් නිර්මාණය කරන ලද CDS/ISIS සැකැල්ලු උපකරණ භාවිතය පිළිබඳව පුහුණු වැඩ මුළුවකට ඇල්.බණ්ඩාරණායක මහත්මිය සහභාගී වූවාය.

1988 ඔක්තෝබර් 5 - 7 දින දක්වා මදුරාසියේ පැවැති BOBP ආයතනය මගින් සංවිධානය කරන ලද කුඩා පරිමාණයේ මසුන් කර්මාන්තය සඳහා දත්ත සහ පළපුරුද්ද මගින් ආධාර සැපයීමත් තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සමුපකාර වැඩ සටහන් ශක්තිමත් කර ගැනීමට ක්‍රම හා උපක්‍රම කවරේදැයි හඳුනා ගැනීමටත් ධීවර තොරතුරු පිළිබඳ ප්‍රාදේශීය උපදේශක සමුළුවකට ඇල්.බණ්ඩාරණායක මහත්මිය සහභාගී වූවාය.

1988 ජූනි 09 සිට අගෝස්තු 19 දින දක්වා හැලිෆැක්ස් නුවර පැවැති තනි ආර්ථික කලාපයේ මුහුදු සම්පත් කළමනාකරණය පිළිබඳව IOI පුහුණු වැඩ සටහනට මයිකල් බෙරෙන්ජර් මෙනෙවිය සහභාගී වූවාය.

1988 ජූලි 26 සිට අගෝස්තු 22 දින දක්වා හැලිෆැක්ස් නුවර පැවැති 'Pacen in Maribus නම් සම්මන්ත්‍රණයට එම්.බෙරෙන්ජර් මෙනෙවිය සහභාගී වූවාය.

1988 අගෝස්තු 31 දින සිට සැප්තැම්බර් 16 දින දක්වා සිංගප්පූරුව, ජිනීවා, එක්සත් රාජධානිය හා නිව්යෝර්ක් නුවර යන රටවල අධ්‍යයන චාරිකාවක් සඳහා ඇම්.බෙරෙන්ජර් මෙනෙවිය ගියාය.

1988 ජූලි 11 - 15 දක්වා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනුග්‍රහයෙන් පැවැති පුස්තකාල දත්ත ස්ථාන සඳහා වූ CDS/ISIS සැකැල්ලු උපකරණ භාවිතය සඳහා පුහුණුවක් ලොයිඩ් විජේසූරිය මහතා විසින් ලබා ගන්නා ලදී.

1988 ජූලි 5 - 6 දක්වා ධීවර නිෂ්පාදන අපනයනය පිළිබඳ "අලෙවි සහ තාක්ෂණික නියමයන්" පිළිබඳ ඉන්ෆෝෆිෂ්(කේ.එල්)( Infofish (KL) අපනයන සම්මන්ත්‍රණ මණ්ඩලයේ සම්මන්ත්‍රණයට ගයත්‍රී පත්මපෙරුම මෙනෙවිය සහභාගී වූවාය.

1988 සැප්තැම්බර් 09 දින ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අනුග්‍රහයෙන් "තොරතුරු තාක්ෂණය" යන මැයෙන් පැවැති එක් දින සම්මන්ත්‍රණයට ලොයිඩ් ජයසූරිය හා යසසිරි ජානක කුමාර යන මහත්වරු සහභාගී වූහ.

50 ......

ප්‍රකාශණ වාර්තා:

ඉදිරිපත් කරන ලද ලේඛණ හා සලසන ලද සේවා ආදිය.

1.0 මුහුදු ජීව විද්‍යාත්මක සම්පත් අංශය.

පී. දයාරත්න -1988 ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළේ පසුම්බි දැල් මගින් කුඩා සාමුද්‍ර මත්ස්‍ය සම්පත් උපයෝජනය

1988 ජනවාරි 12 -16 දක්වා ඉන්දියාවේ කොචින් නුවර පැවැති නිවර්තන මුහුදු ජීවී සම්පත් යන මැයෙන් වූ සමුළුවේ වාර්තාවකි.

පී. දයාරත්න සහ
ආර්. මල්දෙණිය 1988 ශ්‍රී ලංකාවේ ටූනා ධීවර කර්මාන්තයේ තත්ත්වය.

1988 ජූනි 22 - 27 දක්වා පැවැති ඉන්දියානු සාගරයේ මොරිෂියස් දූපත්වල ටූනා තොග තක්සේරුව පිළිබඳ පැවැති විශේෂඥ උපදේශක රැස්වීමේ වාර්තාවකි.

පී. දයාරත්න - ( තවමත් මුද්‍රණයේ)
ශ්‍රී ලංකා ආසියානු ධීවර පර්යේෂණ සඟරාවේ "සමහර ක්ලිපිඩි වර්ගවල ශ්‍රෝත්‍රශ්මයෝ ( Octolita )
ප්‍රාථමික වැඩීම "

පී. දයාරත්න -(තවමත් මුද්‍රණයේ.) ශ්‍රෝත්‍රශ්මයේ(Octolita )දෛනිකව වළලු යොදා කිරි මසුන්ගේ වැඩීම හා ආයුෂ බැලීම.

ශ්‍රී ලංකා ධීවර අමාත්‍යාංශයේ මිරිදිය ධීවර කර්මාන්තය සඟරාවෙනි.

පී. දයාරත්න - ශ්‍රී ලංකාවේ නිරිත දිග වෙරළෙහි ( Walbanm )
හෙවත් Amblygaster Sirm මසුන්ගේ තොග තක්සේරු කිරීම.

ජපානයේ ටෝකියෝ නුවර 1989 අප්‍රේල් 17 -22 දක්වා පැවැති දෙවෙනි ආසියානු ධීවර සම්මේලනයේ දී ප්‍රකාශයට පත්කළ යුතු කෘතියක් ලෙස පිළිගත් එකකි.

පී. දයාරත්න - ශ්‍රෝත්‍රශ්මයේ( Octolita ) වළලු යොදා ගනිමින් Ruppel හෙවත් Stokphorus Heterolobus නම් ජීවියාගේ වැඩීම හා වයස දැන ගැනීම.

1989 අප්‍රේල් 17 - 22 දක්වා පැවැති දෙවෙනි ආසියානු ධීවර සම්මේලනයේ දී පළ කළයුතු කෘතියක් ලෙස පිළි ගන්නා ලදී.

එස්.ජේ.සී.ජයවික්‍රම සහ
ඩී.එස්.ජයකොඩි -1988-
ශ්‍රී ලංකාවේ තිරිත දිග වෙරළබඩ ( H. Milni Edwards) Penaeus Indieus ) නම් ජීවියාගේ ජනගහන ගතිකයන්.

ඉන්දියාවේ මුහුදු විද්‍යාත්මක සංගමයේ රැස්වීමේ වාර්තාවකි.

එස්.ජේ.සී.ජයවික්‍රම -1988 -
ශ්‍රී ලංකාවේ පොකිරිස්සෝ Pann Lirus honarus , හෙවත් Linnaeus ජීවියාගේ ධීවර ජනගහණ ගතිකයන් පිළිබඳ කරුණු සම්භාරයක්.

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 44 වෙනි වාර්ෂික සැසි වාර යට ඉදිරිපත් කරන ලද්දකි. ප්‍රසිද්ධ කිරීමට සුදුසු වන්නේ දැයි සලකා බැලීම සඳහා ආසියානු ධීවර විද්‍යායතනයට ඉදිරිපත් කරන ලද්දකි.

එස්.ජේ.සී.ජයවික්‍රම සහ
ඩී.එස්.ජයකොඩි - 1988 -
මීගමුව හා හලාවත ඉස්සන් ධීවර කර්මාන්තයේ තත්ත්වය.

නාරා ආයතනයේ සභාපති මගින් ධීවර අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලදී.

ඩබ්.පී.ආන්.කරුණාසිංහ -
ශ්‍රී ලංකාවේ තිරිත දිග වෙරළබඩ වැල්ලේ මා දැල් ධීවර කර්මාන්තයේ තත්ත්වය.

1988 ජනවාරි 12 -16 දක්වා ඉන්දියාවේ කොචින් නගරයේ පැවැති නිවර්තන මුහුදු ජීව් සම්පත් පිළිබඳ සම්මේලනයේ වාර්තාවකි.

2.0 මිරිදිය ජලජ සම්පත් අංශය .

යූ.එස්.අමරසිංහ -1988.
ශ්‍රී ලංකාවේ ජලජ ධීවර කර්මාන්තයේ වර්ධනය වියහැකි භයානකකම.
ආසියාවේ මිරිදිය ජලාශ ධීවර කළමනාකරණය හා සංවර්ධනය (ඇස්.ඇස්.ද සිල්වා මුද්‍රණය)
පිටු 105 - 115 කැනඩාවේ ඔට්ටාවා නුවර IDRC ආයතනයේ ප්‍රකාශණයකි.

යූ.එස්.අමරසිංහ - 1988 -
ශ්‍රී ලංකාවේ ජලාශවල කළමණාකරණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී ධීවරයාගේ කාර්ය භාරය.
කැනඩාවේ ඔට්ටාවා නුවර IDRC ආයතනයේ ප්‍රකාශණයක් වන ආසියාවේ මිරිදිය ධීවර කළමනාකරණය හා සංවිතය.
( ඇස්.ඇස්. ද සිල්වා මුද්‍රණය ) පිටු.158 - 163.

යූ.එස්.අමරසිංහ - 1988 -
ශ්‍රී ලංකා මිනිස් ශ්‍රමයෙන් තැනූ වැවක යුදුසු සිදුරු ප්‍රමාණයෙන් යුතු කරමලදැල් භාවිතා කරන Oreo( )mis Mossambicus (Peters) ධීවර කර්මාන්තය.
ආසියානු ධීවර විද්‍යා 2:000 -000.

යූ.එස්.අමරසිංහ සහ
ජේ.ඇල්.සමරකෝන් - 1988
ශ්‍රී ලංකාවේ මිනිස් ශ්‍රමයෙන් තැනූ වැව්වල කරමල දැල් භාවිතයෙන් අල්ලාගත් සික්ලිඩ( Cichlid , ) වර්ග හෙවත් Etrpplus suratensis සහ Tilapia Rendalli මසුන් ආයතත්ත්වයන්ට බලපාන සාධක සමහරක්.
ආසියානු ධීවර විද්‍යා - 2 : 00 - 00
මයික්‍රොස්පොරිඩියම් තෙලෝහාමියා එස්.පී.Microsporidium Thelohamia SP)Microssporida( Nosematidae මගින් චෙරෙක්ස් කොඩ්රිකාරිනේටස් Cherax quadricarinatus ) හෙවත් Deca poda Paratacidae නම් රෝගය වැළදීම.
( Brett Herbert ගේ මත්ස්‍ය රෝග සඟරාව 11 පිටු 301 -308 )

53 .......

ඇම්.අමරසිංහ – ශ්‍රී ලංකාවේ තිරිත දිග කඩොලාන පරසර පද්ධතියේ තෝරා ගත් කඩොලාන ප්‍රදේශවල මිනිස් ප්‍රජාවේ සමාජ ආර්ථික තත්ත්වය UNDP / UNESCO ආයතනයේ ප්‍රාදේශීය කඩොලාන ව්‍යාපෘතියේ ප්‍රචාරක පත්‍රිකා අංක.3

ඩබ්ලිව් ඇම්.ටී.බී.වන්නිනායක හා
ඒ.ඒ.ඩී.ඇස්.කුමාර – ශ්‍රී ලංකාවේ දුඹුරු මට්ටි ( Perna Perna Linnasus පහුරු වගාව පිළිබඳ ගවේෂී අධ්‍යයනය.

ජපානයේ ටෝකියෝ නුවර පැවැති 2 වැ නි ආසියානු ධීවර සම්මේලනයේ ප්‍රකාශණයකි.

ඇස්.සිරිවර්ධන,
පී.පී.ජී.ඇස්.ඇන්.සිරිවර්ධන
සහ
ආර්.පී.කේ.තිස්ස – බොල්ගොඩ වැවේ සමහර ජලජ ජීවී විද්‍යාත්මක තත්ත්වයන්ගේ දෛනික හා වාරකාල වෙනස්වීම්.
( මිරිදිය ධීවර කර්මාන්ත සඟරාවේ IV - සඳහා පල කිරීමට පිළිගනු ලැබූවකි.)

පී.පී.ජී.ඇස්.ඇන්.සිරිවර්ධන– ශ්‍රී ලංකාවේ කොටුවල ක්ෂීරපායි මසුන් වගාව- ආර්ථික කරුණු කිහිපයක් හා නිර්දේශ.
(1989 අප්‍රේල් මස දී පැවැත්වෙන දෙවෙනි ආසියානු සම්මේලනයට ඉදිරි පත් කිරීමට පිළිගන්නා ලදී.)

වා ර් තා.

ජලජ වගාවන් සඳහා භාවිතයට Perionyx excavata පිළිබඳ තක්සේරුවක් 1988 ජුනි 23 දින ඉදිරිපත් කරන ලදී.

3 වැනි කාර්තුව සඳහා කාර්තු ප්‍රගති වාර්තා.

මාසික වාර්තා 09 ක් සකස් කොට සභාපතිට, අධ්‍යක්ෂ ජනරාල් වෙත ස්ථාන භාර නිලධාරී/ IARD වෙත හා මහාචාර්ය එච්.එච්.කොස්තා මයා වෙත භාර දෙන ලදී.

වැඩ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තා අධ්‍යක්ෂ ජනරාල් වෙත දෙසැම්බර් 26 දින ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ මෘද්වංගියා ( Molluse ) වගාව පිළිබඳ වාර්ෂික වාර්තාව- කැනඩාවේ IDRC වෙත ඉදිරිපත් කරන ලදී.

54 ......

ත්‍රිකුණාමල තාප විදුලි බලාගාර III අදියර පිළිබඳ ජීව විද්‍යාත්මක අංශවලට අදාල වාර්තාව.

පුත්තලම් කලපුවේ විවිධ මසුන් වර්ගකොට වගා කිරීම පිළිබඳ වාර්තාව.

කඩුවෙල පිහිටි අතහැර දමා තිබෙන මැටි වලක සුරතල් මසුන් බෝ කිරීම හා ඇති කිරීම ද පිරිසිදු ජලයේ ඉස්සන් බෝ කිරීම ද ගැන යෝග්‍යතා තක්සේරු කිරීම පිළිබඳ වාර්තාව.

නිරෝධායන කමිටු වාර්තාව පිළියෙල කිරීම.

සුරතල් මසුන් වගා කිරීම - හේතු පිළිබඳ රෝග ගැටළු සම්බන්ධ දේශණය සකස් කිරීම.

මසුන්/ ඉස්සන්ගේ සෞඛ්‍ය පිළිබඳ සුරතල් මසුන් ඇති කරන්නන් හට හා ඉස්සන් ඇති කරන්නන්ට උපදෙස් සේවාවක් සැලසීම.

ශ්‍රී ලංකාවේ ව්‍රණමය මසුන් රෝග ( UFD ) පැවතීම.

බත්තරමුල්ල ප්‍රදේශයේ මදුරුවන් පාලනය පිළිබඳ වාර්තාව.

මීගමු කලපුවේ කල මී( Mullet ) පැටව් පිළිබඳ සමීක්ෂණය.

නිතලවාසීහු ( Benthos ) පිළිබඳ අධ්‍යයනය .

IPTP/NARA ආයතනවල ටූනා සාම්පල වැඩසටහන අධීක්ෂණය.

රතු තිලාපියා ව්‍යාපෘතිය.

පුත්තලම් කලපුවේ නියාමක ප්‍රමාණයේ මුහුදු පැලැටි අරණක් පිහිටුවීම හා මෙහෙයුම් කිරීම.

ටුවුට් මසුන් කර්මාන්තය සඳහා සුදුසු ස්ථාන සකස් කිරීම.

ඊඩීබී/ඇන්ඩීබී(EDB/NDB ) අදියර I.

පරාක්‍රම සමුද්‍රයේ ජලාශ ධීවර කළමනාකරණ ව්‍යාපෘතිය I වාර්තාව මාර්තු 1988.

ශ්‍රී ලංකාවේ ජලාශයන් හි ධීවර කර්මාන්ත කළමනාකරණය පිළිබඳ නිර්දේශ - 1988 මාර්තු.

මාදුරු ඔය ජලාශයේ ධීවර කර්මාන්තය පිළිබඳ වාර්තාව 1988 දෙසැම්බර්.

සුරතල් මසුන් කර්මාන්තය විශේෂකොට, වෙත්තප්පුව රජයේ උප දිසාපති කොට්ඨාශයේ මත්ස්‍යවගාව සඳහා මැටිවලවල් යොදා ගැනීමේ යෝග්‍යතා සමීක්ෂණ වාර්තාව.

සීමා සහිත ලීවර් ජලජ නිශ්පාදන සමාගමට උපදෙස්/අත්හදා බැලීමේ සේවා පිළිබඳ වාර්තාව.

කල්පිටිය කලපුවේ කකුළුවන් වගා කටයුතු තර කිරීමේ ව්‍යාපෘතිය - යෝගයතා අගැයීම.

3.0 පෙර අස්වනු තාක්ෂණික අංශය.

1988 අප්‍රේල් මස තායිලන්තයේ බැංකොක් නුවර මත්ස්‍ය තාක්ෂණය හා අලෙවිය පිළිබඳ ඉන්දු -පැසිපික් ධීවර කොමිෂමේ කාර්ය කණ්ඩායමට පහත සඳහන් ලේඛණ ඉදිරිපත් කරන ලදී.

වී.ජයවීර සහ
එස්.සුබසිංහ - ශීතකළ ගබඩාවල ඉස්සන් තැබූවිට ඇතිවන රසායනික හා මයික්‍රො ජීව විද්‍යාත්මක වෙනස් කම් සමහරක්.

වී.ජයවීර සහ
එස්.සුබසිංහ - ශ්‍රී ලංකාවේ ඉස්සන් සැකසුම් කාලසීමාවන් තුළ සිදුවන මයික්‍රො ජීව විද්‍යාත්මක වෙනස්කම්.

එච්.එන්.චිනිවාසගම්,
එස්.සුබසිංහ සහ
පී.සී.විදානපතිරණ- රික්ත ඇසුරුම් කළ,රශ්මිය ජීවානුහරණය කළ, කාපු පිළිවෙලට තැබූසාඩින්( Amblygastar Sirm පරිසරයේ ශීතෝෂ්ණ ප්‍රමාණයට ගබඩා කිරීම.

ඇස්.සුබසිංහ සහ
ඇම්.කේ.ඩබ්.පෙරේරා - Oreochromis Niloticus නම් මත්ස්‍යයාගේ මස් ගැලවීමේ ක්‍රම තුනකින් අතින් ගැලවීම,පතුරකින් ගැලවීම හා යාන්ත්‍රිකව කටුවෙන් ගැලවීම.

ටී.පී.එස්.පොන්සේකා
සහ
පී.එස්.විදානපතිරණ- මීගමු ඈත මුහුදෙන් අල්ලාගනු ලබන Penacus Indicus හෙවත් කූනිස්සාගේ බැක්ටීරියා සෑදීමේ විපබීජ කාරකය පිළිබඳ අධ්‍යයනයක්.

ටී.පී.එස්.පොන්සේකා- Penacus Monodon හෙවත් පොකුණුවල වගා කළ ඉස්සන්ගේ විෂ බීජ දායක කුඩා ශාඛ.

5.0 ජලමාත අංශය.

ඩබ්.ඇස්.වික්‍රමරත්න – 1988 අංක1 වෙළුම 16 "කර්මාන්ත" සඟරාවේ – ශ්‍රී ලංකාවේ ඈත මුහුදේ ඛනිජ තැන්පතු.

ඩබ්.එස්.වික්‍රමරත්න – ශ්‍රී ලංකාවේ මුහුදු විද්‍යාව– අතීතය, වර්තමානය හා අනාගතය – ශ්‍රී ලංකා භූ විද්‍යා සමිතිය. වෙළුම 1 අංක.2 1988.

ඩබ්.එස්.වික්‍රමරත්න – ශ්‍රී ලංකාව අවට ඛනිජ ද්‍රව්‍ය 1988 වෙළුම 1– රසායන විද්‍යා ආයතනයේ සඟරාව.

ඩබ්.එස්.වික්‍රමරත්න – ශ්‍රී ලංකාවේ බටහිර මහා ද්වීපික තීරුවේ පතුලෙන් ලබා ගත්තා මඬ්ඩි– චීනයේ ෂැන්ගයි නුවර ආසියානු මුහුදු භූ විද්‍යා පිළිබඳ පළමු අන්තර් ජාතික සම්මන්ත්‍රණයේ වාර්තා ආශ්‍රයෙනි.

ඩබ්.එස්.වික්‍රමරත්න – ශ්‍රී ලංකාවේ ඈත මුහුදේ බලාපොරොත්තු විය හැකි ඛනිජ සම්පත –1988 වෙළුම 2 ( IOMAC ) වාර්තා ඇසුරිනි.)

ඩබ්.එස්.වික්‍රමරත්න – ශ්‍රී ලංකාවේ බටහිර මහා ද්වීපික මංවයේ භූ රූපක ලක්ෂණ– 1988 ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 44 වැනි වාර්ෂික සැසි: වාරයේ වාර්තා ඇසුරිනි.

(×)

ඩබ්.එස්.වික්‍රමරත්න – ශ්‍රී ලංකාවේ ඈත මුහුදේ බලාපොරොත්තු විය හැකි ඛනිජ ද්‍රව්‍ය. 1988 ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 44 වැනි වාර්ෂික සැසි වාරයේ වාර්තා ඇසුරිනි.

ඩබ්.එස්.වික්‍රමරත්න සහ ධර්මරත්න – කල්පිටිය හා උඩප්පුව අතර මහා ද්වීපික මංවයේ නොගැඹුරු දියේ කාබනේට් කොටස් – 1988 ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 44 වැනි වාර්ෂික සැසි වාරයේ වාර්තා ඇසුරිනි.

(×)ඩබ්.ඇස්.වික්‍රමරත්න– ශ්‍රීලංකාවේ බටහිර මහා ද්වීපික මංවයේ මංඩි – 1988 ශ්‍රී ලංකා විද්‍යාභි වර්–ධන සංගමයේ 44 වැනි සැසිවාරයේ වාර්තා ඇසුරිනි)

| | |
|---|---|
| ඩබ්.එස්.වික්‍රමරත්න සහ ඇන්.පී.රජතුංග | - ශ්‍රී ලංකාවේ බටහිර වෙරළබඩ තෝරාගත් මෝයකට ස්ථානවල ජලමාන හා මුහුදු විද්‍යාව පිළිබඳ **විපයක** අධ්‍යයනයක්.<br>1988 ශ්‍රී ලංකා විද්‍යාභාවර්ධන සංගමයේ 44 වැනි සැසි වාරයේ වාර්තා ඇසුරිනි. |
| ඩබ්.එස්.වික්‍රමරත්න | - 1988 ශ්‍රී ලංකාවේ ජාතික සිතියමේ වෙරළෙන් ඔබ්බෙහි ප්‍රදේශ. |
| ඩබ්.එස්.වික්‍රමරත්න | - ඈත මුහුදෙන් ලබා ගත හැකි ඛනිජ සම්පත් සඳහා වූ IOMAC තාක්ෂණික කණ්ඩායමේ පළමුවැනි රැස්වීම - 1988 දෙසැ. අංක 3 හා වෙළුම 5 දරන ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක සංගමයේ ප්‍රවෘත්ති ලිපිය. |
| ඇන්.පී.විජයනන්ද | - 1988 ජනවාරි - භූ වේලා සමකය පිළි-බඳව නිරීක්ෂණය කළ හිමාලයානු උත්ක්ෂිප්ත ඉතිහාසය. |
| ඇන්.පී.විජයනන්ද | - දියුණුවන රටවල භූ විද්‍යාව යොදා ගැනීම පිළිබඳ සංවර්ධන සම්මන්ත්‍රණයේ භූ විද්‍යාවන්හි සමුද්‍ර කැනීමේ වැඩ සටහන ද සමග සංවර්ධන වන රටවල් සහභාගීවීම පිළිබඳව ඉදිරිපත්කළ කෘතියක උද්ධෘතයකි.<br>1988 සැප්.මාසයේ එංගලන්තයේ නොටිංහැම් විශ්ව විද්‍යාලය. |
| ඇන්.පී.විජයනන්ද | - ලන්ඩනයේ ඉම්පීරියල් විද්‍යාලයට ඉදිරිපත් කරන ලද නැගෙනහිර ඉන්දියන් සාගරය පිළිබඳ ශ්‍රේණිගත වාර්තාව අනුව මතුපිට මැටි පිළිබඳව ප්‍රාදේශීය භූ රසායන විද්‍යාව. |
| බී.ජයවර්ධන | - මුහුදු පරිසරයෙන් ඛනිජ ද්‍රව්‍ය<br>(1988, IOMAC වෙළුම 2-වාර්තා ආශ්‍රිත) |

58 .....

වාර්තා - ආර්.වී.සමුද්‍රමාරු යාත්‍රාව - චාරිකා එස්.එම්.14 -18 වාර්තාව

මුහුදු අපවිත්‍ර පිළිබඳව උපදේශක බිල් ලින්ඩන් මහතාගේ පැමිණීම පිළිබඳ වාර්තාව.

ශ්‍රී ලංකා ධීවර පුහුණු ආයතනයේ කම්හල සහ ඉංජිනේරු සහයෝග පහසුකම් පිළිබඳ වාර්තාව.

නාරා ආයතනයේ ඈත මුහුදේ කටයුතු සඳහා යොදවා ඇති කොරියානු සංයුක්ත යාත්‍රාව පිළිබඳ යෝග්‍යතා වාර්තාව.

එක්සත් ජනපදයේ ජාතික විද්‍යා පදනමේ ( NSF ) ඔස්මන්ඩ් ෂිති ෂින් මහතාගේ පැමිණීම පිළිබඳ වාර්තාව.

විෂය නිර්දේශ විස්තර සහිතව සංවිධාන කළයුතු පුහුණු පාඨමාලා ද සමග ශ්‍රී ලංකා ධීවර පුහුණු මධ්‍යස්ථානය නාරා ආයතනය සමග ඒකාබද්ධ කිරීම පිළිබඳ වාර්තාව.

යූඑන්ඩීපී ( UNDP ) අදියර II ව්‍යාපෘති යෝජනා - මුහුදු විද්‍යාවට සම්බන්ධ සියලුම අංශයන්.
( කෘතියෙන් 2/3 කටත් වැඩි)

සරෙක්( SAREC ) ආයතනය සඳහා මුදල් යෙදවීම පිළිබඳ යෝජනාව - මුහුදු විද්‍යාවට සම්බන්ධ සියලුම අංශ.

පුරානවැල්ල ධීවර වරාය දිය කඩනය පිළිබඳ ප්‍රාථමික පරීක්ෂණ වාර්තාව.

පුරානවැල්ල දියකඩනය හැනීමේ තත්ත්ව වාර්තාව සහ ඒ සඳහා යොදාගනු ලැබූ ද්‍රව්‍ය පිළිබඳ වාර්තාව.

මධ්‍යම ඉන්දියානු සාගරය සඳහාවූ පළමු ප්‍රාරම්භක IOC ප්‍රාදේශීය කමිටු රැස්වීමට ඉදිරිපත් කළ මධ්‍යම ඉන්දියන් සාගරයේ මහාද්වීපික මංචක පිළිබඳ ගෑ විද්‍යාත්මක සමීක්ෂණය සඳහා වූ ශ්‍රී ලංකා ව්‍යාපෘති යෝජනාව.

මධ්‍යම ඉන්දියන් සාගරය සඳහා වූ පළමු ප්‍රාරම්භක IOC ප්‍රාදේශීය කමිටු රැස්වීමට ඉදිරිපත් කළ **ප්‍රදේශයක්** වශයෙන් මධ්‍යම ඉන්දියානු සාගරයේ වෙරළබඩ ජලයේ ගති විද්‍යා අධ්‍යයනය සඳහා වූ ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති යෝජනාව.

ශ්‍රී ලංකාවේ බටහිර වෙරළබඩ මහාද්වීපික මංචක මඩිවල නොගැඹුරු දියේ කාබනේට් කොටස් හා කොටස් ආකෘති අධ්‍යයනය පිළිබඳ නරේසා ( NERESA ) ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව.
I වන කොටස.
- එම - ප්‍රගති වාර්තාවෙහි II වන කොටස.

අලුත් පර්යේෂණ යාත්‍රාව ලබා ගැනීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය 1988 ජූනි මාසයේ දී ඉදිරිපත් කරන ලදී.

එක්සත් ජාතීන්ගේ පරිභ්‍රමණ අරමුදල මගින් මොනසයිට් ( Monazite තැන්පතු පිළිබඳ ගවේශණයේ විසිතර සහිත අමාත්‍ය මණ්ඩල සංදේශය 1988 නොවැම්බර් මස ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ බටහිර වෙරළබඩ ප්‍රධාන ගංගාවල මෝඩි පිළිබඳ අයවැය ව්‍යාපෘති යෝජනාව 1988 ඔක්තෝබර් මස දී ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ වෙරළබඩ තැන්තයන්හි ක්වෝටනරි භූ විද්‍යා අධ්‍යයන ව්‍යාපෘති යෝජනාව නෙදර්ලන්තයේ භූ විද්‍යා ආයතනය වෙත 1988 ඔක්තෝබර් මස දී ඉදිරිපත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලවලට මුහුදු භූ විද්‍යාව හඳුනා දීමට අදාල ව්‍යාපෘති යෝජනාව 1988 ඔක්තෝබර් මාසයේ දී ආධාර ලබා ගැනීම සඳහා නෙදර්ලන්තය වෙත ඉදිරිපත් කරන ලදී.

මුතුරාජවෙල පිරවීමේ වැඩපිළිවෙලෙහි ශක්‍යතා අධ්‍යයනය වාර්තාව පිළිබඳ අවධි තක්සේරු වාර්තාව ඕලන්ද සමාගමක් මගින් 1988 දෙසැම්බර් මස දී ඉදිරිපත් කරන ලදී.

දේශන පැවැත්වීම, විද්‍යාගාර වැඩ පුහුණුව, ආර්වී. සමුද්‍රමාරු යාත්‍රාවේ පුහුණුව, ආදිය ඇතුළත් වෙරළෙන් ඔබ්බෙහි ලබා ගත හැකි ඛනිජ සම්පත් පිළිබඳව 1989 ජනවාරි මාසයේ දී පැවැත්වීමට නියමිත පුහුණු වැඩ මුළුවක් පිළිබඳ ව්‍යාපෘති යෝජනාව.

ඉදිරිපත් කළ/හැදෑරූ පත්‍රිකා :
====================

ඩබ්. එස්. වික්‍රමරත්න - " ශ්‍රී ලංකාවේ මුහුදු විද්‍යාව අතීතය, වර්තමානය සහ අනාගතය" මැයෙන් 1988 ජනවාරි මස ශ්‍රී ලංකා භූ විද්‍යාත්මක සංගමයේ දී වාර්ෂික සැසි වාරයේ දී පැවැත්වූ ආරම්භක මූලාසන දේශනය.

ඩබ්. එස්. වික්‍රමරත්න - ශ්‍රී ලංකාවේ බටහිර මහාද්වීපික තීරයේ පතුලේ මෝඩිවල ඛනිජ විද්‍යාත්මක හා භූ රසායනික තත්ත්වය පිළිබඳ රසායන විද්‍යා ආයතනයේ වාර්ෂික සැසි වාරයේ දී ඉදිරිපත් කළ දේශනයේ පත්‍රිකාව.

ඩබ්. එස්. වික්‍රමරත්න - වෙරළෙන් ඔබ්බෙහි මෝඩිවල හැසිරීම් මැයෙන් මූලික අධ්‍යයන ආයතනයේ දී තාපාලෝක කිරීම ( Thermo Luminiscence )යොදා ගැනීම පිළිබඳව පැවැත්වූ සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කළ පත්‍රිකාව.

60.....

ඩබ්.එස්.කරුණාරත්න - ශ්‍රී ලංකාවේ වෙරළෙන් ඔබ්බෙහි බලා පොරොත්තුවිය හැකි ඛනිජ සම්පත්.
පකිස්තානයේ කරච්චි නුවර ඉන්දියන් සාගරයේ බලා- පොරොත්තු විය හැකි ඛනිජ සම්පත් යන මැයෙන් විශේෂඥයන්ගේ පළමු රැස්වීමේ දී පැවැත් වූ දේශනය පිළිබඳ පත්‍රිකාවකි.

ඩබ්.එස්.කරුණාරත්න - සමුද්‍ර විද්‍යා පර්යේෂණවල දී මෑතක දී ඇතිවූණ දියුණුව.

ශ්‍රී ලංකාවේ රත්න විද්‍යාත්මක සංගමයේ වාර්ෂික සභාග ප්‍රධානෝත්සවයේ දී ආරාධිත දේශකයෙකු වශයෙන් කළ දේශනය ඇතුළත් පත්‍රිකාවකි.

ඩී.ජයවර්ධන - මුහුදු පරිසරයෙන් ඛනිජ වස්තු -

පකිස්තානයේ කරච්චි නුවර පැවැති ඉන්දියානු සාගරයේ ඇත වෙරළෙන් බලාපොරොත්තුවිය හැකි ඛනිජ සම්පත් මැයෙන් විශේෂඥයන්ගේ පළමු රැස්වීමේ- දී කළ දේශනය පිළිබඳ පත්‍රිකාවකි.

ඩබ්.ඇස්.වික්‍රමරත්න - මලයාසියාවේ ක්වාලාලම්පූර් නුවර සම්පත් කළමනාකරණය පිළිබඳ IOMAC/IOI පුහුණු පිඨමාලාවට සහභාගි වූ අයට ආරාධිත දේශකයකු වශයෙන් " සාගරවල ඛනිජ සම්පත් ගොඩබිමට සීමාවූ ඛනිජ සම්පත්වල භූ විද්‍යාව" යන විෂයය යටතේ කළ දේශනය පිළිබඳ පත්‍රිකාවකි.

ඩබ්.ඇස්.වික්‍රමරත්න -මලයාසියාවේ ක්වාලාලම්පූර් නුවර පැවැති සම්පත් කළමනාකරණය පිළිබඳ IOMAC/IOI පුහුණු පාඨමාලාවට සහභාගි වූ අයට ආරාධිත දේශකයෙකු වශයෙන් සහභාගි වෙමින් "ඉන්දියන් සාගරයේ ඛනිජ මතල් භූ විද්‍යාව" යන මැයෙන් කළ දේශන යෙහි කරුණු ඇතුළත් පත්‍රිකාවකි.

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 44 වැනි වාර්ෂික සැසි වාරයේ දී පත්‍රිකා පහක් කියවන්නට යෙදිණ.
ඉහත කියවූ පත්‍රිකාවල ඒ ඒ කාණ්ඩවල පත්‍රිකා නම් සඳහන් කොට ඇත.

61 .....

6.0 ජාතික ජලමාන කාර්යාලය.

පත්‍රිකා.

ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 1988 44 වැනි/වාර්ෂික සැසි වාරයේ දී " සමීක්ෂණ විද්‍යාවන් පිළිබඳ උපාධි පාඨමාලාව" නම් වූ පත්‍රිකාව ඇන්.ඇස්.විජේසිංහ මහතා විසින් කියවන්නට යෙදුනි.

7.0 පාරිසරික අධ්‍යයන ඒකකය.

දසනායක, ඇන්.එච්.ද අල්විස්, පද්මිණී සහ රවී පෙරේරා.

1988 -

නුවර එළියේ පාරිසරික සමීක්ෂණයේ මූලික ප්‍රතිඵල ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 44 වැනි වාර්ෂික සැසි වාරයේ දී ඉදිරිපත් කරන ලදී.

දසනායක, ඇන්.එච්.ද අල්විස්, පද්මිණී සහ රවී පෙරේරා.

1988 -

හෝර්ටන් තැන්නේ බෙලිහුල් ඔයේ ජල තත්ත්වය පිළිබඳ සමීක්ෂණ ප්‍රතිඵල ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ 44 වැනි වාර්ෂික සැසි වාරයේ දී ඉදිරිපත් කරන ලදී.

ඒ.රාජසූරිය, ඩී.පී.ද අල්විස්. - 1988

ශ්‍රී ලංකාවේ වෙරළබඩ හා මුහුදු සම්පත් - ඒවා ගවේෂණය කිරීම, ලබා ගැනීම, හා සුරැකීම පිළිබඳ හදිසි ප්‍රශ්ණ හා ගැටළු යන මැයෙන් වූ පත්‍රිකාව - 1988 මලයාසියාවේ පැවැති, IOMAC/IOI පුහුණු පාඨමාලාවට ඉදිරිපත් කරන ලද්දකි.

8.0 පරිසර පද්ධති අධ්‍යයන අංශය.

ආචාර්ය පී.ද අල්විස්, ඇස්.සී.ජයමාන්න මිය සහ අශෝකා පෙරේරා

1988 -

සිංහල මාධ්‍යයෙන් පිළියෙල කළ කිවුල්දිය ඉස්සන් වගාව පිළිබඳ අත් පොතක් සකස් කිරීම.

ආචාර්ය පී.ද අල්විස්, ඒ.රාජසූරිය, ජී.වීරක්කොඩි සහ ලක්ෂ්මන් ගිහිගේ.

කොරල් පිළිබඳ අත්පොතක් සම්පාදනය කිරීම.

( දැන් අවසාන කෙටුම්පත ද සකසා ඇත.)

62 .....

පී.වීරක්කොඩි -

කොරල්පර පිළිබඳ කුඩා පොතක් සැලසුම් කොට ඇත.

ඒ.රාජසූරිය,ආචාර්ය පී.ද අල්විස් -

මිරිදිය කොරල් හඳුනා ගැනීම් පිළිබඳ අත්පොතක් සකස් කිරීම.

ආචාර්ය පී.ද අල්විස්,යූ.ඇස්.කස්තුරි ආරච්චි,ඒ.රාජසූරිය සහ පී.වීරක්කොඩි.

මීගමු හා හලාවත කලපුවල මසුන් ජනගහනය යත් පුපුරුවා හැරීමෙන් විනාශ කිරීම පිළිබඳ වාර්තාව.

ආචාර්ය පී.ද අල්විස්, ඒ.රාජසූරිය,පී.වීරක්කොඩි ,ඇල්.ගිනිගේ සහ ඒ.සී.මිදෙණිය.

උඩවලවුන බහුවිධ භාවිතයට සුදුසු මුහුදු සංචිතයක් සඳහා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම.

ඒ.රාජසූරිය -

උඩරට දිය ඇලි වලට ක්‍රීඩා කටයුතු පිණිස ට්‍රවුට්(Trout ) මසුන් නැවත හඳුන්වා දීමට හා ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා සමීක්ෂණයක්.

ආචාර්ය පී.ද අල්විස්, ජේ.ඒ.ද සිල්වා,ටී.බී.වත්තිනායක.

කලවම් මසුන් වගා කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට සමීක්ෂණයක්.

ආචාර්ය පී.ද අල්විස්-

සරෙක්( Sarec ) ව්‍යාපෘති යෝජනාව සම්පාදනය කිරීම.

ආචාර්ය පී.ද අල්විස් -

ශ්‍රී ලංකාවේ කාල් බ්‍රූයිබර්ග් සංගමය විසින් '' පරිසර විද්‍යාව හා මිනිසා '' යන මැයෙන් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයේ දී පැවැත් වූ දේශණය.

9.0 ජාතික මුහුදු ක්ෂීරපායී සත්ත්වයන් පිළිබඳ වැඩසටහන.

කාන්ති සුබසිංහ මෙනෙවිය -

"විදුරාව" නම් සිංහල විද්‍යා පත්‍රිකාවට සැපයූ "සඳාකලයම තල්මසුන් '' නම් මුහුදු ක්ෂීරපායී සතුන් පිළිබඳ ලිපිය (මැයි මස 16 දින මුද්‍රණය) ලිපිය සමග ඡායා රූප දෙකක් ද සහිතය.

1988 මැයි මස 18 වැනි බදාදා "ඇයිලන්ඩ්" පුවත් පතට සැපයූ ලිපිය.

1988 මැයි මස 21 වැනි සෙනසුරාදා "වසන්ත සඳැල්ල" නම් ගුවන් විදුලි වැඩ සටහන මගින් පැවැත් වූ සාකච්ඡාව.

10.0 ප්‍රවෘත්ති අංශය.

පත්‍රිකා.

ඇල්.බණ්ඩාරනායක මිය -

1988 ඔක්තෝබර් 5-7 දක්වා මදුරාසියේ පැවැති ධීවර තොරතුරු පිළිබඳ BOBP ප්‍රාදේශීය හමුවේ දී ඉදිරිපත් කළ "ශ්‍රී ලංකාවේ ධීවර තොරතුරුවල වර්තමාන තත්ත්වය - රටෙහි තත්ත්ව වාර්තාව " නම් පත්‍රිකාව.

ඇල්.බණ්ඩාරනායක මිය. -

ප්‍රවෘත්ති තාක්ෂණය පිළිබඳව 1988 සැප්තැම්බර් 9 වැනි දින කොළඹ ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පැවැති සම්මන්ත්‍රණයේ දී "සීඩී - ආර්.ඕ.ඇම්.( CD - ROM ) තාක්ෂණයට පුස්තකාල යෙදුම් "

ඇම්.බෙරෙන්පර් මිය. -

"සංවර්ධනය වන ලෝකයට මුහුදු තාක්ෂණය මාරු කිරීම" යන මැයෙන් 1988 අගෝස්තු 22 - 26 දක්වා පැවැති Pacom in Maribus සම්මන්ත්‍රණයට ඉදිරිපත් කළ පත්‍රිකාව.

ඇල්.බණ්ඩාරනායක මිය -

1988 දෙසැම්බර් මස ඉන්දියන් සාගර ප්‍රවෘත්ති(IO) වෙළුම 2 සඳහා සැපයූ "සහයෝගිතාවය හා දත්ත විනිමය " නම් ලිපිය.

ඇම්.බෙරෙන්පර් මිය -

1988 දෙසැම්බර් මස ඉන්දියානු සාගර පුවත්(IO ) සඟරාව වෙළුම 2 සඳහා සැපයූ " මධ්‍යම ඉන්දියානු සාගරයේ ඉන්දියාවේ ගැඹුරු දියේ හාරන ස්ථානය" නම් ලිපිය.

සැපයූ වෙනත් සේවාවන්.

ඇල්.බණ්ඩාරනායක මිය - පහත සඳහන් වාර්තාව නියෝජිතායතනය සඳහා ඉදිරිපත් කළාය.

" ශ්‍රී ලංකාවේ මිනිස් සම්පත් දියුණුවට සැලසුම් හා වැඩ සටහන් "

ඇල්.බණ්ඩාරනායක මිය -

"ඉන්දියානු සාගර පුවත්" නම් සඟරාවට පුවත් ලිපිය සඳහා උපදේශක කර්තෘ වරියක් ලෙස සේවය කළාය.

64 ......

ඇල්. බණ්ඩාරනායක මිය –

1988 නොවැම්බර් 21 – 23 දින දක්වා පැවැති 3 වැනි ස්ථාවර කමිටු රැස්වීම සඳහා "ඉන්දියානු සාගරයේ මුහුදු කටයුතු සහ ජලජ සම්පත් තොරතුරු පද්ධතිය" යටතේ ( IOMAC – 1/SC–3/6 දරන ලිපිය IOMAC මහලේකම් කාර්යාලය ට සම්පාදනය කළාය.

මගින් පැවැත් වූ පහත සඳහන් රැස්වීම් සඳහා අවශ්‍ය වූ සියලුම ලියවිලි අවශ්‍යතාවයන් මුද්‍රණය කිරීමත් සැලසුම් කිරීමත් MAARIS සේවක පිරිස විසින් පිළියෙල කරන ලදී.

(අ) 1988 ජූලි 11 – 14 දින දක්වා පාකිස්ථානයේ කරච්චි නුවර පැවැති ඉන්දියානු සාගරයේ වෙරළෙන් ඈත ලබාගත හැකි ඛනිජ සම්පත් පිළිබඳ IOMAC තාක්ෂණික කණ්ඩායමේ පළමු රැස්වීම.

(ආ) 1988 නොවැම්බර් මස 22 –24 කොළඹ පැවැති IOMAC ස්ථාවර කමිටුවේ පැවැති රැස්වීම.

– 0 –

මගේ අංකය: එල්සී/එෆ්/නාරා/80

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1990 අප්‍රේල් 10 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා -
සංවර්ධන නියෝජිතායතනය.

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ 1988 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු මාගේ නිරීක්ෂණයන් අඩංගු වාර්තාව මේ සමඟ එවා ඇත.

විගණකාධිපති

පිටපත්:-

1. ලේකම්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය.
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය.

මගේ අංකය: එල්සී/එෆ්/තාරා 88

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1990 අප්‍රේල් 10 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 1988 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 1988 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංග්‍රහයේ 154(1) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර සවිස්තර වාර්තාවක් 1989 නොවැම්බර් 17 දින සභාපති වරයා වෙත නිකුත් කරන ලදී.

1:2 විගණන විෂය පථය

මෙම වාර්තාවේ අඩංගු විගණන මතයට අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙ පිළිබඳ ප්‍රමාණවත් නියැදි පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිලියෙල කරන ලද්දකි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 2. ගිණුම්

### 2:4 විගණන මතය

මෙම වාර්තාවේ දැක්වෙන අදහස් දැක්වීම් හේතුකොට ගෙන ඉදිරිපත් කර ඇති ගිණුම් පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය. මේ පිළිබඳ ප්‍රධාන නිරීක්ෂණයන් පහත සඳහන් කෙරේ.

| ඌණතාවයන් | මෙම වාර්තාවේ ඇතුලත් ඡේදකයන්ට යොමුව. |
|---|---|
| (I) ගිණුම් ව්‍යතිපත්ති | 2:5:1 |
| (II) ගිණුම් වලින් අත්හැරීම් | 2:5:2 |
| (III) වර්ග කිරීමේ දෝෂ | 2:5:3 |
| (IV) අනුචිත හෙළි කිරීම් | 2:5:4 |
| (V) විගණනය සඳහා සාක්ෂි | 2:5:5 |
| (VI) නතිරීති රෙගුලාසි සහ කළමණාකරන තීරණයන්ට අනුකූල නොවීම් | 2:5:6 |
| (VII) මුදල් හිමිකම් | 2:5:7 |
| (VIII) සෙමින් වැයවුණු නිස්ක්‍රිය සහ ඌන උපයෝජිත වත්කම් සහ ශ්‍රමය | 2:5:8 |

## 2:2 මූල්‍ය ප්‍රතිඵල

ගිණුම් වලට අනුව, 1988 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නියෝජිතායතනයේ වැඩ කටයුතු වල ප්‍රතිඵලය රු.63,35,457 ක ආදායම ඉක්මවූ වියදම් අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ඌණතාවය රු.38,58,065 ක් විය. සමාලෝචිත වර්ෂ සහ ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත සඳහන් ප්‍රකාශයෙන් දැක් වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 1988 | | 1987 | |
| **ආදායම** | | | | |
| රජයේ දායකය | 1,11,80,000 | | 1,00,00,000 | |
| විවිධ ආදායම් | 1,42,435 | 1,13,22,435 | 77 446 | 1,00,77,446 |
| **අඩුකලා:** | | | | |
| පුනරාවර්තන වියදම් | | 1,76,57,892 | | 1,39,35,511 |
| ආදායම ඉක්මවූ වියදම | | ( 63,35,457) | | ( 38,58,065) |
| පෙර වර්ෂයේ ගැලපීම් | | ( 37,962) | | ( 83,26,598) |
| | | ( 63,73,419) | | (1,21,84,663) |
| ඉදිරියට ගෙනා ආදායම් සහ වියදම් ගිණුමේ ශේෂය | | (1,41,74,801) | | ( 19,90,138) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය- වියදම් ගිණුමේ ශේෂය | | (2,05,48,220) | | (1,41,74,801) |

## 2:3 මූල්‍ය ව්‍යුහය

1988 දෙසැම්බර් 31 දිනට නියෝජිතායතනයේ මූල්‍ය ව්‍යුහය 1987 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය සමඟ සසඳා පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | රු. | රු. |
| **සම්පත්** | | |
| රජයේ ආයකය | 3,07,70,080 | 2,72,70,080 |
| විදේශාධාර | 1,10,86,698 | 85,62,561 |
| වෙනත් ආයක මුදල් | 3,50,000 | 3,17,114 |
| | 4,22,06,778 | 3,61,49,755 |
| ආදායම් සහ වියදම් ගිණුමේ ශේෂය | (2,05,48,220) | (1,41,74,801) |
| | 2,16,58,558 | 2,19,7[illegible],954 |
| **උපයෝජනය** | | |
| ලියා අඩුකල වටිනාකමට ස්ථාවර වත්කම් | 2,18,70,394 | 2,11,50,698 |
| ශුද්ධ ජංගම වත්කම් | ( 2,11,836) | 8,24,256 |
| | 2,16,58,558 | 2,19,74,954 |

## 2:4 අරමුදල් ප්‍රභවය සහ යෙදවීම

සමාලෝචිත වර්ෂය තුළ නියෝජිතායතයේ අරමුදල් ප්‍රභවය සහ යෙදවීම් පහත සඳහන් ප්‍රකාශයෙන් දැක් වේ.

### අරමුදල් ප්‍රභවය

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ආයකය | 35,00,000 | |
| විදේශාධාර | 25,24,137 | |
| වෙනත් ආයක මුදල් | 32,886 | 60,57,023 |

### අරමුදල් යෙදවීම

| | | | |
|---|---|---|---|
| ඌනතාවය | 63,35,457 | | |
| එකතු: පෙර වර්ෂයේ ගැලපීම් | 37,962 | | |
| | 63,73,419 | | |
| අඩුකලා: අරමුදල් චලනය නොවන විෂයයන් සඳහා ගැලපීම | | | |
| වර්ෂය සඳහා ක්ෂය | 25,59,500 | 38,13,919 | |
| ස්ථාවර වත්කම් වලට එකතු කිරීම් | | 32,79,196 | 70,93,115 |
| පහත විග්‍රහකර ඇති පරිදි කාරක ප්‍රාග්ධනයේ අඩුවීම | | | (10,36,092) |

| | කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම | | |
|---|---|---|---|
| | වැඩිවීම | අඩුවීම | |
| තොග | 4,84,947 | - | |
| ණය ගැතියන් | 3,17,724 | - | |
| ලැබිය යුතු තැන්පත් | 62,500 | - | |
| අත්තිකාරම් | 6,02,113 | - | |
| සේවකයන්ගෙන් ලැබිය යුතු ණය | 1,04,938 | - | |
| මුදල් සහ බැංකු ශේෂය | - | 18, ,766 | |
| ණය හිමියන් සහ උපචිත වියදම් | - | 3,99,369 | |
| ගෙවිය යුතු තැන්පතු | - | 3,90,179 | |
| | 15,72,222 | 26,08,314 | (10,36,092) |

## 2:5 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්

### 2:5:1 ගිණුම් ප්‍රතිපත්ති

නියෝජිතායතනය විසින් එහි ගිණුම් ප්‍රතිපත්ති වාර්ෂික මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි.

### 2:5:2 ගිණුම් වලින් අත්හැරීම්

(අ) 1985 වර්ෂයේ දී ධීවර අමාත්‍යාංශය විසින් නියෝජිතායතනයට භාර දෙන ලද පර්යේෂණ කටයුතු සඳහා යොදා ගන්නා ලද "සමුද්‍ර මාරු" නෞකාවේ වටිනාකම ගිණුම් ගත කර නොමැත.

(ආ) කලින් ධීවර අමාත්‍යාංශය සතුව තිබූ දැනට නියෝජිතායතනය භාරයේ ඇති වංචල හා නිශ්චල දේපල 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතා--යතන පනතේ 35 වගන්තිය ප්‍රකාරව නියෝජිතායතනය වෙත පවරාගෙන අගය කොට ගිණුම් වල දක්වා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ශ්‍රී ලංකා ධීවර අභ්‍යාස ආයතනයේ විදුලි බිල්පත් වෙනුවෙන් නියෝජිතායතනය විසින් ගෙවා තිබූ රු.1,20,680 ට අදාලව ගිණුම් වල ගැලපීම් කර නොතිබුණි.

(ඈ) 1988 දෙසැම්බර් 31 දිනට නියෝජිතායතනය සතුව ඇති මසුන් තොගය ගණනය කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඉ) 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත ප්‍රකාරව උපචිත බැරකම් ගිණුම් ගතකර නොතිබුණි.

2:5:3 වර්ග කිරීමේ දෝෂ

(අ) 1987 වර්ෂයට අදාල රු.5,743 ක් වූ වියදම, අනුචිත ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් සහ වියදම් ගිණුමට අයකර තිබුණි.

(ආ) ආහාර ද්‍රව්‍ය, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, නඩත්තුව ආදී වියදම සහ ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් දරන ලද රු.1,28,365 ක අමතර වියදමක් ප්‍රාග්ධන ගතකර තිබුණි.

(

2:5:4 අනුචිත හෙළි කිරීම්

(අ) ප්‍රධාන පොකුණේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් වැය කර තිබූ රු.3,425 ක මුදලක් ප්‍රධාන පොකුණ යටතේ ගිණුම් ගත කිරීම වෙනුවට ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි.

(ආ) යෞවන කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් මිලදී ගත් මසුන් සඳහා දරන ලද රු.19,980 ක වියදමක් එම අමාත්‍යාංශයෙන් අය නොකොට ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි.

(ඇ) කල්පිටිය පර්යේෂණ මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ඉදිකිරීමේ ආරක්ෂිත තැන්පත් වශයෙන් ලබාගෙන තිබූ රු.8,766 ක මුදලක් ආපසු ගෙවීමේ දී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් වශයෙන් නොසලකා ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි.

2:5:5 විගණනය සඳහා සාක්ෂි

ස්ථාවර වත්කම් ලේඛනය, සත්‍යාපන වාර්තා සහ වත්කම් හා බැරකම් සනාථ කිරීමේ ලිපි නොමැතිවීම නිසා රු.3,84,97,003 ක් වටිනා ස්ථාවර වත්කම්, ජංගම වත්කම් හා වගකීම් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

2:5:6 **නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

(අ) 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනතේ 13 සහ 17 වගන්ති මගින් නියම කරන ලද පරිදි ජාතික ජලජ සම්පත් කළමනාකාරණ සභාව සහ විද්‍යා සහ තාක්ෂණික කමිටුව ඒත්කර නොතිබුණි.

(ආ) 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර, 1988 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් 1989 අප්‍රේල් 30 දිනට හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද ඉදිරිපත් කරන ලද්දේ 1989 ජූනි 12 දිනදී ය.

(ඇ) ජාතික ජලජ සම්පත් නියෝජිතායතනයේ කාර්ය සංවිධාන සංග්‍රහයට අනුව නොගෙවූ වැටුප් දින 4 ක් ඇතුලත බැංකු ගත කළ යුතු. වුවද මුදල් අයකැමි විසින් එම මුදල් දින 10 කට වැඩි ප්‍රමාණයක් ආයතනය තුල රඳවාගෙන තිබුණි.

(ඈ) අංක 264 හා 1984.08.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ ලිපියේ 9 ඡේදයේ දැක්වෙන අයුරු වාහන පාලනය පිළිබඳ ක්‍රියා පරිපාටියක් සකස් කර නොමැත.

(ඉ) ආයතනය සතු වාහන රාත්‍රී කාලයේ ආයතනය තුල ගාල්කර තැබිය යුතු වුවද, ආයතනයේ නිලධාරීන් පරිහරණය කරන වාහන එම නිලධාරීන්ගේ නිවෙස් වලට රාත්‍රී කාලයේ රඳවා ගන්නා බව අනාවරණය විය.

(ඊ) කාර්ය සංවිධාන සංග්‍රහයේ 4 වැනි පරිච්ඡේදයට අනුව ආයතනයට ලැබෙන මුදල් දිනපතා බැංකු ගත කළ යුතු වුවද ආයතනය තුල සතියක් පමන රඳවාගෙන බැංකු ගත කළ අවස්ථා දක්නට තිබුණි.

2:5:7 <u>මුදල් හිමිකම්</u>

(අ) භාණ්ඩ හා සේවා සැපයීම් සඳහා සැපයුම්කරුවන් වෙත 1986 සහ 1987 යන වර්ෂ වල ලබා දී තිබූ රු.2,68,454 ක් වූ අත්තිකාරම් 1988 දෙසැම්බර් 31 දින වන විටත් බේරුම්කර නොතිබුණි.

(ආ) ආයතනයේ නිලධාරීන්ට ගෙවා ලද මාස 06 සිට වර්ෂ 4 දක්වා කල්ගත වූ රු.1,06,315 ක් වූ සුළු මුදල් අත්තිකාරම් 1988 වර්ෂය අවසන් වන තුරු නොපියවා තිබුණි.

(ඇ) 1983 සිට 1987 දක්වා කාලය තුල සේවකයින්ට දී තිබූ අත්තිකාරම් හා ණය මුදල් වලින් රු.18,363 ක්වූ මුදලක් සේවකයින් නියෝජිතායතනය හැර ගොස් ඇති නිසා අයකර ගැනීමට නොහැකිව තිබුණි.

2:5:8 <u>සෙමෙන් වැයවුණු නිශ්ක්‍රීය සහ ඌන උපයෝජිත වත්කම් හා ශ්‍රමය</u>

රු.25,000 ක් වටිනා මාළු බෝ කිරීමේ ටැංකි වර්ෂ හතරක සිට නිශ්ක්‍රීයව තිබුණි.

3. <u>මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය</u>

3:1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

සමාලෝචිත වර්ෂය සඳහා වූ මෙහෙයුම් ඌනතාවය වන රු.63,35,457 ඊට අනුරූප ඉකුත් වර්ෂය සඳහා වූ ඌනතාවය වූ රු.38,58,065 සමඟ සසඳන කළ මෙහෙයුම් ප්‍රතිඵල රු.24,77,392 කින් පිරිහී ඇති බව පෙනී යයි.

3:2 <u>ප්‍රවාහන ඇණිය</u>

සමාලෝචිත වර්ෂය තුල වාහන 25 කින් යුත් ඇණියක් නියෝජිතායතන සතුව තිබූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ වෙනත් ආයතන වලින් ඉල්ලා ගනු ලැබූ වාහන 2 ක් ඇතුළුව වාහන 25 ක තිබුණි. සමාලෝචිත වර්ෂය තුල මෙම ඇණියේ ධාවන, නඩත්තු යනාදියේ පිරිවැය රු.15,94,175 ක්වූ අතර, ඉකුත් වර්ෂයේ අනුරූප වියදම රු.9,67,213 ක් විය. මෙම වාහන පාවිච්චි කිරීමට අදාල ඇතැයි සැලකිය යුතු සංඛ්‍යා ලේඛණ පහත දැක්වේ.

ධාවනය කරන ලද කිලෝ මීටර් ගණන : 370812

පාරිභෝජනය කරන ලද ඉන්ධන ලීටර් ගණන: 56804

ලීටරයකට සමත්ථ සමාන්‍ය කාර්ය සාධනය කිලෝ මීටර් 6.52

ඉන්ධන වෙනුවෙන් දරණ ලද මුළු වියදම: රු.6,10,351

කිලෝ මීටරයකට ඉන්ධන වෙනුවෙන් වූ සාමාන්‍ය වියදම රු.1.64

අළුත්වැඩියා වෙනුවෙන් දරණ ලද මුළු වියදම: රු.9,83,825

කිලෝ මීටරයකට අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද සාමාන්‍ය වියදම: රු.2.65

3:3 **අයවැය පාලනය:**

අයවැය ගත සහ තථ්‍ය ප්‍රමාණයන් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය කරන ලද හෙයින්, අයවැය ලේඛණය පාලන කාරකයක් වශයෙන් ඵලදායි ලෙස යොදා ගෙන තිබූ බව නොපෙනේ.

4. **පද්ධති සහ පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු මාගේ විස්තරාත්මක වාර්තාව මගින් නියෝජිතායතනයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්‍ෂෙත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) මුදල්.
(ආ) සුළු මුදල් ඊගැවීම් සහ කාර්ය මණ්ඩලයට අත්තිකාරම්.
(ඇ) මිළට ගැනීම්
(ඈ) ස්ථාවර වත්කම් පිළිබඳ පාලනය.
(ඉ) අයවැය පාලනය
(ඊ) පොත් තැබීම.

විගණකාධිපති.